# 9. වෙළඳම, ගෙවුම් තුලනය සහ සංචාරක ව්‍යාපාරය

## 9.1 සමස්ත විවරණය

1997 වසර මැද හට ගත් ආසියානු මූල්‍ය වෙළඳපොළ අර්බුදයත් සමග ඇරඹුණු ලෝක ආර්ථික අවපාතයේ අයහපත්ම තත්ත්වයන් 1999 වසරේ මැද භාගය වනවිට සමනය වන ලකුණු දක්නට ලැබුණද ජාත්‍යන්තර වෙළඳමේ වර්ධනය තවදුරටත් පීඩනයට ලක් වෙමින් පැවතුණි. අර්බුදයන් පැවති බොහෝ ආර්ථිකයන්හි විනිමය වෙළඳපලවල් ක්‍රමයෙන් යථා තත්වයට පත්විය. 1999 වසරේ මැද පටන් ආයෝජන විශ්වාසනීයත්වයද ක්‍රමයෙන් ගොඩ නැගෙමින් පැවතුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස නැගී එමින් පැවති වෙළඳපළවල් වලින් විශේෂයෙන්ම ආසියානු කලාපයෙන් පසුගිය වසර දෙක තුළ මහා පරිමාණයෙන් පිටතට ගලා ගිය විදේශීය පෞද්ගලික ප්‍රාග්ධනය එම වෙළඳපලවල් වල බැඳුම්කර නිකුතුවල අවදනම් ආන්තිකයන්හි කැපී පෙනෙන පහත වැටීමක් සහිතව 1999 වසරේ මැද සිට ක්‍රමයෙන් යලි ආපසු ගලා ඒමක් දක්නට ලැබුණි. මේ අතර, නැගෙනහිර ආසියානු ආර්ථිකයන්ගෙන් වූ ඉල්ලුම වැඩි වීමත්, ඛනිජ තෙල් අපනයනය කරන රටවල සංවිධානයේ නිෂ්පාදිතයන් කපා හැරීමේ තීරණයත් නිසා ඉහළ නැගෙමින් පැවතුණු ඛනිජ තෙල් මිල හැරුණුකොට අනිකුත් වෙළඳ ද්‍රව්‍ය මිල ගණන් තවදුරටත් පහත වැටුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වසරේ බොහෝ කලක් තුළ ජාත්‍යන්තර වෙළඳම පහළ මට්ටමක පැවතුණි.

පීඩනයට ලක්ව පැවතුණු ජාත්‍යන්තර ඉල්ලුමේ පසුකාලීන ප්‍රතිවිපාක සහ ඒ අනුව පහත වැටුණු වෙළඳ ද්‍රව්‍ය මිළ ගණන්වල බලපෑමත් ශ්‍රී ලංකාවේ බාහිර අංශයේ 1999 වසර තුළ දක්නට ලැබුණු ප්‍රවනතාවන් වේ. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර වෙළඳම සහ ගෙවුම් තුලනය වසර තුළ යම් ආකාරයක පසුබෑමකට ලක් විය. වසර තුළ ශ්‍රී ලංකා ගුවන් සේවය ගුවන්යානා තුනක් ආනයනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වෙළඳ හිඟය පුළුල් විය. සංචාරක අංශය වේගයෙන් යථා තත්වයට පත් වුවද, සේවා ගිණුමේ දක්නට ලැබණේ ඉතා සුළු දියුණුවකි. 1999 වසරේ බොහෝ කලක් තුළ ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළවල්වල පොලී අනුපාතිකයන්හි පහළ යාම පිළිබිඹු කරමින් විශාල වශයෙන් පහත වැටුණු පොලී ආදයම් හේතුකොටගෙන ආදයම් ගිණුමේ හිඟය තවදුරටත් පුළුල් විය. 1999 වසර තුළ ප්‍රධාන වශයෙන් ශුද්ධ නිල සංක්‍රාම පහළ වැටීමේ බලපෑම කපා හරිමින් ශුද්ධ පෞද්ගලික සංක්‍රාම ඉහළ යාම හේතුකොටගෙන ශුද්ධ ජංගම සංක්‍රාම සියයට 1 කින් ඉතා සුළු වශයෙන් වැඩි විය. මේ අනුව ජංගම ගිණුමේ හිඟය 1998 වසරේ වූ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 226 සිට 1999 වසරේදී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 495 දක්වා පුළුල් විය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ජංගම ගිණුමේ හිඟය 1998 වසරේ වූ සියයට 1.4 සිට 1999 දී සියයට 3.1 ක් දක්වා ඉහළ නැගුණි. පෞද්ගලික අංශය වෙතට වූ දිගුකාලීන ශුද්ධ ප්‍රාග්ධන ගලා ඒම් වල ඉහළ නැගීමක් දක්නට තිබියදී පවා වාණිජ බැංකු විසින් විදේශයන්හි පවත්වාගෙන යනු ලැබූ වත්කම් ඉහළ යාමත්, රජයේ දිගුකාලීන ණය ගැනීම් පහළ යාමත් හේතුකොටගෙන ශුද්ධ ප්‍රාග්ධන හා මූල්‍ය ගලා ඒම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 413 සිට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 330 ක් දක්වා පහත වැටුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් සමස්ත ගෙවුම් තුලනය 1998 වසරේදී වූ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 37 ක අතිරික්තයක සිට 1999 වසරේදී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 263 ක හිඟයක් වාර්තා කළේය.

ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳම මත වූ ජාත්‍යන්තර වෙළඳ ද්‍රව්‍යවල මිල ගණන් පහළ යාමේ බලපෑම, වසරේ අවසාන භාගය වනවිට අපනයන සහ ආනයන යන දෙඅංශයෙහිම වැඩි දියුණු වීම හේතුකොටගෙන මධ්‍යස්ථ විය. වසරේ මුල් මාස අට තුළ සියයට 11 කින් පහත වැටුණු අපනයන 1999 මුළු වසර තුළම සියයට 4 ක අඩු වීමක් දක්වෙන පරිදි කැපී පෙනෙන ලෙස යලි ප්‍රකෘතිමත් විය. 1999 වසර තුළ සමස්ත අපනයන මිල ගණන් සියයට 10 කින් පහත වැටුණි. ප්‍රධාන වශයෙන්ම ඇඟළුම් අංශයේ පරිමාව ඉහළයාම හේතුකොටගෙන සමස්ත අපනයන පරිමාව සියයට 6 කින් ඉහළ නැගුණි. ජාත්‍යන්තර වෙළඳ ද්‍රව්‍ය මිල ගණන් පහළ යාම සහ ආනයන පරිමාව පහත වැටීම හේතුකොට ගෙන, මෙම දෙවනුව සඳහන් කරුණෙහි වැඩි බලපෑම හේතුවෙන්, ආනයන (ගුවන්යානා ආනයන අත් හැර සැළකූ කළ) සියයට 5 කින් පහත වැටුණි. ගුවන්යානා ආනයනද ඇතුළත්ව සැළකූ කළ 1999 වසරේදී ආනයන වර්ධනය සියයට 0.2 කි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වෙළඳ හිඟය එ. ජ. ඩොලර් දශ ලක්ෂ 1,299 ක් දක්වා සියයට 19 කින් පුළුල් විය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වෙළඳ හිඟය 1998 දී වූ සියයට 7 සිට 1999 දී සියයට 8.2 ක් දක්වා ඉහළ නැගුණි.

සංචාරක ව්‍යාපාරය වේගයෙන් යලි ප්‍රකෘතිමත් වුවද සේවා ගිණුමේ අතිරික්තය එ. ජ. ඩොලර් දශ ලක්ෂ 145 සිට එ. ජ.ඩොලර් දශලක්ෂ 147 ක් දක්වා ඉතා සුළු වශයෙන් වැඩි විය. පසුගිය වසරේ සේවා ගිණුමට පුළුල් වශයෙන් දයක වූ වරාය ආශ්‍රිත සේවාවන් අසල්වැසි රට වලින් ඇති වූ තරඟකාරිත්වය නිසා බොහෝදුරට නොවෙනස්ව පැවතුණි. වසර තුළ සියයට 15 කින් ඉහළ නැගුණු සංචාරක පැමිණීම් හේතුවෙන් ශුද්ධ සංචාරක ලැබීම් එ. ජ. ඩොලර් දශ ලක්ෂ 28 සිට එ. ජ. ඩොලර් දශ ලක්ෂ 55 ක් දක්වා ඉහළ නැගුණි. මේ අතර විදේශ ණය මත වූ පොලී ගෙවීම් වැඩි වීම (සියයට 2 කින්) සහ ආයෝජන මත වූ පොලී ආදයම් විශාල වශයෙන් අඩු වීම (සියයට 23 කින්) හේතුකොටගෙන ශුද්ධ පොලී ගෙවීම් ඉහළ යාම නිසා ආදයම් ගිණුමේ හිඟය එ. ජ. ඩොලර් දශ ලක්ෂ 180 සිට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 253 දක්වා පුළුල් විය. ගල්ෆ් යුද්ධය නිසා අවතැන් වූ 50,000 කට අධික ශ්‍රී ලාංකික සේවකයන්ට වන්දි වශයෙන් ලැබුණු එ. ජ. ඩොලර් දශ ලක්ෂ 112 ක්ද ඇතුළත් වූ පෞද්ගලික සංක්‍රාම ලැබීම් එ. ජ. ඩොලර් දශ ලක්ෂ 1,056 දක්වා සියයට 6 කින් ඉහළ නැගුණි. වසර තුළ ශුද්ධ පෞද්ගලික සංක්‍රාම එ. ජ. ඩොලර් දශ ලක්ෂ 848 සිට එ. ජ.

### 9.1 සංඛ්‍යා සටහන
## ගෙවුම් තුලන විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම
### (වාණිජ බැංකු සතු වි.ව්‍ය..මු.බැ.ඒකක සහභාගිත්වය දේශීය බැංකු ක්‍රමයේ කොටසක් ලෙස සලකා)(අ)

| ශීර්ෂය | ඇ.එ.ජ.ඩොලර් දශලක්ෂ | | | | | රුපියල් දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1995 | 1996 | 1997 | 1998 | 1999(ආ) | 1995 | 1996 | 1997 | 1998 | 1999(ආ) |
| වෙළෙඳ ශේෂය | -1,505 | -1,344 | -1,225 | -1,092 | -1,299 | -77,109 | -74,276 | -71,833 | -69,742 | -91,754 |
| අපනයන | 3,807 | 4,095 | 4,639 | 4,798 | 4,600 | 195,092 | 226,801 | 274,194 | 310,401 | 324,429 |
| ආනයන | 5,311 | 5,439 | 5,864 | 5,889 | 5,899 | 272,201 | 301,077 | 346,026 | 380,142 | 416,183 |
| සේවා (ශුද්ධ) | 152 | 105 | 159 | 145 | 147 | 7,796 | 5,805 | 9,386 | 9,300 | 10,337 |
| ලැබීම් | 821 | 765 | 875 | 914 | 965 | 42,045 | 42,358 | 51,692 | 59,084 | 67,979 |
| ගෙවීම් | 669 | 660 | 716 | 770 | 819 | 34,250 | 36,553 | 42,306 | 49,783 | 57,642 |
| ආදායම් (ශුද්ධ)(ඇ) | -170 | -197 | -160 | -180 | -253 | -8,717 | -10,923 | -9,417 | -11,556 | -17,813 |
| ලැබීම් | 226 | 186 | 234 | 214 | 167 | 11,596 | 10,258 | 13,792 | 13,882 | 11,810 |
| ගෙවීම් | 396 | 383 | 393 | 394 | 420 | 20,312 | 21,182 | 23,210 | 25,437 | 29,623 |
| භාණ්ඩ සේවා හා ආදායම් (ශුද්ධ) | -1,522 | -1,436 | -1,225 | -1,127 | -1,406 | -78,030 | -79,395 | -71,864 | -71,997 | -99,231 |
| පෞද්ගලික සංක්‍රාම (ශුද්ධ) | 675 | 710 | 788 | 848 | 887 | 34,593 | 39,230 | 46,494 | 54,843 | 62,472 |
| ලැබීම් (ඈ) | 790 | 832 | 922 | 999 | 1,056 | 40,482 | 46,003 | 54,445 | 64,585 | 74,356 |
| ගෙවීම් | 115 | 122 | 135 | 151 | 169 | 5,889 | 6,773 | 7,951 | 9,742 | 11,884 |
| නිල සංක්‍රාම (ශුද්ධ) | 61 | 49 | 44 | 52 | 24 | 3,114 | 2,709 | 2,625 | 3,359 | 1,690 |
| ජංගම ගිණුම | -786 | -677 | -393 | -226 | -495 | -40,324 | -37,456 | -22,745 | -13,795 | -35,068 |
| ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුම | 699 | 459 | 602 | 413 | 330 | 36,647 | 25,725 | 30,691 | 26,570 | 27,421 |
| ප්‍රාග්ධන ගිණුම | 117 | 96 | 87 | 80 | 75 | 6,009 | 5,286 | 5,140 | 5,109 | 5,274 |
| ප්‍රාග්ධන සංක්‍රාම (ශුද්ධ) | 117 | 96 | 87 | 80 | 75 | 6,009 | 5,286 | 5,140 | 5,109 | 5,274 |
| ලැබීම් | 121 | 100 | 91 | 84 | 80 | 6,191 | 5,495 | 5,386 | 5,410 | 5,641 |
| ගෙවීම් | 4 | 4 | 4 | 5 | 5 | 182 | 209 | 246 | 301 | 368 |
| මූල්‍ය ගිණුම | 581 | 363 | 515 | 334 | 255 | 30,638 | 20,439 | 25,550 | 21,461 | 22,148 |
| දිගුකාලීන | 502 | 381 | 716 | 398 | 397 | 25,939 | 20,962 | 37,029 | 25,906 | 28,310 |
| සෘජු ආයෝජන | 53 | 120 | 430 | 193 | 177 | 2,931 | 6,606 | 25,504 | 12,379 | 12,449 |
| විදේශීය සෘජු ආයෝජන | 16 | 86 | 129 | 137 | 177 | 1,011 | 4,756 | 7,587 | 8,846 | 12,449 |
| පෞද්ගලීකකරණ ලැබීම් | 37 | 33 | 301 | 56 | - | 1,920 | 1,850 | 17,918 | 3,533 | - |
| පෞද්ගලික දිගුකාලීන | 91 | 2 | 47 | 2 | 189 | 4,648 | 88 | 3,054 | 352 | 13,565 |
| ලැබීම් (ඉ) | 194 | 156 | 150 | 146 | 353 | 9,937 | 8,628 | 8,741 | 9,686 | 25,207 |
| ගෙවීම් | 103 | 155 | 102 | 145 | 165 | 5,289 | 8,539 | 5,687 | 9,334 | 11,641 |
| රජයේ දිගුකාලීන (ශුද්ධ) (ඊ) | 358 | 259 | 239 | 203 | 32 | 18,359 | 14,268 | 8,471 | 13,175 | 2,296 |
| ලැබීම් | 674 | 497 | 500 | 493 | 350 | 34,526 | 27,442 | 24,761 | 31,896 | 24,741 |
| ගෙවීම් | 315 | 238 | 262 | 290 | 319 | 16,166 | 13,174 | 16,291 | 18,721 | 22,445 |
| කෙටිකාලීන : | 79 | -18 | -201 | -64 | -142 | 4,699 | -523 | -11,479 | -4,445 | -6,162 |
| විවිධ ආයෝජන | -2 | 7 | 13 | -24 | -13 | -90 | 353 | 749 | -1,521 | -886 |
| පෞද්ගලික කෙටිකාලීන(ශුද්ධ)(ඇ) | 33 | -44 | -20 | 8 | -10 | 1,702 | -2,426 | -1,195 | 414 | -667 |
| වාණිජ බැංකු වත්කම් (ශුද්ධ)(ඇ) | 14 | 59 | -323 | 180 | -19 | -2,731 | 1,127 | -23,384 | 5,035 | 1,766 |
| වාණිජ බැංකු වගකීම් (ශුද්ධ) (ඇ) | 35 | -40 | 129 | -228 | -101 | 5,818 | 423 | 12,352 | -8,374 | -6,375 |
| රජයේ කෙටිකාලීන (ශුද්ධ) | - | - | - | - | - | | | | | |
| විගැහි වෙන්කිරීම් | - | - | - | - | - | - | - | - | - | - |
| රුපියල් අගය පිළිබඳ ගැලපීම් | - | - | - | - | - | 6,394 | 4,213 | -562 | 8,559 | 2,103 |
| වැරදීම් හා අත්හැරීම් | 139 | 150 | -46 | -151 | -98 | 5,091 | 7,527 | 8,461 | -7,534 | -8,640 |
| සමස්ත ශේෂය (උ) | 52 | -68 | 163 | 37 | -263 | 7,809 | 9 | 15,845 | 13,800 | -14,184 |
| මූල්‍ය වෙනස්වීම් (උ) | -52 | 68 | -163 | -37 | 263 | -7,809 | -9 | -15,845 | -13,800 | 14,184 |
| විනිමය අනුපාතය ශ්‍රී ලං.රු./එ.ජ.ඩොලර් | | | | | | 51.25 | 55.27 | 58.99 | 64.59 | 70.39 |
| ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස | | | | | | | | | | |
| වෙළඳ ගිණුම | | | | | | -11.5 | -9.7 | -8.1 | -6.9 | -8.2 |
| ජංගම ගිණුම | | | | | | -6.0 | -4.9 | -2.6 | -1.4 | -3.1 |
| ප්‍රදානයන් හැර ජංගම ගිණුම | | | | | | -6.5 | -5.2 | -2.8 | -1.7 | -3.3 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) මෙම සංඛ්‍යා ගෙවුම් ශේෂ අත්පොතේ 5 වන සංස්කරණයට (1993) අනුරූපව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ජාත්‍යන්තරව අනුගමනය කරන අයුරින් සකස් කොට ඇත. තවද 1994 සිට විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (වි.ව්‍ය.මු.බැ.ඒ.) දේශීය වාණිජ බැංකු ක්‍රමයේ කොටසක් ලෙස සලකා ඇත.

(ආ) තාවකාලික

(ඇ) 1994 සිට ගෙවුම් ශේෂ තුලන සංඛ්‍යා ලේඛන සැකසීමේදී විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (වි.ව්‍ය.මු.බැ.ඒ.) දේශීය වාණිජ බැංකු ක්‍රමයේ කොටසක් ලෙස සලකන ලදී. ඒ අනුව ගෙවුම් තුලන සංඛ්‍යා ලේඛන සැකසීමේදී වි.ව්‍ය.මු.බැ.ඒ. හා අනේවාසිකයන් අතර ගණුදෙනු ඇතුලත් කරනු ලැබ ඇති අතර, වි.ව්‍ය.මු.බැ.ඒ. හා නේවාසිකයන් අතර ගණුදෙනු ඉවත්කර ඇත.

(ඈ) 1990 ගල්ෆ් යුද්ධය නිසා කුවේටයේ රැකියා අහිමි වූ ශ්‍රී ලාංකිකයින්ට වන්දි වශයෙන් එක් අයෙකුට එ.ජ.ඩො.2500 බැගින් 1997, 1998 හා 1999 වසර වලදී පිළිවෙලින් 26,101ක්, 31,279 ක් සහ 37,343 දෙනෙකු සඳහා ලැබුණු එ.ජ.ඩො.දශ ලක්ෂ 64 එ.ජ.ඩො. දශ ලක්ෂ 78 සහ එ.ජ.ඩො.දශලක්ෂ 85 ද මෙහි අඩංගු වේ. ඊට අමතරව 1999 දෙවන වටයේ වන්දි වශයෙන් එක් අයෙකුට එ.ජ.ඩො.1,500 බැගින් 18,244 දෙනෙකු සඳහා ලැබුණු එ.ජ.ඩො.දශලක්ෂ 27 ක්ද එහි අඩංගුය.


(ඉ) 1995 සහ 1999 යන වසර වලදී ගුවන් යානා ආනයනය කිරීම සඳහා ගෙවන ලද අත්තිකාරම් ගෙවීම්වල ගැලපුම්, ප්‍රාග්ධන ලැබීම්වල ඇතුලත් වේ.

(ඊ) වැඩිමනත් තොරතුරු ඇතුලත් කිරීම සඳහා 1994 පටන් සංඛ්‍යා සංශෝධනය කර ඇත.

(උ) මූල්‍ය අංශයේ සියළුම ගණුදෙනු කාලච්ඡේද අවසානයේ විනිමය අනුපාතිකයන්ට අනුව පරිවර්තනය කර ඇත.

ඩොලර් දශ ලක්ෂ 887 දක්වා වැඩි විය. එසේ වුවද ශුද්ධ ජංගම නිල සංක්‍රාම 1999 වසර තුළ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 52 සිට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 24 දක්වා අඩු විය. වෙළඳ, සේවා, ආදයම් සහ සංක්‍රාම ගිණුම්වල දක්නට ලැබුණ මෙම ප්‍රවනතාවන් හේතුකොටගෙන ජංගම ගිණුමේ හිඟය එ.ජ. ඩොලර් දශ ලක්ෂ 226 සිට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 495 දක්වා කැපී පෙනෙන ලෙස පුළුල් විය.

**9.1 රූප සටහන**
**ගෙවුම් තුලනය (අ) (ආ)**




(අ) වර්ගීකරණය ගෙවුම් තුලන අත්පොතේ හතර වන සංස්කරණයේ සිට 5 වන සංස්කරණයට වෙනස්වීමත් සමග වාණිජ බැංකුවල වත්කම් සහ වගකීම්වල වෙනස්වීම සමස්ත ශේෂයෙන් ඉවත් කොට ඇත.

(ආ) 1994 සිට විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක දේශීය බැංකු ක්‍රමයේ කොටසක් සේ සලකන ලදී.

ප්‍රධාන වශයෙන් මූල්‍ය ගලා ඒම් පහත වැටීම හේතුකොටගෙන 1999 වසර තුළ ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුම්වල අතිරික්තය පහත වැටුණි. ශුද්ධ ප්‍රාග්ධන සංක්‍රාම එ.ජ. ඩොලර් දශ ලක්ෂ 80 සිට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 75 දක්වා පහත වැටුනු අතර මූල්‍ය ගිණුමේ අතිරික්තය එ.ජ. ඩොලර් දශ ලක්ෂ 334 සිට 1999 දී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 255 දක්වා අඩු විය. මූල්‍ය ගිණුමේ අතිරික්තය අඩු වීමට හේතු වූයේ වාණිජ බැංකුවල විදේශ වගකීම් අඩු වීමත්, රජයේ දිගුකාලීන ණය ගැනීම් පහත වැටීමත්ය. කොටස් වෙළඳපළට ගලා ආ ශුද්ධ ආයෝජන සහ පෞද්ගලික අංශයේ කෙටිකාලීන ශුද්ධ ණය ලැබීම්වල යම් වැඩි වීමක් වසර තුළ දක්නට ලැබුණි. කෙටිකාලීන පෞද්ගලික ප්‍රාග්ධන ගලායාම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 64 සිට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 142 දක්වා පුළුල් විය. ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළවල්වල දක්නට ලැබුණු අවාසිදායක තත්ත්වයන් හේතුකොටගෙන ශ්‍රී ලංකාව සිය ආරම්භක නෝට්ටු නිකුතුව කල් දැමූ අතර ආධාර ලබා දෙන රටවල සම්පත් ප්‍රමාණයේ සාමාන්‍ය අඩු වීමත්, විදේශ ණයවල අඩු උපයෝජනයත් යන කරුණු දෙකම හේතුකොටගෙන රජයට ලැබෙන දිගුකාලීන සහනදායී ණය ප්‍රාග්ධනය තාවකාලිකව පහත වැටුණි. මේ අතර රජය 1997 නිකුත් කළ පාවෙන අනුපාත නෝට්ටු නිකුතුවට අදාළව සමහර ආයෝජකයන් විකුණුම් විකල්පයන් ක්‍රියාත්මක කිරීම නිසා රජය විසින් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 34 ක ගෙවීමක් කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් රජයේ ශුද්ධ ප්‍රාග්ධන ලැබීම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 203 සිට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 32 දක්වා කැපී පෙනෙන ලෙස අඩු විය. මීට ප්‍රතිවිරුද්ධව විදේශීය සෘජු ආයෝජන සහ පෞද්ගලික ණය ප්‍රාග්ධන ලැබීම් ඉහළ යාම නිසා දිගුකාලීන පෞද්ගලික ශුද්ධ ප්‍රාග්ධන ලැබීම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 195 සිට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 366 දක්වා තියුණු ලෙස වැඩි විය.

**9.2 සංඛ්‍යා සටහන**
**විදේශීය වෙළෙඳාමෙහි ක්‍රියාකාරිත්වය**

| | වර්ධන අනුපාතිකය(අ) | | ඒකක වටිනාකම (1997 = 100) | | අනුපාත | |
|---|---|---|---|---|---|---|
| වර්ෂය | අපනයන | ආනයන | අපනයන | ආනයන | වෙළෙඳ අනුපාතිකය(ආ) | අපනයන/ ආනයන |
| 1997 | 13.3 | 7.6 | 100.0 | 100.0 | 100.0 | 0.79 |
| 1998 (ඇ) | 3.4 | 0.4 | 115.6 | 101.3 | 114.2 | 0.81 |
| 1999 (ඈ) | -4.1 | 0.2 | 113.8 | 106.6 | 106.8 | 0.78 |

මූලයන් : ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) වර්ධන අනුපාතිකය එ.ජ.ඩොලර් ඒකකය මගින් දී ඇත.
(ආ) (අපනයන ඒකක වටිනාකම් දර්ශකය/ආනයන ඒකක වටිනාකම් දර්ශකය) x 100
(ඇ) සංශෝධිතයි
(ඈ) තාවකාලිකයි


වසර අවසන් භාගයට ලඟාවත්ම ජපන් යෙන් මුදලේ වූ කැපී පෙනෙන ඉහළ යාම පිළිබිඹු කරමින් සහනදායී ණය වලින් බොහෝදුරට සමන්විත වූ රජයේ විදේශ ණය තොගය සියයට 3 කින් ඉහළ නැගුණි. විදේශ ණය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ගත් කළ සියයට 55.5 සිට 1999 දී සියයට 57.4 දක්වා ඉහළ නැගුණි. මේ අතර ණය සේවා අනුපාතය 1998 සියයට 11 සිට 1999 දී සියයට 12.5 දක්වා ඉහළ නැගුණි.

පෙර වසරේ දක්නට ලැබුණු දැඩි උච්චාවචනයන්ට ප්‍රතිවිරුද්ධව යමින් මෙම වසර තුළ විනිමය වෙළඳපොළවල් ස්ථායීව පැවතුණි. විශේෂයෙන්ම වසරේ අවසාන කොටස වනවිට උද්ධමනය පහළ යාමේ උපනතිය හේතුකොටගෙන විනිමය අනුපාතිකයන් මත වූ පීඩනය ලිහිල් විය. මෙය පිළිබිඹු කරමින් 1999 වසර තුළ ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 6 කින් අවප්‍රමාණය විය. 1999 වසර තුළ විදේශ මුදල් වර්ග 24 කින් යුත් එකතුවෙහි වටිනාකමට ප්‍රතිවිරුද්ධව ශ්‍රී ලංකා රුපියලේ මූර්ත සඵල විනිමය අනුපාතිකය සියයට 7 කින් අවප්‍රමාණය විය.


1999 වසර අවසන් වනවිට රටෙහි දළ විදේශ වත්කම් ප්‍රමාණය එ.ජ. ඩොලර් දශ ලක්ෂ 2,582 ක් වූ අතර එය 1999 වසරේ මාස 5.3 ක ආනයනයන් මූල්‍යයනය කිරීමට ප්‍රමාණවත් විය. මේ අතර දළ නිල විදේශ වත්කම් ප්‍රමාණය එ.ජ. ඩොලර් දශ ලක්ෂ 1,639 ක් වූ අතර එය 1999 සඳහා වූ ආනයන වලින් මාස 3.3 ක ආනයනයන් මූල්‍යයනය කිරීමට ප්‍රමාණවත් විය.

**9.2 රූප සටහන**
**විදේශීය වෙළෙඳාම**

**9.2.1 රූප සටහන**
**වෙළෙඳ ගිණුම**





**9.2.2 රූප සටහන**
**අපනයන සහ ආනයන පරිමා දර්ශක (අ)**
**(1997=100)**





(අ) පෙර පැවති වාර්ෂික වෙළඳ දර්ශකයන් හා ගලපමින් (splicing) 1995 වසර සඳහා වන දත්තයන් ලබාගන්නා ලදී.

**9.2.3 රූප සටහන**
**වෙළෙඳ ඒකක වටිනාකම් දර්ශක (අ)**
**(1997=100)**




(අ) පෙර පැවති වාර්ෂික වෙළඳ දර්ශකයන් හා ගලපමින් (splicing) 1995 වසර සඳහා වන දත්තයන් ලබාගන්නා ලදී.

**9.2.4 රූප සටහන**
**සේවා වෙළෙඳාම (අ)**




(අ) වර්ගීකරණය ගෙවුම් තුලන අත්පොතේ හතරවෙනි සංස්කරණයේ සිට පස්වෙනි සංස්කරණයට වෙනස්වීමත් සමග සේවා ගිණුමෙන් ආදායම් ඉවත්කර පෙන්වා ඇති අතර එය නව ක්‍රමය යටතේ ජංගම ගිණුමෙහි වෙනම අයිතමයක් ලෙස පෙන්වා ඇත.

## 9.2 අපනයන

1999 වසරේ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 4,600 ක් වූ මුළු අපනයන ඉපයීම් පෙර වසර හා සසඳන කල සියයට 4 ක අඩු වීමක් පෙන්නුම් කරයි. අපනයන පරිමාවේ ඇති වූ වැඩි වීම අභිබවා අපනයන මිල ගණන් පහත වැටීම මගින් මෙම අඩු වීම පිළිබිඹු කරයි. ඒකක මිල දර්ශකය 1999 දී සියයට 10 කින් පහත වැටුණු අතර පරිමා දර්ශකය සියයට 6 කින් වැඩි විය. අවුරුද්ද මුල් භාගයේ ලෝක වෙළෙඳපොලෙහි භාණ්ඩ හා යෙදවුම් මිල අඩු වීම හා නැගෙනහිර ආසියානු රට වලින් එල්ල වූ තරගකාරිත්වය හේතුවෙන් ප්‍රධාන අපනයන භාණ්ඩය වූ රෙදිපිළි හා ඇඟළුම්වල මිල අඩු වීමක් දක්නට ලැබුණි. රුසියාවේ ඇති වූ මූල්‍ය අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස තේ සඳහා ඉල්ලුමෙහිද අනතුරුව තේ මිලෙහිද අඩු වීමක් සිදු විය. නැගෙනහිර ආසියානු රට වලින් ඇති වූ තරගකාරිත්වය ස්වාභාවික රබර් සහ රබර් පදනම් කර ගත් නිෂ්පාදන කෙරෙහි බලපෑමක් ඇති කළේය.

1999 වසර අවසාන භාගයේ දී ශ්‍රී ලංකාවේ අපනයන ඉපයීම් වර්ධනය වීම ආරම්භ විය. 1999 වසරෙහි හතර වන කාර්තුවේ අපනයන ඉපයීම්වල සියයට 3 ක වැඩි වීමක් සිදු විය. ප්‍රධාන රෙදිපිළි හා ඇඟළුම් ආනයනකරුවන් වන ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපීය ආර්ථිකයන්හි ශක්තිමත් වර්ධනයක් ඇති වීම මෙයට හේතු කාරක විය. නැගෙනහිර ආසියානු රටවල මූල්‍ය අර්බුදකාරී තත්ත්වය යථා තත්ත්වයට පත්වීමත්, ඔවුන්ගේ ව්‍යවහාර මුදලෙහි අගය වැඩි වීමත් සමඟ 1999 වසරේ අග භාගයේ ශ්‍රී ලංකාවේ රබර් පදනම් කර ගත් කර්මාන්ත සහ ඇඟළුම් නිෂ්පාදනයන්හි තරගකාරිත්වයට මුහුණ දීමේ හැකියාව වැඩි විය. මේ අතර ප්‍රධාන නිෂ්පාදන රටවල්වල නිෂ්පාදනය අඩු වීමත් නැගෙනහිර ආසියානු රටවල මූල්‍ය තත්ත්වය යහපත් වීමත් රබර් මිල වැඩි වීමට හේතු විය. 1998 වසරේ අගෝස්තු මාසයේ සිට පහත වැටෙමින් පැවති තේ මිල ප්‍රධාන නිෂ්පාදන රටවල්වල තේ නිෂ්පාදනය අඩු වීමත්, ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍යයන් කොළඹ තේ වෙන්දේසියට වැඩියෙන් සහභාගී වීමත් හේතුවෙන් 1999 වසරේ අවසන් මාස දෙක තුළ සිට නැවත යථා තත්ත්වයට

**9.3 සංඛ්‍යා සටහන**
**අපනයන සංයුතිය**

| කාණ්ඩය | ඇ.ජ.ඩොලර් දශලක්ෂ | | | | | රුපියල් දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1995 | 1996 | 1997 | 1998(අ) | 1999(ආ) | 1995 | 1996 | 1997 | 1998(අ) | 1999(ආ) |
| 1. කෘෂිකාර්මික අපනයන | 829 | 961 | 1,060 | 1,088 | 947 | 42,478 | 53,206 | 62,667 | 70,225 | 66,751 |
| තේ | 481 | 615 | 719 | 780 | 621 | 24,638 | 34,067 | 42,533 | 50,280 | 43,728 |
| රබර් | 111 | 104 | 79 | 44 | 33 | 5,713 | 5,753 | 4,640 | 2,808 | 2,305 |
| පොල් | 103 | 110 | 118 | 94 | 129 | 5,270 | 6,091 | 6,939 | 6,110 | 9,119 |
| මද නිෂ්පාදන | 69 | 81 | 82 | 56 | 84 | 3,520 | 4,469 | 4,864 | 3,632 | 5,973 |
| වෙනත් | 34 | 29 | 35 | 38 | 45 | 1,750 | 1,622 | 2,075 | 2,478 | 3,146 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදන | 134 | 132 | 145 | 170 | 165 | 6,857 | 7,295 | 8,555 | 11,027 | 11,598 |
| 2. කාර්මික අපනයන (ඇ) | 2,870 | 3,006 | 3,436 | 3,607 | 3,543 | 147,094 | 166,543 | 203,114 | 233,508 | 249,947 |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 98 | 95 | 91 | 118 | 86 | 5,040 | 5,272 | 5,354 | 7,586 | 6,093 |
| රෙදිපිළි හා ඇඟළුම් | 1,853 | 1,902 | 2,274 | 2,460 | 2,425 | 94,946 | 105,341 | 134,455 | 159,303 | 171,068 |
| ඛනිජ නිෂ්පාදන | 85 | 104 | 97 | 73 | 74 | 4,374 | 5,740 | 5,743 | 4,662 | 5,210 |
| රබර් නිෂ්පාදන | 153 | 169 | 178 | 178 | 161 | 7,851 | 9,357 | 10,513 | 11,528 | 11,350 |
| පිඟන් නිෂ්පාදන | 46 | 48 | 55 | 54 | 49 | 2,371 | 2,677 | 3,246 | 3,478 | 3,442 |
| සම් හා සපත්තු | 118 | 139 | 183 | 214 | 201 | 6,054 | 7,690 | 10,812 | 13,855 | 14,140 |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 124 | 154 | 204 | 182 | 201 | 6,348 | 8,572 | 12,076 | 11,811 | 14,155 |
| දියමන්ති හා ස්වර්ණාභරණ(ඈ) | 196 | 192 | 142 | 131 | 163 | 10,023 | 10,643 | 8,384 | 8,491 | 11,472 |
| අනෙකුත් කාර්මික අපනයන | 197 | 202 | 212 | 197 | 183 | 10,087 | 11,251 | 12,531 | 12,794 | 13,018 |
| 3. ඛනිජ අපනයන | 87 | 96 | 90 | 60 | 64 | 4,447 | 5,292 | 5,271 | 3,863 | 4,540 |
| මැණික් | 78 | 86 | 84 | 56 | 61 | 3,972 | 4,771 | 4,899 | 3,577 | 4,326 |
| වෙනත් | 9 | 10 | 6 | 4 | 3 | 475 | 521 | 372 | 286 | 214 |
| 4. වර්ග නොකළ අපනයන (ඇ) (ඉ) | 21 | 32 | 53 | 43 | 46 | 1,073 | 1,760 | 3,141 | 2,802 | 3,215 |
| මුළු අපනයන | 3,807 | 4,095 | 4,639 | 4,798 | 4,600 | 195,092 | 226,801 | 274,193 | 310,398 | 324,453 |

(අ) සංශෝධිතයි
(ආ) තාවකාලිකයි
(ඇ) ගලපන ලදී.
(ඈ) ශ්‍රී ලංකා රේගුව විසින් සපයන ලද දියමන්ති අපනයනය පිළිබඳ දත්තයන් 1998 හා 1999 වර්ෂයන්හිදී ප්‍රධාන දියමන්ති අපනයනකරුවන්ගෙන් ලබාගත් දත්ත හා ගලපන ලදී.
(ඉ) ප්‍රතිඅපනයන ඇතුලත් ය.

මූලයන් : ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව
ප්‍රධාන දියමන්ති අපනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව


පත් වීමක් සිදු විය. ජපන් සහ නැගෙනහිර ආසියාතු රටවල ආර්ථිකය යහපත් වීමේ හේතුවෙන් මැණික් සහ ස්වර්ණාභරණවලට වූ ඉල්ලුම ඉහළ ගියේය.

## අපනයන ව්‍යුහය

1997 පසු නිදහස් ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දීමෙන් පසු අපනයන විවිධාංගීකරණයක් සහිතව රටෙහි අපනයන ව්‍යුහයේ සැළකිය යුතු වෙනස් වීමක් සිදු විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 1980 ගණන්වල මුල් කාලයේ සිට කාර්මික අපනයනයන්හි සැළකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණ අතර, මෙහි ප්‍රතිඵලයක් ලෙස මුළු අපනයනයන්ගෙන් කෘෂි නිෂ්පාදන අංශයේ අපනයනයන් 1977 වසරේ සියයට 74 සිට 1999 වසරේදී සියයට 21 දක්වා අඩු විය. 1977 දී සියයට 14 ක් වූ දායකත්වය 1987 සියයට 49 දක්වා වැඩි කර ගනිමින් කාර්මික අපනයන, ප්‍රධාන අපනයන කොටස්කරුවා වශයෙන් සිය දායකත්වය දිගටම පවත්වා ගත්තේය. පසුගිය අවුරුදු පහ තුළ මෙම අනුපාතය සියයට 75 ක් වශයෙන් පැවතිණි. රෙදිපිළි හා ඇඟළුම් කර්මාන්තය කාර්මික අංශය තුළ විශාලතම තනි අපනයන භාණ්ඩය බවට 1986 දී පත් විය. 1986 වසරේදී මුළු අපනයනයෙන් සියයට 28 ක් වූ රෙදිපිළි හා ඇඟළුම් 1999 වසරේදී සියයට 53 දක්වා ඉහළ ගියේය. රබර් පදනම් කර ගත් කර්මාන්ත, විදුලි උපකරණ ඇතුළු විවිධ අමතර කොටස්, ගමන් භාණ්ඩ හා පාවහන් ආදී සම් නිෂ්පාදන, දියමන්ති හා ස්වර්ණාභරණ, ඛනිජ නිෂ්පාදන, ටින් කල ආහාර, පලතුරු සහ මාළු නිෂ්පාදන, පිඟන් භාණ්ඩ, අත්කම් භාණ්ඩ සහ රසායනික නිෂ්පාදන යන කර්මාන්ත පසුගිය වසර දහය තුළදී සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. 1977 පසු ඛනිජ අපනයනයන්හි විශේෂයෙන් මැණික් අපනයනයෙහි කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබිණි.

1999 වසරේ කාර්මික අපනයනයන්ගෙන් සියයට 68 කට දායක වෙමින් රෙදිපිළි හා ඇඟළුම් අපනයන ප්‍රමුඛ උප කාණ්ඩය වශයෙන් තවදුරටත් පැවතිණි. එක් භාණ්ඩයක් මත දැඩි ලෙස රඳ පැවැත්ම පිළිබිඹු කරමින් ඉතිරි සියයට 32 යන්ත්‍රසූත්‍ර සහ උපකරණ (සියයට 6), රබර් පදනම් කර ගත් කර්මාන්ත (සියයට 5), සංචාරක භාණ්ඩ සහ දියමන්ති (සියයට 4 බැගින්), ඛනිජ නිෂ්පාදන සහ පාවහන් (සියයට

9.3 රූප සටහන
**ප්‍රධාන කාණ්ඩ අනුව අපනයන වටිනාකම**





2 බැගින්), කවචයන් හා මෘදුවංගීහු හා පිහන් මැටි වලින් නිපදවූ භාණ්ඩ (සියයට 1 බැගින්), වෙනත් කාර්මික නිෂ්පාදන (සියයට 7) යනාදියෙන් සමන්විත වේ. 1999 වසරේ කෘෂි අංශයට සියයට 65 කින් දයක වූ තේ අපනයන තවදුරටත් මූලිකත්වය ගෙන තිබුණි. 1999 වසරේ මුළු අපනයනයෙන් සියයට 13 ක් තේ අපනයනයන්ට හිමි විය.

## කාර්මික අපනයන

1998 වසරේ පැවති සියයට 5 ක වර්ධනය හා සසඳන කල 1999 වසරේදී කාර්මික අපනයන ඉපයීම් සියයට 2 ක අඩු වීමක් පෙන්නුම් කරයි. 1999 වසරේ අපනයන පරිමාව සියයට අටකින් ඉහළ ගියද, ඒකක මිල සියයට 9 කින් පහත වැටුණු හෙයින් රෙදිපිළි හා ඇඟළුම් අපනයනයෙන් ලද ආදයම සියයට එකකින් පහත වැටුණි. රෙදිපිළි අපනයන සියයට 11 කින්ද, අනෙකුත් රෙදිපිළි ආශ්‍රිත නිෂ්පාදන සහ නූල් සියයට 21 කින් හා සියයට 15 ක් වශයෙන්ද පිළිවෙලින් පහත වැටුණි. රෙදිපිළි හා ඇඟළුම් වලින් ලත් මුළු අපනයන ආදයමෙන් සියයට 90 ක් ඇඟළුම් අපනයනයෙන් ලද අතර රෙදිපිළි හා ඇඟළුම් උප

9.4 රූප සටහන
**ප්‍රධාන කාණ්ඩ අනුව කාර්මික අපනයන වටිනාකම**




කාණ්ඩය සියයට 0.2 ආන්තික වැඩි වීමක් වාර්තා කළේය. දේශීය වශයෙන් එකතු කළ වටිනාකම ඉහළ යාම සහ අමු ද්‍රව්‍යවල මිල මට්ටම අඩු වීම හේතුවෙන් ශුද්ධ විදේශ විනිමය ඉපැයීම් සියයට 9 කින් ඉහළ ගියේය. පෙර වසර සමග සසඳන කල රෙදිපිළි හා ඇඟළුම් අපනයනයෙන් සියයට 90 කට වඩා ප්‍රමාණයකට ආයෝජන මණ්ඩලයෙහි සමාගම් දයක විය. 1998 වසරේ සියයට 10 ක වර්ධනය හා සසඳන කල ආයෝජන මණ්ඩල සමාගම් මගින් ලද අපනයන ඉපැයීම් සියයට 1 කින් පහත වැටිණි. ආයෝජන මණ්ඩලයට අයත් නොවන ව්‍යාපාරයන්හි අපනයන ඉපැයීම් 1998 වසරේදී සියයට 4 කින් අඩු වූ අතර 1999 වසරේදී එය තවදුරටත් සියයට 7 කින් අඩු වූයේ අඩු වටිනාකම් සහිත භාණ්ඩ වෙළෙඳපොළ සඳහා භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන කුඩා පරිමාණ අපනයන කරුවන්ගේ නිෂ්පාදන කෙරෙහි ආසියාතු මූල්‍ය අර්බුදයෙහි බලපෑම පිළිබිඹු කරමිනි. ඇමෙරිකා එක්සත් ජනපදය (සියයට 61) සහ එක්සත් රාජධානිය (සියයට 22) ප්‍රමුඛ කොටගත් යුරෝපා සංගමය (සියයට 35) ප්‍රධාන වෙළෙඳපොළවල් ලෙස තවදුරටත් පැවතිණි.

1998 වසරේදී සියයට 11 ක අඩු වීමක් පෙන්නුම් කල යන්ත්‍ර, කාර්මික සහ විද්‍යුත් උපකරණ අපනයන සියයට 10 කින් ඉහළ නැගුණි. විද්‍යුත් පරිපථ, මහන මැෂින් අමතර කොටස්, කාර්යාලයීය යන්ත්‍ර සූත්‍ර, දත්ත සැකසුම් යන්ත්‍ර, විදුලිමය යන්ත්‍ර, විදුලිබල උත්පාදන යන්ත්‍ර සහ යන්ත්‍රසූත්‍ර මෙවලම් 1999 වසරේ ප්‍රධාන අපනයන ප්‍රභේදයන් විය.

1999 වසරේ රබර් පදනම් කර ගත් කර්මාන්තයන්ගේ අපනයන සියයට 10 කින් පහත වැටුණු අතර එයට මූලික වී ඇත්තේ අත් වැසුම් හා ටයර් අපනයනයන්ගේ ඇති වූ පහත වැටීමයි. එක් ප්‍රධාන නිෂ්පාදන ආයතනයක් නැවත නිෂ්පාදන කටයුතු ඇරඹීමත් සමඟ 1999 සැප්තැම්බර් මාසයෙන් පසුව පරීක්ෂණ කටයුතු සඳහා භාවිතා කරන අත් වැසුම් අපනයනය යථා තත්ත්වයට පත් වනු දක්නට ලැබිණි. 1999 වසරේ පිරිහෙමින් තිබූ අත්වැසුම් සහ ටයර් වලින් ලද අපනයන ආදායම වසරේ අග භාගයේදී මඳ වශයෙන් ඉහළ යාමක් දක්නට ලැබුණි. 1999 වසරේ රබර් පදනම් කර ගත් කර්මාන්ත වලින් සියයට 32 කට රබර් අත්වැසුම් දායක විය. බුමුතුරුණු, කලාල, තහඩු, ඇතිරිලි හා රබර් පටි අපනයනයන් වර්ෂය මුළුල්ලෙහිම සතුටුදායක මට්ටමක පැවතිණි. මීට අමතරව අළුත් නිෂ්පාදනයන් වන ඇඳුම් පැලඳුම් සඳහා වන උපාංග, යන්ත්‍රසූත්‍ර අමතර කොටස් හා පොළවට යොදන පිහන් ගඩොල් 1999 වසරේදී අපනයනය කරන ලදී.

ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ප්‍රංශය සහ කැනඩාව යන රටවලට වැඩි වශයෙන් ක්‍රීඩා සහ අනෙකුත් පාවහන් අපනයනය කිරීම හේතුකොටගෙන පාවහන් අපනයනය සියයට 5 කින් ඉහළ ගියේය. ඇමෙරිකා එක්සත් ජනපදය, කැනඩාව, ජපානය, ප්‍රංශය සහ ඉතාලිය යන රට වලින් ලද අඩු ඉල්ලුම හේතුවෙන් අත්බෑග් සහ ගමන් මළු අපනයන සියයට 11 කින් පහත වැටුණි. නැගෙනහිර ආසියාතු රට වලින් එල්ල වූ දැඩි තරඟකාරිත්වය නිසා 1999 වසර පුරාම සම් සහ පිහන් භාණ්ඩ සඳහා අඩු ආදායමක් ලැබිණි. කෙසේ නමුදු 1999 වසරේ අවසාන කාර්තුවේ මෙම සියළුම අංශයන්හි වර්ධනයක් දක්නට ලැබුණි.

ආහාර, බීම වර්ග හා දුම්කොළ උප කාණ්ඩයෙහි ඉපැයීම් 1999 වසරේදී සියයට 27 කින් පහත වැටිණි. මෙයට හේතු වූයේ 1998 වසරේදී මෙම උප කාණ්ඩය සඳහා සියයට 67 කින් දායක වූ කවචයන් හා මෘද්වංගීගෙන් ලත් ඉපැයීම් විශාල වශයෙන් අඩු වීමයි. හිස කහ වීම සහ සුදු පුල්ලි රෝග පැතිර යාම නිසා 1998 අගෝස්තු මාසයෙන් පසු ඉස්සන් ඇති කරන ප්‍රධාන වගා බිම්වල වගා කටයුතු තාවකාලිකව නවතා දමන ලදී. වගා බිම් මෙම රෝගයන්ගෙන් මිදුනද අධික වර්ෂාව නිසා ඉස්සන් අපනයනයන්හි සැළකිය යුතු වෙනසක් ඇති කිරීමට ප්‍රමාණවත් තරම් අළුතින් නිෂ්පාදනයක් සිදු නොවීය. වැඩි නිෂ්පාදනයක් බලාපොරොත්තුවෙන් සමහර ඉස්සන් වගා කරන්නන් වගාවට අහිතකර වැරදි ක්‍රියා මාර්ග අනුගමනය කිරීම නිසා 1998 වසරේ අවසාන කාර්තුවේ සිට ඉස්සන් වගාවෙහි බිඳ වැටීම ඇරඹිණි. අනාගතයේදී මෙවැනි තත්ත්වයක් ඇති නොවීමට වග බලා ගනිමින් ඉස්සන් වගාව හා සැකසීම ක්‍රමවත් කිරීම පිණිස ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යාංශය දැනටමත් අවශ්‍ය උපදෙස් මාලාවක් ගොවීන්ට හඳුන්වා දී ඇති අතර ගොවීන් මෙම මාර්ගෝපදේශ නිසි පරිදි අනුගමනය කරන්නේදැයි තහවුරු කිරීම පිණිස දැඩි විමර්ශණයට ලක් කරනු ඇත. මීට අමතරව 1998 වසරේදී අක්කරයකට රු. 50,000/- බැගින් ඉස්සන් ගොවිපලවල් නවීකරණය සඳහා වගා බිමෙන් සියයට 50ක් ආවරණය වන පරිදි ලබා දෙන ලද මූල්‍ය ආධාරයට අමතරව බැංකු පොලී බර අඩු කෙරෙන සහන සහ ඉස්සන් සඳහා වන ආහාර මිලදී ගැනීම සඳහා සපයන ලද ණයවල අවදානම බැංකු සමඟ බෙදා ගැනීමේ සහන ක්‍රමයක් සීමිත කාලසීමාවක් සඳහා සපයා දෙන ලදී. සහනයක් වශයෙන් ඉස්සන් සඳහා වූ ආහාර තවදුරටත් ආනයන බදු වලින් නිදහස්ව පවත්වා ගැණින. 1999 වසරේදී පොකිරිස්සන් සහ කකුළුවන් අපනයනය සියයට 28 කින් වැඩි වූ අතර අළුත් මාළු, ශීත කරන ලද හා ලුණු දමන ලද මාළු සහ සත්ව ආහාර අපනයනය සියයට 42 කින් ඉහළ ගියේය. මෙයට හේතු වූයේ ස්වීඩනයේ ජාත්‍යන්තර සංවර්ධන සහයෝගිතා ආයතනයේ ආධාර යටතේ යුරෝපීය වෙළෙඳපොලෙහි ඉල්ලුමට සරිලන පරිදි මත්ස්‍ය නිෂ්පාදනවල ගුණාත්මක බව වැඩි දියුණු කිරීමට පියවර ගැනීමයි. අනෙකුත් ආහාර ද්‍රව්‍ය අතර පොල් කිරි සහ පොල් මද, ටින් කල පලතුරු, රස කැවිලි, සකස් කරන ලද විවිධ ආහාර සහ සෝස් වර්ග ආදිය පෙර වසරට වඩා වර්ධනයක් පෙන්නුම් කළේය.

බෙල්ජියම, ඊශ්‍රායලය, වියට්නාමය, ඇමෙරිකා එක්සත් ජනපදය සහ ජපානය යන රට වලින් ලද ඉහළ ඉල්ලුම හේතුකොට 1999 වසරේදී දියමන්ති අපනයන සියයට 26 කින් වැඩි විය. රසායනාගාර තුළ කෘතිම ලෙස නිපදවන ලද දියමන්ති කෙරෙහි ඉල්ලුම් කරුවන් ඇදී යාමක් දක්නට ලැබුණි. ලෝක ආර්ථිකය යථා තත්ත්වයට පත් වීම හේතුවෙන් 1999 මැයි මාසයේ සිට දියමන්ති අපනයනය වර්ධනය අඛණ්ඩව සිදු විය.

නැගෙනහිර ආසියාතු මූල්‍ය අර්බුදයත් සමඟ පීඩාවට ලක්ව තිබූ ස්වර්ණාභරණ වෙළෙඳපළ 1999 මැයි මාසයෙන් පසු නැවත යථා තත්ත්වයට පත් වීමක් දක්නට ලැබුණ අතර 1999 දී සියයට 1 ක වර්ධනයක් පෙන්නුම් කළේය. ඇමෙරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ ස්වර්ණාභරණ මිලදී ගන්නා විශාලතම ගැනුම්කරුවා වන අතර ජර්මනිය, ජපානය හා එක්සත් රාජධානිය අනෙකුත් ප්‍රධාන ගැනුම් කරුවන් වේ.

1999 වසරේ මුල් භාගයේදී තියුණු අඩු වීමක් (සියයට 35 ක) වාර්තා කළ ඛනිජ නිෂ්පාදන අපනයනයන් 1999 වසරේදී සියයට 2 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 1999 වසරේ මුල් භාගයේ ඛනිජ නිෂ්පාදන අපනයනයන් මෙලෙස අඩු වීමට හේතු වූයේ 1999 වසරේ ජනවාරි මස 19 වැනි දින සිට මාර්තු 20 දක්වා තෙල් පිරිපහදුව

නඩත්තු කටයුතු සඳහා වසා තැබීමේ ප්‍රතිඵලයක් වශයෙනි. ජාත්‍යන්තර වශයෙන් ඛනිජ තෙල් මිල ගණන් ඉහළ යාමත්, තෙල් පිරිපහදුවේ නිෂ්පාදන කටයුතු යථා තත්ත්වයට පත් වීමත් හේතුවෙන් 1999 දෙවන භාගයේ ඛනිජ නිෂ්පාදන අපනයනය සියයට 47 කින් ඉහළ ගියේය.

අනෙකුත් කාර්මික නිෂ්පාදන අතර රසායනික නිෂ්පාදන (සියයට 10), මේස ආවරණ (සියයට 11), පිඟන් ගඩොල් (සියයට 22), ලීයෙන් නිම කරන ලද විසිතුරු භාණ්ඩ (සියයට 8) සහ සම් භාණ්ඩ (සියයට 5) පෙර වසරට වඩා අඩු වීමක් පෙන්නුම් කරන ලදී. එහෙත් සෙල්ලම් බඩු, තඹ හා තිරිවාන ගල් වලින් කළ භාණ්ඩ, කොසු හා බුරුසු, අමුතු මාදිලියේ සංගීත උපකරණ ආදිය සඳහා ඉල්ලුම 1998 වර්ෂයට වඩා වැඩි වූ අතර බටහිර රට වලින් පැවති ඉහළ ඉල්ලුම මීට හේතු විය.

## වැවිලි බෝග

වැවිලි බෝග අපනයනයෙන් ලත් ඉපැයීම් සියයට 15 කින් අඩු විය. පොල් නිෂ්පාදිත අපනයනයන්ගේ ඉහළ යාමක් දක්නට ලැබුණු අතර තේ සහ රබර් නිෂ්පාදිත අපනයනයේ පහත බැසීමක් දක්නට ලැබුණි. කෙසේ නමුදු 1999 නොවැම්බර් මාසයෙන් පසුව තේ සහ රබර් අපනයනයෙන් ලත් ඉපැයීම් යථා තත්ත්වයට පත් වීමක් පෙන්නුම් කරන ලදී. රුසියානු මූල්‍ය අර්බුදය නිසා 1998 අගෝස්තු මාසයේ සිට දිගටම පහත වැටුණු තේ මිල මෙම වසරේ දෙවන භාගයේදී ඉහළ යාමක් දක්නට ලැබුණි. ප්‍රධාන තේ නිෂ්පාදන රටවල් වන ඉන්දියාව සහ කෙන්යාව වැනි රටවල නිෂ්පාදනය අඩු වීමත්, ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍යයන් කොළඹ තේ වෙන්දේසියට වැඩියෙන් සහභාගී වීමත් මීට හේතු විය. 1998 වසරේ කිලෝ ග්‍රෑමයකට එ.ජ. ඩොලර් 2.87 ක්ව පැවති තේ මිල 1999 වසරේදී කිලෝ ග්‍රෑමයකට එ.ජ. ඩොලර් 2.30 දක්වා සියයට 20 කින් පහත වැටිණි. 1999 වසරේදී අපනයනය කරන ලද තේ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 269 ක් වූ අතර එය සියයට 1 ක අඩු වීමක් පෙන්නුම් කරන ලදී. තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 259 දක්වා සියයට 2 කින් වර්ධනය විය.

ශ්‍රී ලංකාවේ තේ අපනයන සංයුතිය දෙස සලකා බලන කල සියයට 64 කට වැඩි ප්‍රමාණයක් තොග වශයෙන් පැවති අතර, සියයට 30 ක් පැකට් වලින් සමන්විත විය. තේ මළු, විදේශීය තේ හා මිශ්‍ර කළ තේ, ක්ෂණික සහ හරිත තේ වශයෙන් සකසන ලද වැඩි එකතු කල වටිනාකමකින් යුත් තේ මුළු තේ ප්‍රමාණයෙන් සියයට 6 කටත් අඩු ප්‍රමාණයකින් සමන්විත වේ. ශ්‍රී ලංකාවේ තේ වලින් සියයට 99 ක් සම්ප්‍රදායික (Orthodox) තේ වලින් සමන්විත වන අතර, කපා, ඉරා සහ අඹරන ලද (C.T.C.) තේ නිෂ්පාදනය ඉතා සුළු ප්‍රමාණයකි. ශ්‍රී ලංකාව තේ කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 1.9 ආනයනය කරන ලද අතර මෙය 1999 වසරේ දේශීය නිෂ්පාදනයෙන් සියයට 1 කටත් වඩා අඩු ප්‍රමාණයකි. එක්සත් අරාබි එමීර් රාජ්‍ය ශ්‍රී ලංකාවේ විශාලතම තේ ගැනුම්කරුවා විය (සියයට 15). 1995 සිට ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගැනුම්කරු වූ රුසියාව සියයට 14 ක ප්‍රමාණයක් මිලදී ගනිමින් දෙවැනි ප්‍රධාන ගැනුම්කරු වූ අතර සියයට 9 කට දයක වෙමින් තුර්කිය තෙවැනි ගැනුම්කරු බවට පත් විය. අනෙකුත් ප්‍රධානතම ගැනුම්කරුවන් වූයේ සිරියාව (සියයට 7), සෞදි අරාබියාව සහ ඉරානයයි (සියයට 4 බැගින්).

ජාත්‍යන්තර මිල ගණන් අඩුවීම හේතුවෙන් රබර් අපනයනයෙන් ලත් අදයම සියයට 25 කින් පහත වැටුණි. 1998 වසරේ, කිලෝග්‍රෑම් දශලක්ෂ 41.5 ක් වූ අපනයන ප්‍රමාණය 1999 වසරේ කිලෝග්‍රෑම් දශලක්ෂ 42.8 දක්වා වර්ධනය වූ අතර පකිස්ථානය, ඇමෙරිකා එක්සත් ජනපදය, හා ජපානයට අපනයනය කල රබර් ප්‍රමාණය ඉහල නැගීම මීට හේතුවිය. 1999 දී ෂීට් රබර් අපනයනය කිලෝග්‍රෑම් දශලක්ෂ 13 සිට කිලෝග්‍රෑම් දශලක්ෂ 17 දක්වා වැඩි විය. සියළුම ප්‍රධාන රබර් වර්ග වල මිල ගණන් පහත වැටීම හේතුවෙන් රබර් අපනයනයන්ගේ සාමාන්‍ය මිල සියයට 27 කින් පහත වැටිණි. ඒ අනුව රබර් කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය මිල කිලෝ ග්‍රෑමයකට එ.ජ. ඩොලර් 1.05 සිට එ.ජ. ඩොලර් 0.77 දක්වා අඩුවිය. 1999 වසරේදී සෝල් ක්‍රේප් හැර ලේටෙක්ස් සහ අනෙකුත් ක්‍රේප් රබර්වල අපනයන සාමාන්‍ය මිල සියයට 25 කින් පහත වැටුණු අතර ෂීට් රබර් වර්ගවල සාමාන්‍ය අපනයන මිල සියයට 23 කින්ද පහත වැටිණි. කෙසේ නමුදු රබර් අපනයනයෙන් ලද ආදායම මුළු අපනයන ආදායමෙන් සියයට 1 වඩා අඩු විය.

ප්‍රධාන රබර් නිෂ්පාදන රටවල් වන තායිලන්තය, ඉන්දුනීසියාව සහ මලයාසියාව යන රටවල අතිරික්ත නිෂ්පාදනයක් පැවැත්ම සහ එම රටවල මුදලේ අගය තියුණු ලෙස පිරිහීම හේතුකොටගෙන 1997 මැද භාගයේ සිට දිගටම පහත වැටුණු ලෝක රබර් මිල 1999 අගදී සැළකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. ඇමෙරිකා එක්සත් ජනපදය, දකුණු කොරියාව, චීනය සහ නැගෙනහිර ආසියානු රට වලින් ස්වභාවික රබර් සඳහා ඇති වූ අධික ඉල්ලුමත්, ප්‍රධාන නිෂ්පාදන රටවල නිෂ්පාදනය අඩු වීමත් මිල වැඩි වීමට දයක විය. අනෙක් අතට ඛනිජ තෙල් මිල විශාල ලෙස ඉහළ යාම නිසා කෘතිම රබර් මිල ඉහල යාම ස්වභාවික රබර් මිල මෙසේ ඉහළ යාමට තවත් හේතුවක් විය. 1998 දී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 96 ක් වූ රබර් නිෂ්පාදනය 1999 වසරේදී කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 98 දක්වා ඉහළ ගියේය. 1999 දී දේශීය රබර් පරිභෝජනය කිලෝග්‍රෑම් දශලක්ෂ 54 ක් ව පැවතිණ. අමුද්‍රව්‍ය වශයෙන් භාවිතයේදී තිබිය යුතු ගුණාත්මක අවශ්‍යතාවයන් හා ආකර්ෂණීය මිල ගණන් හේතුකොට ගෙන දේශීය කර්මාන්ත විසින් 1999 දී රබර් කිලෝ ග්‍රෑම් 675,132 ක් ආනයනය කල අතර, 1998 දී ආනයනය කරනු ලැබුයේ කිලෝග්‍රෑම් 259,869ක් පමණි.

කපාපු පොල් සහ කොප්පරා සඳහා පැවති ඉහළ මිල ගණන් නිසා 1999 අප්‍රේල් මාසයෙන් පසුව ප්‍රධාන පොල් නිෂ්පාදන වර්ග තුනෙන් ලද ඉපැයුම් යථා තත්වයට පත් වූ අතර 1999 වසරේ සාමාන්‍ය වර්ධනය සියයට 51 ක් විය. එල් නිනෝ තත්ත්වයේ ප්‍රතිඵලයක් ලෙස ඇති වූ දිගුකාලීන නියඟයේ පසුකාලීන බලපෑම මත පිලිපීනයේ

හා ඉන්දුනීසියාවේ පොල් සැපයුම පහත වැටීම, මෙසේ ජාත්‍යන්තර පොල් මිල ගණන් ඉහළ යාමට හේතු විය. කෙසේ වුවත් 1999 ජූලි මාසයේ සිට පොල් තෙල් මිල ගණන් දිගටම පහත වැටීමක් සිදු විය. 1999 ජූලි මාසයේ සිට මලයාසියාව පාම් තෙල් සඳහා වූ අපනයන තීරු බද්ද සියයට 30 සිට සියයට 10 දක්වා පහත දැමීම සහ පාම් තෙල් සැපයුම විශාල වශයෙන් ඉහළ දැමීම සහ පාම් තෙල් වැනි ලාභ දයික ආදේශකයන්ගේ සැපයුම විශාල ලෙස ඉහල යාම මීට හේතුවිය. ලෝක වෙළඳපොළෙහි පාම් තෙල් මෙට්‍රික් ටොන් එකක මිල එ.ජ. ඩොලර් 671 සිට එ.ජ. ඩොලර් 436 දක්වා සියයට 35 කින් අඩු විය. එසේ වුවත් 1999 වසරේ පොල් තෙල් සඳහා එ.ජ.ඩොලර් 737 ක් වූ ඉහළ මිලක් පැවතුණි. ලෝක වෙළෙඳපොලෙහි සෝයා තෙල් හා සූරියකාන්ත තෙල් මිල සියයට 30 හා සියයට 32 වශයෙන් පිළිවෙලින් අඩු වීමක් දක්නට ලැබිණ.

විශේෂයෙන් කොහු කෙඳි පදනම් කර ගත් මෙට්ට සඳහා ඉහළ ඉල්ලුමක් පැවතීම නිසා 1999 වසරේදී අනෙකුත් කොහු නිෂ්පාදිත අපනයනය සියයට 17 කින් ඉහළ ගියේය. කොහු මෙට්ට අපනයන පරිමාව සියයට 31 කින් ඉහළ ගියේය. කොහු කෙඳි හැර අනෙකුත් කෙඳි නිෂ්පාදන මිල පෙරට වඩා අඩු විය. එනමුදු පොල්කටු, අඟුරු හා අළුත් පොල් ගෙඩි අපනයනය පෙර වසරට වඩා වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

### වෙනත් කෘෂිකාර්මික නිෂ්පාදන

අනෙකුත් කෘෂි නිෂ්පාදන ඉපැයීම් සියයට 3 කින් පහත වැටිණි. කුරුඳු, සකස් නොකල දුම්කොළ, ගම්මිරිස්, එළවළු, කජු මද, වාෂ්පශීලී තෙල්, තල ඇට සහ කෝපි අපනයන පහත වැටිණි. 1999 වසරේ අග භාගයේ බලාපොරොත්තු රහිතව ලැබුණු අධික වර්ෂාපතනය සමහර නිෂ්පාදන කෙරෙහි අහිතකර ලෙස බල පෑ අතර සමහර නිෂ්පාදන සඳහා ඉල්ලුම අඩු වීම අයහපත් ලෙස බලපාන ලදී. විශාල වශයෙන් අපනයන ප්‍රමාණය ඉහළ යාමේ බලපෑම යටපත් කරමින් ජාත්‍යන්තර මිල පහත වැටීම කුරුඳු අපනයනය ආන්තික වශයෙන් අඩු විය. ඊජිප්තුව, ඉන්දියාව, පකිස්ථානය, එක්සත් රාජධානිය සහ ඇමෙරිකා එක්සත් ජනපදය යන රට වලින් පැවති අඩු ඉල්ලුම හේතුවෙන් ගම්මිරිස් වලින් ලද ඉපැයීම් සියයට 30 කින් පහත වැටිණි. ප්‍රංශය, ඉතාලිය හා ස්පාඤ්ඤය යන රටවලින් ඉල්ලුම අඩු වීම නිසා මිල ගණන් ඉහළ ගොස් තිබියදී අපනයන පරිමාව සියයට 36 කින් පහත වැටීම හේතු කොට සකස් නොකළ දුම්කොළ අපනයනය සියයට 6 කින් පහත වැටුණි. මෙම බෝග ත්‍රිත්වය අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන වලින් සියයට 64 කට වඩා දායකවිය. පස් ගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයකින් ඉන්දියාවට වියලන ලද පළතුරු අපනයනය කිරීම නිසා අළුත් සහ වියලන ලද පළතුරු අපනයන ඉපයීම් (සියයට 94) ඉහළ ගියේය. අන්නාසි, සියඹලා සහ දිවුල් අපනයනයන්ද ඉහළ ගියේය. අළුත් සහ වියලන ලද පළතුරු ඉන්දියාව, මාලදිවයින, පකිස්ථානය, එක්සත් අරාබි එමීර් රාජ්‍ය, ජර්මනිය හා මලයාසියාවට විශාල වශයෙන් අපනයනය කරන ලදී. පුවක්, කරාබුනැටි, සාදික්කා, වසාවාසි සහ බුලත් අපනයනයන්ද ඉහළ ගියේය.

### ඛනිජ නිෂ්පාදිත

මැණික් අපනයනයෙන් ලද ඉපැයීම් ඉහළ යාම නිසා ඛනිජ නිෂ්පාදිත අපනයන සියයට 8 කින් ඉහළ ගිය අතර එය 1999 වසරේ මුළු අපනයන ඉපැයීම් වලින් සියයට 2 කට දායක විය. නැගෙනහිර ආසියානු අර්බුදය හා ජපන් වෙළෙඳපොල අවපාතය නිසා පිරිහුණු මැණික් අපනයනය ජපානය, හොංකොං, තායිලන්තය හා සිංගප්පූරුවට විශාල වශයෙන් අපනයනය වැඩි කිරීම සමග 1999 අප්‍රේල් මාසයේ සිට වර්ධනය වනු දක්නට ලැබිණි. පුහුණු ශ්‍රමය හා උසස් තාක්‍ෂණය උපයෝගී කර ගනිමින් ශ්‍රී ලංකාවේ මැණික් කැපීමේ කර්මාන්තය ගුණාත්මක බවින් ඉහළ මට්ටමකට පැමිණීම නිසා ගුණාත්මක භාවය පිළිබඳව සැලකිලිමත් වන ඇමෙරිකා එක්සත් ජනපදය හා යුරෝපීය වෙළඳපොළ අත් කර ගැනීමට හැකි විය. දියුණු කර ගැනීමට හැකියාවක් ඇති වෙළෙඳපොලක් වන ප්‍රංශය, මැණික් වෙළඳපොළෙහි කැපී පෙනෙන ගැණුම්කරුවකු ලෙස නැගී ආ අතර, එක්සත් රාජධානිය, ජර්මනිය, ස්විට්සර්ලන්තය හා ස්වීඩනය අනෙකුත් ප්‍රධාන ගැණුම්කරුවන් වශයෙන් යුරෝපීය වෙළඳපොළේ දිගටම කටයුතු කළේය. ක්‍රමාංකිත ගල්, නිල්, රතු සහ කහ මැණික් වැනි වටිනා ගල් වර්ග වලට හොඳ ඉල්ලුමක් පැවති අතර කොළ තෝරමල්ලි, සිට්‍රින් සහ රෝස තෝරමල්ලි සඳහාද ඉල්ලුම ඒ අයුරින්ම දිගටම පැවතුණි. ටැන්සානියාව, වියට්නාමය, විශේෂයෙන්ම මැඩගස්කරය වැනි රට වලින් ලෝක වෙළඳපොළට ශ්‍රී ලංකාවෙන් ඉදිරිපත් කරන ලද සියළුම වර්ගවල නිෂ්පාදන ඉදිරිපත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවට මැණික් සඳහා තියුණු තරඟයකට මුහුණ දීමට සිදු වී ඇත. ස්වභාවික මිනිරන් අපනයන ඉපැයීම් පහත වැටීමේ හේතුවෙන් අනෙකුත් ඛනිජ අපනයනයෙන් ලද ආදායම සියයට 32 කින් පහත වැටිණි. කෙසේ වුවද සමස්ත ඛනිජ නිෂ්පාදිතයන්හි අඩු වීම තරමක් දුරට සමනය කරමින් ලෝපස් හා යකඩ පයිරයිට්ස් සහ ඉල්මනයිට් වලින් ලද ඉපැයීම් හය ගුණයකින් වැඩි විය.

## 9.3 ආනයන

1999 වර්ෂයේ ආනයන වියදම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 5,899 ක්ව සියයට 0.2 ක ආන්තික වර්ධනයක් පෙන්නුම් කළේය. මෙම වර්ධනයට ශ්‍රීලංකන් ගුවන් සේවයේ ගුවන්යානා ප්‍රති සම්පාදන වැඩපිළිවෙල යටතේ ආනයනය කරන ලද එ.ජ. ඩොලර් දශ ලක්ෂ 298 ක් වටිනා ගුවන්යානා තුනක වටිනාකමද ඇතුළත් විය. මෙම ගුවන්යානා තුන සඳහා වූ වියදම ඉවත් කළ පසුව ආනයන වියදම 1998 වර්ෂයේ වූ සියයට 8 ක වර්ධනය සමඟ සැසඳීමේදී සියයට 5 කින් පහත වැටිණි. මෙම සෘණ වර්ධනය ආනයන මිල සහ ආනයන පරිමාව යන දෙකම පිළිවෙලින් සියයට 4 කින් හා 1කින් අඩුවීමේ ප්‍රතිඵලයකි. විශේෂයෙන්ම කෘෂිකාර්මික භාණ්ඩ සහ සත්ව නිෂ්පාදනවල සහ (සීනි, තිරිඟු, සහල් සහ කිරි නිෂ්පාදන) අමු ද්‍රව්‍ය යෙදවුම්වල

## 9.4 සංඛ්‍යා සටහන
## ආනයනයන්හි අවසන් උපයෝජනය අනුව වර්ගීකරණය

| | එ.ජ. ඩොලර් දශලක්ෂ | | | | | රුපියල් දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1995 | 1996 | 1997 | 1998(අ) | 1999(ආ) | 1995 | 1996 | 1997 | 1998(අ) | 1999(ආ) |
| 1. පාරිභෝගික භාණ්ඩ | 1,181 | 1,234 | 1,223 | 1,255 | 1,236 | 60,508 | 68,372 | 72,062 | 80,955 | 87,059 |
| ආහාර හා පාන වර්ග | 720 | 801 | 781 | 723 | 655 | 36,901 | 44,377 | 45,996 | 46,543 | 46,116 |
| සහල් | 2 | 91 | 73 | 42 | 46 | 122 | 5,118 | 4,331 | 2,621 | 3,290 |
| සීනි | 170 | 145 | 184 | 129 | 106 | 8,737 | 8,026 | 10,788 | 8,384 | 7,448 |
| තිරිඟු | 198 | 204 | 139 | 127 | 111 | 10,155 | 11,267 | 8,128 | 8,133 | 7,792 |
| වෙනත් | 349 | 361 | 385 | 425 | 392 | 17,887 | 19,966 | 22,749 | 27,405 | 27,586 |
| වෙනත් පාරිභෝගික භාණ්ඩ | 461 | 433 | 442 | 532 | 581 | 23,607 | 23,995 | 26,066 | 34,412 | 40,943 |
| 2. අන්තර් භාණ්ඩ | 2,702 | 2,767 | 3,096 | 2,982 | 2,983 | 138,475 | 153,117 | 182,754 | 192,494 | 210,439 |
| බනිජ තෙල් | 387 | 479 | 539 | 345 | 426 | 19,827 | 26,525 | 31,828 | 22,275 | 30,124 |
| පොහොර (ඇ) | 86 | 76 | 66 | 62 | 66 | 4,406 | 4,189 | 3,916 | 3,989 | 4,690 |
| රසායනික ද්‍රව්‍ය | 143 | 134 | 136 | 143 | 136 | 7,310 | 7,402 | 8,024 | 9,241 | 9,590 |
| රෙදිපිළි හා ඇඟළුම් | 1,159 | 1,168 | 1,386 | 1,397 | 1,320 | 59,375 | 64,601 | 81,816 | 90,099 | 93,105 |
| වෙනත් අන්තර් භාණ්ඩ(ඈ) | 928 | 910 | 969 | 1,035 | 1,034 | 47,557 | 50,400 | 57,170 | 66,890 | 72,929 |
| 3. ආයෝජන භාණ්ඩ | 1,189 | 1,204 | 1,325 | 1,477 | 1,565 | 60,916 | 66,647 | 78,232 | 95,322 | 110,599 |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 503 | 649 | 742 | 786 | 678 | 25,769 | 35,987 | 43,853 | 50,592 | 47,736 |
| ගමනාගමන උපකරණ (ඉ) | 304 | 179 | 208 | 264 | 523 | 15,564 | 9,885 | 12,276 | 17,098 | 37,191 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 272 | 263 | 272 | 303 | 260 | 13,956 | 14,540 | 16,030 | 19,590 | 18,296 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 110 | 113 | 103 | 124 | 105 | 5,627 | 6,235 | 6,073 | 8,042 | 7,376 |
| 4. වර්ග නොකළ ආනයන | 240 | 234 | 220 | 176 | 115 | 12,301 | 12,940 | 12,978 | 11,367 | 8,126 |
| මුළු ආනයන (ඊ) | 5,311 | 5,439 | 5,864 | 5,890 | 5,899 | 272,200 | 301,076 | 346,026 | 380,138 | 416,223 |

(අ) සංශෝධිතයි
(ආ) තාවකාලිකයි
(ඇ) 1997 සිට පොහොර සඳහා වන දත්තයන් පෝහොර සමාගම් හා වෙනත් පොහොර ආනයනකරුවන් වෙනුවට රේගු සංඛ්‍යා උපයෝගී කරගන්නා ලදී.
(ඈ) ශ්‍රී ලංකා රේගුව විසින් සපයන ලද දියමන්ති ආනයනය පිළිබඳ දත්තයන් 1998 හා 1999 වර්ෂයන්හිදී ප්‍රධාන දියමන්ති ආනයනකරුවන්ගෙන් ලබාගත් දත්ත හා ගලපන ලදී.
(ඉ) 1999 දී ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගම විසින් ආනයනය කරන ලද ගුවන්යානා තුනක්ද ඇතුලත්ය.
(ඊ) ගලපන ලදී.

මූලයන් : ශ්‍රී ලංකා රේගුව
සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව
ලංකා පොහොර සමාගම හා වෙනත් පොහොර ආනයනකරුවන්
ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව
ප්‍රධාන දියමන්ති ආනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව

(පොහොර, රෙදිපිළි) ජාත්‍යන්තර මිල ගණන් පහළ වැටීම මෙම අඩු වීමට දායක විය. පාරිභෝගික භාණ්ඩ සඳහා වූ වියදම සියයට 2 කින් පහත වැටුණු අතර, අන්තර් භාණ්ඩ කාණ්ඩයේ වියදම පෙර වසරේ පැවැති මට්ටමෙහිම පැවතිණ. ගුවන්යානා තුන සඳහා වූ වියදම ඇතුළත්ව ආයෝජන භාණ්ඩ වියදම සියයට 6 කින් වැඩි විය. එම ගුවන්යානා තුනෙහි වියදම අත් හල විට 1999 වර්ෂයේ ආයෝජන භාණ්ඩවල වියදම සියයට 14 කින් අඩුවිය. 1999 ප්‍රථම භාගයේ දක්නට ලැබුණු සියයට 13 ක අඩු වීම හා බලනවිට 1999 වසරේ දෙවන භාගයේදී සියයට 14 ක වැඩි වීමක් සහිතව ආනයන වියදමේ සැළකිය යුතු වර්ධනයක් දක්නට ලැබිණි. ආයෝජන භාණ්ඩ (සියයට 30) හා අන්තර් භාණ්ඩ (සියයට 11) විශේෂයෙන්ම රෙදිපිළි, බොර තෙල් හා පිරිපහදු කළ ඛනිජ තෙල් හා දියමන්ති ආනයන වැඩි වීම මෙම වර්ධනයට දායක විය. කෙසේ වෙතත් 1999 දෙවන භාගයේ ආයෝජන භාණ්ඩ ආනයනය වැඩි වීමට මුළුමණින්ම හේතු වූයේ ගුවන්යානා තුනක් ආනයනය කිරීමය.

### ආනයන ව්‍යුහය

1977 ආර්ථික ප්‍රතිපත්ති ලිහිල් වීමත් සමග පසුගිය දශක දෙක තුළදී ආනයන ව්‍යුහය විශේෂයෙන්ම අන්තර් භාණ්ඩ හා ආයෝජන භාණ්ඩ වෙත යොමු වීමක් දකිය හැක. සහල් සහ අනෙකුත් ආහාර ද්‍රව්‍යවල දේශීය සැපයුම වර්ධනය වීම ආහාර ද්‍රව්‍ය ආනයන පිරිවැය අඩු වීමට උපකාරි වූවා විය හැක. මේ අතර කාර්මික අංශය ප්‍රසාරණය වීමත් සමග අන්තර් භාණ්ඩ ආනයනය ඉහළ ගියේය. යටිතල පහසුකම්, ප්‍රවාහන හා ඉදි කිරීම් කටයුතු දියුණු වීමත් හා නවීන තාක්ෂණය උපයෝගී කර ගැනීම වැඩි වීමත්, හේතුවෙන් ආයෝජන භාණ්ඩ ආනයනය ඉහළ ගියේය. 1977 දී මුළු ආනයන ප්‍රමාණයෙන් සියයට 42 ක් වූ පාරිභෝගික භාණ්ඩ ආනයනය 1999 දී සියයට 21 ක් දක්වා පහළ වැටිණි. මෙම කාලපරිච්ඡේදය තුළදී ආයෝජන භාණ්ඩවල දායකත්වය සියයට 12 සිට සියයට 27 දක්වා ඉහළ ගිය අතර අන්තර් භාණ්ඩවල දායකත්වය සියයට 44 සිට සියයට 51 දක්වා ඉහළ ගියේය.

## පාරිභෝගික භාණ්ඩ

කල් පවත්නා පාරිභෝගික භාණ්ඩ කාණ්ඩයේ වියදම් ඉහළ යෑමෙන් ඇති වූ බලපෑම ආහාර හා පාන කාණ්ඩයේ ආනයන අඩු වීම මගින් යටපත් කිරීමේ හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ වියදම සියයට 2 කින් අඩු විය. ප්‍රධාන ආහාර ද්‍රව්‍යවල ජාත්‍යන්තර මිල ගණන් පහළ යාම ආහාර හා පාන වර්ගවල ආනයන වියදම් පහළ යාමට හේතු විය. සීනි ආනයන වියදම සියයට 18 කින් අඩු වූ අතර පහත වැටුණු ආනයන ප්‍රමාණය හා මිල ගණන් හේතුකොට ගෙන තිරිඟු සහ ධාන්‍ය ආනයනය සියයට 13 කින් අඩු විය. දේශීය වී නිෂ්පාදනය (මෙට්‍රික් ටොන් 2,868,000 ක්ව) යහපත් තත්ත්වයක තිබියදීත් සහල් ආනයනය (මෙට්‍රික් ටොන් 241,200 ක්) සියයට 28 කින් ඉහළ ගියේය. සහල් සඳහා වූ ආනයන තීරු බද්ද 1999 ඔක්තෝබර් 22 වනදා සිට 1999 දෙසැම්බර් 31 දක්වා වූ කාලය සඳහා සියයට 35 සිට සියයට 10 දක්වා අඩු කරමින් රජය සියයට 25 ක තීරු බදු අත් හැරීමක් ප්‍රකාශයට පත් කළේය. මුළු සහල් ආනයන ප්‍රමාණයෙන් සියයට 66 කට වඩා ප්‍රමාණයක් මෙම කාලපරිච්ඡේදය තුළ ආනයනය කරන ලදී. තිරිඟු ආනයන ප්‍රමාණය මෙ.ටො. 659,000 ක්ව සියයට 2 කින් පහළ ගිය අතර එය සහල් ආදේශනයෙන් ඇති වූ ප්‍රථපලයන් විය හැක. අනිකුත් ආහාර ද්‍රව්‍ය අතර කිරි නිෂ්පාදන, වියළි හා අනෙකුත් මත්ස්‍ය නිෂ්පාදන, මෝල්ට්, රස කැවිලි, සුදු ළූනු, කඩල, පීස් සහ කහ ආනයනයන්ගේ පහත වැටීමක් වාර්තා විය.

කල් පවත්නා පාරිභෝගික භාණ්ඩ කාණ්ඩයේ මෝටර් කාර් හා මෝටර් බයිසිකල් ආනයනය සියයට 37 කින් ඉහළ ගිය අතර මෙයට බොහෝදුරට හේතු වූයේ රාජ්‍ය අංශයේ සේවකයන්ට මෝටර් රථ ආනයනය කිරීමේදී ප්‍රදානය කළ අර්ධ බදු අත් හැරීමයි. රූපවාහිනී යන්ත්‍ර හා ගුවන් විදුලි යන්ත්‍ර ආනයනය සියයට 66 ක වර්ධනයක් පෙන්වීය. මෙම වර්ධනයට වැඩි වශයෙන් දයක වූයේ වර්ණ රූපවාහිනී යන්ත්‍ර හා ශබ්ද තැටිගත කිරීමේ යන්ත්‍ර ආනයනය වැඩි වීමය. පහළ ගිය මිල ගණන් හා ප්‍රමාණයන් පිළිබිඹු කරමින් බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත ආනයන සියයට 9 කින් පහත වැටිණි. විදුලිමය ගෘහ උපකරණ, ප්‍රදීපන

**9.5 සංඛ්‍යා සටහන**
**ප්‍රධාන ආනයනයන්හි ප්‍රමාණ (අ)**

මෙ.ටො. දහස්

| ශීර්ෂය | 1995 | 1996 | 1997 | 1998 | 1999(ආ) |
|---|---|---|---|---|---|
| සහල් | 9 | 341 | 306 | 168 | 214 |
| 1 වන කාර්තුව | 8 | 1 | 104 | 136 | 24 |
| 2 වන කාර්තුව | ... | 23 | 9 | 12 | 13 |
| 3 වන කාර්තුව | ... | 117 | 12 | 2 | 31 |
| 4 වන කාර්තුව | 1 | 201 | 181 | 18 | 146 |
| තිරිඟු | 1,057 | 913 | 789 | 880 | 859 |
| 1 වන කාර්තුව | 315 | 201 | 302 | 340 | 207 |
| 2 වන කාර්තුව | 213 | 303 | 172 | 155 | 263 |
| 3 වන කාර්තුව | 323 | 157 | 168 | 126 | 189 |
| 4 වන කාර්තුව | 206 | 252 | 147 | 259 | 200 |
| සීනි | 417 | 381 | 545 | 444 | 479 |
| 1 වන කාර්තුව | 133 | 94 | 176 | 79 | 152 |
| 2 වන කාර්තුව | 76 | 84 | 163 | 129 | 64 |
| 3 වන කාර්තුව | 95 | 58 | 83 | 99 | 138 |
| 4 වන කාර්තුව | 113 | 146 | 123 | 137 | 125 |
| ඛනිජතෙල් (බොර තෙල්) | 1,860 | 2,033 | 1,814 | 2156 | 1832 |
| 1 වන කාර්තුව | 332 | 566 | 299 | 567 | 244 |
| 2 වන කාර්තුව | 452 | 493 | 389 | 431 | 503 |
| 3 වන කාර්තුව | 584 | 466 | 606 | 662 | 548 |
| 4 වන කාර්තුව | 492 | 508 | 520 | 496 | 537 |
| පොහොර | 452 | 361 | 391 | 440 | 539 |
| 1 වන කාර්තුව | 185 | 104 | 56 | 109 | 97 |
| 2 වන කාර්තුව | 97 | 60 | 87 | 98 | 158 |
| 3 වන කාර්තුව | 56 | 53 | 87 | 82 | 129 |
| 4 වන කාර්තුව | 115 | 144 | 161 | 151 | 155 |

(අ) ගලපන ලදී
(ආ) තාවකාලිකයි

මූලයන් : ශ්‍රී ලංකා රේගුව
සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව
ලංකා පොහොර සමාගම හා
වෙනත් පොහොර ආනයනකරුවෝ
ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව

පහන්, විදුලි උපාංග සහ රබර් ටයර් සහ ටියුබ් ආනයනය 1999 වසරේදී ඉහළ යාම වාර්තා කල අනෙකුත් කල් පවත්නා පාරිභෝගික භාණ්ඩ වර්ග අතර විය.

## අන්තර් භාණ්ඩ

ආනයන පරිමාවේ පැවති වර්ධනය යටපත් කරමින් ජාත්‍යන්තර මිල ගණන් විශාල වශයෙන් අඩු වීම හේතුවෙන් අන්තර් භාණ්ඩ ආනයන සඳහා වූ වියදම සියයට 1 කින් පහත වැටිණි. අන්තර් භාණ්ඩ වලින් සියයට 46 කට දායක වූ රෙදිපිළි කාණ්ඩයෙහි ආනයන වියදම මිළ ගණන් පහළ යාම නිසා සියයට 6 කින් පහළ ගියේය. බනිජ තෙල් ආනයන පරිමාව මෙට්‍රික් ටොන් දහස් 2,156 සිට මෙට්‍රික් ටොන් දහස් 1,832 දක්වා අඩු වුවද, බොර තෙල් බැරලයක සාමාන්‍ය මිල එ.ජ.ඩොලර් 13.47 සිට එ.ජ.ඩොලර් 19.06 දක්වා වැඩි වීම හේතුවෙන් බොර තෙල් ආනයන වියදම සියයට 19 කින් වැඩි විය. නඩත්තු කටයුතු සඳහා තෙල් පිරිපහදුව වසා දැමීම නිසා බොර තෙල් ආනයන පහත වැටිණි. තෙල් පිරිපහදුව වසා දැමීම නිසා ඇති වූ අතිරේක ඉල්ලුමට සරිලන පරිදි වැඩි බනිජ තෙල් ප්‍රමාණයක් ආනයන කිරීම හේතුවෙන් අනෙකුත් බනිජ තෙල් නිෂ්පාදන සියයට 31 කින් ඉහළ ගියේය. දියමන්ති සහ ස්වර්ණාභරණ කර්මාන්තය යථා තත්ත්වයට පැමිණි බව පිළිබිඹු කරමින් දියමන්ති ආනයනය සියයට 28 කින් ඉහළ ගියේය. එමෙන්ම සබන්, ඇඟළුම්, සත්ව ආහාර හා රබර් මත පදනම් වූ නිෂ්පාදන කර්මාන්ත සඳහා වූ යෙදවුම්වල ආනයන අඩු වීම හේතුවෙන් අනෙකුත් අන්තර් භාණ්ඩ ආනයනය සියයට 4 කින් පහළ ගියේය. කෙසේ වුවද, 1999 වර්ෂයේ අවසාන කාර්තුවේදී කර්මාන්ත අංශය යථා තත්ත්වයට පත් වීම පිළිබිඹු කරමින් අන්තර් භාණ්ඩ ආනයනය අවුරුද්දේ දෙවන භාගයේදී සියයට 11 ක වාර්තාගත මට්ටමකින් ඉහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ

1999 දී ආයෝජන භාණ්ඩ ආනයනය සියයට 6 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, සියළුම ප්‍රධාන ආයෝජන භාණ්ඩ කාණ්ඩයන්ගේ අඩු වීම පිළිබිඹු කරමින් ගුවන්යානා සඳහා වූ වියදම අඩු කළ පසු ආයෝජන භාණ්ඩ වියදම සියයට 14 කින් අඩු විය. ආයෝජන භාණ්ඩ ආනයනය අඩු වීමට හේතු වූයේ ආනයන ප්‍රමාණය සහ ජාත්‍යන්තර මිල ගණන් අඩු වීමයි. 1998 වසරේ අය වැය යෝජනා මගින් කෘෂිකර්මය, ගමනා ගමන, රෙදිපිළි හා ඇඟළුම් සහ විදුලි සංදේශ සේවාවන් සඳහා ඉදිරිපත් කළ දිරි ගැන්වීම් සමූහය සඳහා දක්වූ ක්ෂණික ප්‍රතිචාරය හේතුවෙන් වර්ධනය වූ ඉහල ආනයන පිරිවැය හා සසඳන කල 1999 ප්‍රථම මාස 8 තුළදී ආයෝජන භාණ්ඩ වල තියුණු පහත වැටීමක් පෙන්නුම් කලේය. යන්ත්‍රසූත්‍ර හා උපකරණ අංශයෙහි, විශේෂයෙන්ම රෙදිපිළි කර්මාන්තයට අවශ්‍ය රෙදි සෝදන යන්ත්‍ර අමතර කොටස්, ට්‍රැක්ටර් විදුලි සංදේශ හා ඉදි කිරීම් අංශයන්හි විශේෂයෙන්ම සියයට 14ක අඩු වීමක් වාර්තා විය. එසේම ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහණ උපකරණ ආනයනය (ගුවන්යානා හැර) පිළිවෙලින් සියයට 14 ක් සහ 15 කින් පහත වැටිණි.

## වෙළඳ දිසාව

1999 වර්ෂයේදී ඇමෙරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ ප්‍රධාන ගැණුම්කරු වශයෙන් තවදුරටත් පැවතිණි. ඇමෙරිකා එක්සත් ජනපදයට හිමිව තිබූ වෙළඳපොළ කොටස (සියයට 40) පෙර වසරේ තත්ත්වයෙන්ම නොවෙනස්ව පැවතිණි. ඇමෙරිකා එක්සත් ජනපදය අපනයනය කරන ලද ඇඟළුම් ප්‍රමාණය මුළු අපනයනයෙන් සියයට 74 ක් විය. කෙසේ නමුදු ඇමෙරිකා එක්සත් ජනපදය අපනයනය කරන ලද ඇඟළුම් ප්‍රමාණය වර්ෂය තුළදී සියයට 6 කින් අඩු විය. දෙවන ප්‍රධාන ගැණුම්කරුවා වන එක්සත් රාජධානිය සියයට 13 ට දායක විය. මේ අතර 1998 වසරේදී ජර්මනිය, ජපානය අභිබවමින් හිමි කර ගත් තත්ත්වය නොකඩවා ආරක්ෂා කර ගනිමින් ශ්‍රී ලංකාවෙහි මුළු අපනයනයෙන් සියයට 5 කට දායක වෙමින් තෙවන ස්ථානය හිමි කර ගත්තේය. මෙම තත්ත්වයට හේතු වූයේ ඉහළ ගිය ඇගළුම් අපනයනයයි. එහි ප්‍රතිඵලයක් වශයෙන් 1998 වසරේදී කාර්මික රටවල් සියල්ල එක්ව මුළු අපනයනයෙන් සියයට 74 කට දායක වූ අතර 1999 වසරේදී එහි දායකත්වය සියයට 75 ක් විය. කෙසේ නමුදු මැද පෙරදිගට කරන ලද අපනයනය සියයට 7 කින් අඩු වුවද 1998 වර්ෂයේදී බලපවත්වන ලද අර්බුදකාරී තත්ත්වය යථා තත්ත්වයට පත්වීමත් සමඟ නැගෙනහිර ආසියානු කලාපයට කරන ලද අපනයන (සියයට 9) වැඩි වීම නිසා දියුණු වෙමින් පවතින රටවලට කරන ලද අපනයන වටිනාකම පෙර වසරේ පැවති සියයට 21 මට්ටමෙහි පවත්වා ගැනීමට උපකාරී විය. රුසියාවට අපනයනය කරන ලද තේ ප්‍රමාණය අඩු වීම නිසා ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවලට කරන ලද අපනයනය සියයට 27 කින් අඩු විය. බටහිර කාර්මික රටවල් නොකඩවාම ශ්‍රී ලංකාවෙහි ප්‍රධාන වෙළඳ හවුල් කරු බවට පත් විය.

ජපානය සිය තත්ත්වය ආරක්ෂා කර ගනිමින් 1999 වසරේදී ශ්‍රී ලංකාවෙහි විශාලම තනි සැපයුම්කරු බවට පත් විය. මෝටර් රථ, අමතර කොටස් හා රෙදිපිළි ජපානයෙන් ආනයනය කරන ලද ප්‍රධාන භාණ්ඩ විය. ඉන්දියාව ශ්‍රී ලංකාවට භාණ්ඩ අපනයන කල දෙවන ප්‍රධාන රට වූ අතර පිළිවෙලින් සිංගප්පූරුව, කොරියානු ජනරජය තායිවානය, එක්සත් රාජධානිය ඊලඟ ස්ථාන හිමිකර ගත්හ. ජපානයෙන් කරන ලද ආනයනය සියයට 1 කින් වැඩි විමට හේතු වූයේ මෝටර් රථ ආනයනය ඉහළ යාමය. කාර්මික රටවල වෙළඳපොළ දායකත්වය සියයට 37 සිට සියයට 36 දක්වා අඩු කරමින් ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය යන රට වලින් කරන ලද ආනයනයන් පිළිවෙලින් සියයට 18 කින් හා සියයට 6 කින් අඩු විය. මිල අඩු වීම මෙම රට වලින් කරන ලද ආනයනයන් අඩු වීමට බෙහෙවින් දායක විය. තිරිඟු, රත්රන්, කෘෂිකාර්මික උපකරණ, සීනි, රෙදිපිළි එක්සත් රාජධානියෙන් ආනයනය කරන ලද ප්‍රධාන භාණ්ඩ වන අතර ඇමෙරිකා එක්සත්

ජනපදයෙන් කරන ලද ආනයනයන් අතුරෙන් තිරිඟු සියයට 31 ක් ප්‍රමාණයක් හිමි කර ගත්තේය. රෙදිපිළි, ඇඟළුම් කර්මාන්තය සඳහා අවශ්‍ය මෙවලම් හා උපාංග සහ පළතුරු ඇමෙරිකා එක්සත් ජනපදයෙන් ආනයනය කරන ලද ප්‍රධාන භාණ්ඩ වේ.

සංවර්ධනය වෙමින් පවතින රටවල් අතුරින් ආසියානු රටවල වෙළඳපොළ දායකත්වය 1998 දී සියයට 84 සිට 1999 දී සියයට 85 දක්වා වැඩි විය. වර්ෂයේ ප්‍රථම භාගය තුළ නැගෙනහිර ආසියානු රටවල ව්‍යවහාර මුදල් සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීම නිසා මෙම රට වලින් කරන ලද ආනයන පිරිවැය මඳ වශයෙන් අඩු විය. පරිප්පු, සහල්, වියලි මිරිස්, ලොකු ළූණු, ත්‍රීරෝද රථ, වෙනත් මෝටර් රථ, සාරි හා බීඩි කොළ ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් ආනයනය කරනු ලබන භාණ්ඩ අතුරෙන් ප්‍රධාන තැනක් ගනු ලබයි. සිංගප්පූරුව, කොරියානු ජනරජය සහ තායිවානය යන රට වලින් ශ්‍රී ලංකාව විදුලිමය උපකරණ ආනයනය කරනු ලබයි. මැද පෙරදිග රට වලින් කරනු ලබන ආනයනයන් සියයට 6 කින් අඩු වූ අතර වෙළඳපොළ දායකත්වය පෙර වසර තත්ත්වයෙන් නොවෙනස්ව පැවතිණි.

## 9.4 සේවා සහ ආදායම්

වසර තුළ සේවා ගිණුම ඉතා සුළු වශයෙන් වැඩි දියුණු විය. සේවා ගෙවීම් සියයට 6 කින් ඉහළ ගිය අතර සේවා ලැබීම්ද එයට සමානවම වැඩිවීම නිසා සේවා ගිණුමේ ශුද්ධ අතිරික්තය එ.ජ. ඩොලර් දශ ලක්ෂ 147 ක් දක්වා සියයට 1 කින් පමණ ඉහළ නැගුණි. 1999 වසරේ සංචාරක පැමිණීම්වල දක්නට ලැබුණු කැපී පෙනෙන ඉහළ යාම පිළිබිඹු කරමින් සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 274 ක් දක්වා සියයට 19 කින් ඉහළ යාම සේවා ලැබීම් වර්ධනය වීමට ප්‍රධාන වශයෙන්ම හේතු විය. ප්‍රවාහන වියදම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 281 ක් දක්වා සියයට 7 කින් ඉහළ යාම සේවා ගෙවීම් ඉහළ යාමට ප්‍රධාන වශයෙන්ම හේතු විය. සළකා බලන වසර තුළ සංචාරක ගෙවීම් සියයට 9 කින් වැඩි විය. වරාය ආශ්‍රිත සේවාවන්ගෙන් වූ ශුද්ධ ලැබීම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 131 ක් දක්වා සියයට 10 කින් අඩු වූ අතර එය ප්‍රවාහන සේවාවන්හි ශුද්ධ ලැබීම්වල සමස්ත අගය සියයට 13 කින් පහළ යාමට ප්‍රධාන වශයෙන් දායක විය. අනෙකුත් ව්‍යාපාරික සේවාවන් සහ නැව් ගාස්තු සේවාවන් සළකා බලන වසර තුළ ශුද්ධ ගලායාම් වශයෙන් තවදුරටත් පැවතුණි.

අඩු වත්කම් පදනමත්, ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපළවල්වල පැවති අඩු පොලී අනුපාතත් හේතුවෙන් ප්‍රධාන වශයෙන් පොලී ආදායම් පහළ යාම නිසා ආදායම් ගිණුමේ හිඟය 1999 වසරේ තවදුරටත් එ.ජ. ඩොලර් දශලක්ෂ 253 ක් දක්වා පුළුල් විය. විදේශ විනිමය සංචිත මත වූ ආයෝජන ආදායම් ලැබීම් වසර තුළදී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 153 ක් දක්වා සියයට 23 කින් අඩු වූ අතර විදේශ වගකීම් මත වූ පොලී ගෙවීම් සියයට 2 කින් වැඩි විය. ලාභ හා ලාභාංශ ගෙවීම් වශයෙන් වූ පිටතට ගලායාම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 109 ක් දක්වා සියයට 23 කින් ඉහළ නැගුණි.

**9.6 සංඛ්‍යා සටහන**
**ශුද්ධ සේවා, ආදායම් සහ සංක්‍රාම(අ)**

| ශීර්ෂය | එ.ජ.ඩො.දශලක්ෂ | | රුපියල් දශලක්ෂ | |
|---|---|---|---|---|
| | 1998 | 1999(ආ) | 1998 | 1999(ආ) |
| 1. ප්‍රවාහනය | 139 | 121 | 8,935 | 8,564 |
| 2. සංචාරක | 28 | 55 | 1,826 | 3,888 |
| 3. රක්ෂණ සේවා | 16 | 17 | 1,011 | 1,206 |
| 4. වෙනත් ව්‍යාපාරික සේවා | -29 | -47 | -1,889 | -3,282 |
| 5. රජයේ වියදම් (අන්තැනක සඳහන් නොවන) | -9 | 141 | -583 | -38 |
| මුළු සේවා | 145 | 147 | 9,300 | 10,337 |
| 1. සේවක ගෙවීම් | -2 | -2 | -99 | -112 |
| 2. සෘජු ආයෝජන ආදායම් | -89 | -109 | -5,747 | -7,693 |
| 3. පොලී සහ අනෙකුත් ගෙවීම්(ඇ) | -89 | -143 | -5,709 | -10,008 |
| මුළු ආදායම් | -180 | -253 | -11,556 | -17,813 |
| 1. පෞද්ගලික (ඈ) | 848 | 887 | 54,843 | 62,472 |
| 2. මහ ආණ්ඩුව | 52 | 24 | 3,359 | 1,690 |
| මුළු ජංගම සංක්‍රාම | 901 | 911 | 58,202 | 64,162 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) මෙම ඉදිරිපත් කිරීම ගෙවුම් තුලන අත්පොතෙහි 5 වන සංශෝධනයට (1993) අනුරූපව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් ජාත්‍යන්තරව අනුගමනය කරන ආකාරයට සැසඳෙන ලෙස ඉදිරිපත් කර ඇත.
(ආ) තාවකාලිකයි.
(ඇ) 1994 සිට, ගෙවුම් ශේෂ දත්තයන් සකස් කිරීමේදී වාණිජ බැංකු සතු විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක දේශීය බැංකු ක්‍රමයේ කොටසක් ලෙස සලකන ලදී. ඒ අනුව අනේවාසිකයින් සතු විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක පමණක් ගෙවුම් තුලන දත්ත සැකසීමේදී අදළ කරගනු ලබන අතර, නේවාසිකයින් සතු විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකක අදළ කරගනු නොලැබේ.
(ඈ) 1990 ගල්ෆ් යුද්ධය නිසා ක්වේටයේ රැකියා අහිමි වූ ශ්‍රී ලාංකිකයන්ට වන්දි වශයෙන් එක් අයෙකුට එ.ජ.ඩොලර් 2,500 බැගින් 1997, 1998 හා 1999 වසර වලදී පිළිවෙලින් 26,101ක්, 31,279 ක් සහ 37,343 දෙනෙකු සඳහා ලැබුණු එ.ජ.ඩොලර් දශලක්ෂ 64, එ.ජ.ඩොලර් දශලක්ෂ 78 හා එ.ජ.ඩොලර් දශලක්ෂ 85 ක්ද මෙහි අඩංගුය. ඊට අමතරව 1999 දෙවන වටයේ වන්දි වශයෙන් එක් අයෙකුට එ.ජ.ඩොලර් 1,500 බැගින් 18,244 දෙනෙකු සඳහා ලැබුණු එ.ජ.ඩොලර් දශලක්ෂ 27 ක්ද මෙහි අඩංගුය.

## 9.5 ජංගම සංක්‍රාම

1999 වසර තුළදී, ශුද්ධ ජංගම සංක්‍රාම එ.ජ. ඩොලර් දශ ලක්ෂ 911 ක් දක්වා ඉතා සුළු වශයෙන් සියයට 1 කින් වැඩි විය. පෞද්ගලික සංක්‍රාම ලැබීම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 1,056 ක් දක්වා සියයට 6 කින් ඉහළ යාමට මුළුමණින්ම හේතු වූයේ, එ.ජ. ඩොලර් දශ ලක්ෂ 112 ක් දක්වා ඉහළ නැගුණ ගල්ෆ් යුද්ධය පැවති අවදියේ අවතැන් වූ ක්වේට්හි සේවය කළ අය සඳහා ලත් වන්දි ලැබීමය. මෙම වන්දි ලැබීම් 1998 වසරේ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 78 ක් විය. එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් ලත් මෙම විශේෂිත වන්දි මුදල් අත්හැර ගණනය කළවිට දළ පෞද්ගලික සංක්‍රාම එ.ජ. ඩොලර් දශ ලක්ෂ 921 සිට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 943 ක් දක්වා සියයට 2 ක වැඩි වීමක් පෙන්නුම් කරයි. 1999 වසරේ භාණ්ඩ, සේවා සහ ආදායම් ගිණුම්වල හිඟයෙන්


සියයට 63 ක් පියවා ගැනීමට ශුද්ධ පෞද්ගලික සංක්‍රාම ලැබීම් ප්‍රමාණවත් විය. මේ අතර, ආහාර සහ ද්‍රව්‍ය ආධාර වලින් සමන්විත වූ නිල ශුද්ධ සංක්‍රාම ලැබීම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 52 සිට 1999 වසරේ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 24 ක් දක්වා පහත වැටුණි.

## 9.6 ප්‍රාග්ධන සංචලන

ආසියානු මූල්‍ය අර්බුදයේ පසුවිපාක වශයෙන් නැගී එමින් පැවති වෙළඳපළ ආර්ථිකයන් වෙතට වූ ප්‍රාග්ධන ගලා ඒම්වල සාමාන්‍ය අඩු වීමත්, ඒ හා බැඳුනු අවදානම් පිළිබඳ සාධකයන්හි බලපෑමත් 1999 වසරේ ශ්‍රී ලංකාවට වූ ප්‍රාග්ධන ගලාඒම් වල පිළිබිඹු වේ. ජපානය වැනි ප්‍රධාන ආධාර ලබා දෙන රටවල ආර්ථිකයන්හි පැවති ප්‍රශ්න හේතුකොටගෙන ලබා දෙන ආධාර ප්‍රමාණය අඩු කිරීම මෙම තත්ත්වය තවදුරටත් තීව්‍ර කිරීමට හේතු විය.

ශුද්ධ ප්‍රාග්ධන සංක්‍රාම එ.ජ. ඩොලර් දශ ලක්ෂ 80 සිට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 75 දක්වා අඩු වීමත්, ශුද්ධ මූල්‍ය ගලා ඒම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 334 සිට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 255 දක්වා අඩු වීමත් හේතුවෙන් ශුද්ධ ප්‍රාග්ධන සහ මූල්‍ය ගලා ඒම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 413 සිට 1999 වසරේ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 330 ක් දක්වා කැපී පෙනෙන අඩු වීමක් වාර්තා කළේය. මෙහි ප්‍රතිඵලයක් ලෙස සමස්ත ගෙවුම් තුලනය 1998 දී පැවති එ.ජ. ඩොලර් දශ ලක්ෂ 37 ක අතිරික්තයක සිට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 263 ක හිඟයක් බවට පත් විය.

9.5 රූප සටහන
ප්‍රාග්ධන ගලාඒම්




සටහන :ගෙවුම් තුලන අත්පොතේ 4 වැනි සංස්කරණයේ සිට 5 වන සංස්කරණයට වෙනස්වීමත් සමග මීට ඉහතදී ජංගම ගිණුමේ ඇතුලත් කරන ලද පෞද්ගලික සහ රජයේ ප්‍රාග්ධන සංක්‍රාම දිගුකාලීන ප්‍රාග්ධන ගලාඒම් ලෙසත්, මීට ඉහතදී මූල්‍ය අංශයේ ඇතුලත් කරන ලද වාණිජ බැංකුවල වත්කම් සහ වගකීම්වල වෙනස්වීම් කෙටිකාලීන ප්‍රාග්ධන ගලාඒම් ලෙසත් වර්ගීකරණය කර ඇත.

1994 සිට විදෙශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (වි.ව්‍ය.මු.බැ.ඒ.) දේශීය බැංකු ක්‍රමයේ කොටසක් ලෙස සලකන ලදී.

### ප්‍රාග්ධන සංක්‍රාම

1999 දී ශුද්ධ ප්‍රාග්ධන සංක්‍රාම එ.ජ. ඩොලර් දශ ලක්ෂ 75 ක් දක්වා සියයට 6 කින් පහළ වැටුණි. නිල යෝජනා ක්‍රම ආධාර එ.ජ. ඩොලර් දශ ලක්ෂ 72 ක් දක්වා සියයට 3 කින් පහළ වැටුන අතර ශුද්ධ පෞද්ගලික ප්‍රාග්ධන සංක්‍රාම එ.ජ. ඩොලර් දශ ලක්ෂ 3 ක්ව පැවතුණි. වසර තුළ ලත් මුළු ආධාර වලින් සියයට 50 කට දායක වෙමින් ජපානය තවදුරටත් ශ්‍රී ලංකාවට ආධාර ලබා දෙන ප්‍රධාන රට වශයෙන් පැවතුණි.

### දිගුකාලීන ප්‍රාග්ධනය

ජාත්‍යන්තර ආර්ථික සහ මූල්‍ය වාතාවරණයේ අස්ථායීතාවක් පැවතියද පෞද්ගලික දිගුකාලීන ශුද්ධ ප්‍රාග්ධන ගලාඒම් 1998 දී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 195 සිට 1999 දී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 366 ක් දක්වා කැපී පෙනෙන ලෙස ඉහළ යාමට හේතු වූයේ පෞද්ගලික අංශයේ දිගුකාලීන ණය ගැනීම් ඉහළ යාමත්, විදේශීය සෘජු ආයෝජන ගලා ඒම් වැඩි වීමත්ය. පෞද්ගලික අංශයේ දිගුකාලීන ප්‍රාග්ධනය වැඩි වීම ප්‍රධාන වශයෙන්ම පිලබිඹු වූයේ ශ්‍රී ලංකා ගුවන් සේවය, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සහ ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙතට වූ ණය ප්‍රාග්ධනය තුළිනි.

ශ්‍රී ලංකා ගුවන් සේවයේ ණය ප්‍රාග්ධනය වූ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 290 වැය කළේ එහි මධ්‍යකාලීන ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙල යටතේ ගුවන්යානා තුනක් මිලට ගැනීම සඳහාය. වසර 2000 දී තවත් ගුවන්යානා හයක් මිලට ගැනීම මගින් මෙම වැඩපිළිවෙල තවදුරටත් පුළුල් කිරීමට අපේක්ෂා කෙරේ. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මගින් වසර තුළදී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 19 ක ණය ගැනීම් සිදු කරන ලද අතර එය යොදවනු ලැබුවේ එහි දුරකථන සේවා පද්ධතිය වැඩි දියුණු කිරීමට සහ තවදුරටත් පුළුල් කිරීම සඳහාය. මේ අතර ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබුණු එ.ජ. ඩොලර් දශ ලක්ෂ 5, ඒ යටතේ ක්‍රියාත්මක වන සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායක යෝජනා ක්‍රම මූල්‍යයන කිරීම සඳහා යෙදවීය.

වසර තුළ ආසියානු කලාපයෙන් විදේශීය ශුද්ධ ප්‍රාග්ධනය පිටතට ඇදී යන තත්ත්වයක් පැවතියදී පවා ශ්‍රී ලංකාවට වූ විදේශීය සෘජු ආයෝජන එ.ජ. ඩොලර් දශ ලක්ෂ 202 ක් දක්වා සියයට 34 කින් ඉහළ යාම සුවිශේෂ කරුණකි. වසර තුළ විදේශීය සෘජු ආයෝජන ගලා ඒම් වලින් වැඩිම කොටසකට දායක වූයේ විදුලි සංදේශ සේවා (සියයට 32), බලශක්ති (සියයට 18), අනිකුත් කාර්මික අංශය (සියයට 17), ඇඟළුම් (සියයට 6) සහ වරාය ආශ්‍රිත සේවා (සියයට 5) යන අංශයන්ය. මේ අතර විදේශීය සෘජු ආයෝජන පිටතට ගලා යාම් 1998 එ.ජ. ඩොලර් දශ ලක්ෂ 13 සිට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 24 ක් දක්වා ඉහළ ගිය අතර මෙම ඉහළ යාම ප්‍රධාන වශයෙන්ම පිළිබිඹු වූයේ දේශීය ව්‍යවසායකයන් විසින් ඉන්දුනීසියාවේ පාම්

ඔයිල් වගා ව්‍යාපෘතිය, මාල දිවයිනෙහි හෝටල් ව්‍යාපෘතිය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ඇඟළුම් නිෂ්පාදිත කම්හල සඳහා යොදවන ලද සෘජු ආයෝජනවලය.

මේ අතර රජයට වූ දිගුකාලීන ප්‍රාග්ධන ගලා ඒම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 493 සිට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 350 දක්වා කැපී පෙනෙන ලෙස අඩු විය. සමහර යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේලා පැවති තාවකාලික ප්‍රමාදයන්, දියුණු වෙමින් පවතින රටවලට සමස්ත වශයෙන් ගලා ආ ආධාර ප්‍රවාහයේ සාමාන්‍ය පහළ යාම සහ සහනදායී නොවන ණය ප්‍රාග්ධන ලැබීම් පහළ යාම මෙයට හේතු විය. වසර තුළ ලැබුණු සහනදායී ණය වලින් බහුතරය යෙදවූයේ බලශක්ති උත්පාදනය, මාර්ග සංවර්ධනය, ජල සම්පත් සංවර්ධනය, සෞඛ්‍යය, විදුලි සංදේශ සහ ග්‍රාමීය සංවර්ධනය යන අංශ සඳහාය. වසර තුළ බහු ජාතික සමාගම් විසින් මූල්‍යයනය කළ ප්‍රධාන යෝජනා ක්‍රම වූයේ දෙවන බලශක්ති ක්‍රමය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය (එ.ජ. ඩොලර් දශ ලක්ෂ 17), වතු වැවිලි යලි නගාලීමේ යෝජනා ක්‍රමය (එ.ජ. ඩොලර් දශ ලක්ෂ 16), ඛනිජ තෙල් සැපයුම් හදිසි ප්‍රතිශ්ඨාපන යෝජනා ක්‍රමය (එ.ජ. ඩොලර් දශ ලක්ෂ 9) සහ ආසියානු සංවර්ධන බැංකුව මගින් මූල්‍යනය කළ තෙවැනි මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (එ.ජ. ඩොලර් දශ ලක්ෂ 8), ගුරු අධ්‍යාපනය සහ ගුරු සේවය නංවාලීමේ ව්‍යාපෘතිය (එ.ජ. ඩොලර් දශ ලක්ෂ 11) සහ ජාත්‍යන්තර සංවර්ධන ආයතනය විසින් මූල්‍යනය කළ වසර 2000 හදිසි ආධාර යෝජනා ක්‍රමය (එ.ජ. ඩොලර් දශ ලක්ෂ 8) ආදියයි. මේ අතර ද්විපාර්ශවීය ආධාර ලබා දෙන්නන් විසින් මූල්‍යනය කළ ප්‍රධාන ව්‍යාපෘතීන් වූයේ ප්‍රාදේශීය විදුලි සංදේශ සංවර්ධන ව්‍යාපෘතිය (එ.ජ. ඩොලර් දශ ලක්ෂ 23), කුකුලේ ගඟ ජල විදුලිබල යෝජනා ක්‍රමය (එ.ජ. ඩොලර් දශ ලක්ෂ 17), මහ කොළඹ ටෙලිකොම් ජාලය පුළුල් කිරීමේ යෝජනා ක්‍රමය (එ.ජ. ඩොලර් දශ ලක්ෂ 17), සුළු සහ ඉතා කුඩා කාර්මික නායකත්වය සහ ව්‍යවසායකත්වය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය (එ.ජ. ඩොලර් දශ ලක්ෂ 11), ජපානය විසින් මුදල් සපයන ලද දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ යෝජනා ක්‍රමය (එ.ජ. ඩොලර් දශ ලක්ෂ 10) සහ ඕස්ට්‍රේලියාවේ ආධාර ලත් අම්පාරේ ඒකාබද්ධ ජල සැපයුම් වැඩපිළිවෙල (එ.ජ. ඩොලර් දශ ලක්ෂ 13) ආදියයි.

1997 වසරේ නිකුත් කළ පාවෙන විනිමය අනුපාත නෝට්ටුව සඳහා එ.ජ. ඩොලර් දශ ලක්ෂ 34 ක වූ ගෙවීමද ඇතුළත් වූ ප්‍රාග්ධන ආපසු ගෙවීම් වශයෙන් දළ පිටතට ගලා යාම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 290 සිට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 319 දක්වා ඉහළ නැගුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් රජයේ දිගුකාලීන ශුද්ධ ප්‍රාග්ධන ලැබීම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 203 සිට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 32 දක්වා පහත වැටුණි.

පෙර පරිදිම 1999 වසරේදීද ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය ආධාර ලබා දෙන ප්‍රධාන බහු ජාතික ආයතන ලෙස තවදුරටත් පැවති අතර එම ආයතන මගින් ලබා දුන් සහනදායි යෝජනා ක්‍රම ආධාර ප්‍රමාණය පිළිවෙලින් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 89 සහ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 51 ක් විය. වසර තුළ ලැබුණු මුළු ආධාර ප්‍රමාණයෙන් සියයට 44 කට දයක වෙමින් ජපානයෙන් ලත් ආධාර ප්‍රමාණය 1999 වසරේදී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 150 ක් විය.

## කෙටිකාලීන ප්‍රාග්ධනය

ප්‍රධාන වශයෙන් කොටස් වෙළඳපළින් ආයෝජන පිටතට ගලා යාම් වශයෙන් වූ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 13 සහ වාණිජ බැංකුවල විදේශ වත්කම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 120 කින් ඉහළ යාම හේතුකොටගෙන සමස්ත කෙටිකාලීන ශුද්ධ ප්‍රාග්ධනය පිටතට ගලායාම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 64 සිට 1999 දී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 142 ක් දක්වා වැඩි විය.


කලාපය තුළ දිගින් දිගටම පැවති අස්ථායීතාවන් හේතුකොටගෙන කොළඹ කොටස් වෙළඳපළේ විදේශීය ආයෝජකයන් තවදුරටත් ශුද්ධ විකුණුම්කරුවන් ලෙස ක්‍රියා කළ නමුත් මෙම ශුද්ධ විකුණුම්වල ප්‍රමාණය පෙර වසරට වඩා අඩු විය. කොටස් වෙළඳපළ වෙතට වූ ආයෝජන ගලා ඒම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 70 සිට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 72 දක්වා ඉහළ නැගුණ අතර ඒ තුළින් වූ ආයෝජනවල පිටතට ගලායාම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 93 සිට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 85 දක්වා පහළ වැටීමේ ප්‍රතිඵලයක් ලෙස කොටස් වෙළෙඳපොල හරහා වූ ආයෝජනවල ශුද්ධ ගලා යාම එ.ජ. ඩොලර් දශ ලක්ෂ 13 ක් විය. පෞද්ගලික අංශය වෙතට වූ ප්‍රාග්ධන ගලා ඒම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 8 ක ශුද්ධ ගලා ඒමක සිට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 10 ක ශුද්ධ ගලා යාමක් දක්වා අඩු විය. මෙම එ.ජ. ඩොලර් දශ ලක්ෂ 10 ක පිටත ගලා යාමට මුළුමණින්ම හේතු වූයේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කෙටිකාලීන ණය ආපසු ගෙවීමය.

ප්‍රධාන වශයෙන් වාණිජ බැංකු විසින් සිය විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක තුළින් වූ විදේශ ණය ගැනීම් පහත යාම හේතුකොටගෙන වාණිජ බැංකුවල වගකීම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 101 කින් පහළ වැටුණු අතර දේශීය බැංකු ඒකක මගින් විදේශ බැංකුවල පවත්වාගනු ලැබූ තැන්පතු ඉහළ යාම පිළිබිඹු කරමින් තැන්පතු එ.ජ. ඩොලර් දශ ලක්ෂ 19 කින් ඉහළ නැගුණි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වාණිජ බැංකුවල ශුද්ධ විදේශ තැන්පතු 1999 වසරේදී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 120 කින් ඉහළ නැගුණි.


## 9.7 විනිමය අනුපාත චලනයන්

1997 ජූලි මස නැගෙනහිර ආසියානු මූල්‍ය අර්බුදය පැන නැගීමේ සිට අත්දකින්නට ලැබුණු දැඩි උච්චාවචනයන්ගෙන් මිදී යලි ප්‍රකෘතිමත් තත්ත්වයට පත් වීමක් 1999 වසරේ විදේශ විනිමය වෙළඳපළවල් තුළින් විශේෂයෙන්ම නැගෙනහිර ආසියානු රටවල වෙළඳපළවල් තුළින් විද්‍යාමාන විය. අස්ථායී ජාත්‍යන්තර ආර්ථික වාතාවරණය හමුවේ

**9.6 රූප සටහන**
**සඵල විනිමය අනුපාතික**




9.6.1 රූප සටහන
මූර්ත සඵල විනිමය අනුපාතිකය (1995=100)




9.6.2 රූප සටහන
නාමික සඵල විනිමය අනුපාතිකය (1995=100)

ඇමෙරිකා එක්සත් ජනපදයේ පැවති සාපේක්ෂ වශයෙන් ශක්තිමත් සාර්ව ආර්ථික තත්ත්වයන් හමුවේ ඇමෙරිකානු ඩොලරය ජපන් යෙන්වලට හැර අනිකුත් සියළු ප්‍රධාන ව්‍යවහාර මුදල් වර්ගවලට සාපේක්ෂව ශක්තිමත් විය. සාර්ථක ලෙස දියත් කළ නමුත් යූරෝ මුදල් ඒකකයට එහි ආරම්භක අගය වූ එ.ජ. ඩොලරයට යූරෝ 1.17 ක මිල පවත්වාගෙන යාමට අපහසු විය. යූරෝ කලාපයේ තරමක් දුරට දුර්වල වූ ආර්ථික තත්ත්වයන් හමුවේ යූරෝ මුදල ඩොලරයට එරෙහිව සියයට 14 කින් අවප්‍රමාණය විය. ප්‍රධාන ජාත්‍යන්තර මුදල් වර්ගවල දැඩි උච්චාවචනයන් වසර තුළ අඛණ්ඩව පැවතුණි. වසරේ අවසන් භාගය ලභාවත්ම ආර්ථිකය යලි ප්‍රකෘතිමත් වීමේ සලකුණු විද්‍යාමාන වීමත් සමග ඊට ප්‍රතිචාර වශයෙන් ජපන් යෙන් මුදල් ඒකකය එ.ජ. ඩොලරයට එරෙහිව සියයට 8.8 කින් අධිප්‍රමාණය විය. වසර තුළ එ.ජ.ඩොලරයට එරෙහිව ස්ටර්ලින් පවුම සියයට 2 කින්ද, ඉන්දියානු රුපියල සියයට 2.3 කින්ද අවප්‍රමාණය විය. වසර පුරාම නැගෙනහිර ආසියානු රටවල විනිමය වෙළඳපළවල් ස්ථායීව පැවතුණි. එ.ජ. ඩොලරයට සාපේක්ෂව ඉන්දුනීසියානු "රුපියා" මුදල් ඒකකයේ අගය පෙර වසරේ සියයට 31 කින් අවප්‍රමාණය වීමට ප්‍රතිවිරුද්ධව යමින් 1999 වසරේදී සියයට 12 කින් අධිප්‍රමාණය වූ අතර, කොරියන් වොන් අගය සියයට 2 කින් අධිප්‍රමාණය විය. සිංගප්පූරු ඩොලරය වසර තුළ ස්ථායී තත්ත්වයක පැවති අතර, එය එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 1 කින් අධිප්‍රමාණය විය. එ.ජ. ඩොලරයට එරෙහිව පිලිපීන පේසෝ මුදල (සියයට 5 කින්) සහ තායි බාත් මුදල (සියයට 3 කින්) අවප්‍රමාණය විය. මේ අතර

**9.7 සංඛ්‍යා සටහන**
**විනිමය අනුපාතික වෙනස්වීම**

| මුදල් වර්ගය | විදේශීය මුදල් ඒකකයකට රුපියල් අගය | | | | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශත වෙනස්වීම (අ) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වර්ෂය අග අනුපාතිකය | | | වාර්ෂික සාමාන්‍යය | | | ලක්ෂමය | | වාර්ෂික සාමාන්‍යය | |
| | 1997 | 1998 | 1999 | 1997 | 1998 | 1999 | 1998/1997 | 1999/1998 | 1998/1997 | 1999/1998 |
| ජර්මන් මාර්ක් | 34.24 | 40.36 | 37.09 | 34.07 | 36.80 | 38.39 | -15.2 | 8.8 | -7.4 | -4.1 |
| ප්‍රංශ ප්‍රැන්ක් | 10.23 | 12.03 | 11.06 | 10.12 | 10.98 | 11.45 | -14.9 | 8.8 | -7.8 | -4.1 |
| ඉන්දියානු රුපියල් | 1.56 | 1.59 | 1.66 | 1.63 | 1.57 | 1.64 | -1.3 | -4.3 | 3.8 | -3.7 |
| ජපන් යෙන් | 0.47 | 0.59 | 0.71 | 0.49 | 0.50 | 0.62 | -20.3 | -16.1 | -1.6 | -20.1 |
| බ්‍රිතාන්‍ය පවුම් | 101.60 | 112.62 | 116.72 | 96.69 | 107.05 | 113.91 | -9.8 | -3.5 | -9.7 | -6.0 |
| එ.ජ.ඩොලර් | 61.29 | 67.78 | 72.12 | 58.99 | 64.59 | 70.39 | -9.6 | -6.0 | -8.7 | -8.2 |
| විශේෂ ගැණුම් හිමිකම් | 82.69 | 95.44 | 98.87 | 81.17 | 87.66 | 96.25 | -13.4 | -3.5 | -7.4 | -8.9 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) වෙනස්වීම ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාළ විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කර ගෙනය. ඍණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය අඩුවීම පෙන්නුම් කරයි.


මැලේසියාව මෙම වසර තුළදීද සිය ස්ථාවර විනිමය අනුපාත ප්‍රතිපත්තිය තවදුරටත් පවත්වාගෙන යන ලදී. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වසර පුරාම පහළ වැටෙන උපනතියක් පෙන්වූ උද්ධමන අනුපාතය හේතුකොටගෙන රුපියලේ අගය මත වූ පීඩනය අඩු විය. 1998 පැවති සියයට 9.6 ක් වූ අවප්‍රමාණය හා සැසඳීමේදී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 6 කින් අවප්‍රමාණය විය. ශ්‍රී ලංකා රුපියල ජපන් යෙන්වලට සාපේක්ෂව සියයට 16.2 ක්ද, ඉන්දියානු රුපියලට සාපේක්ෂව සියයට 3.7 කින්ද, ස්ටර්ලින් පවුමට සාපේක්ෂව සියයට 3.5 කින්ද අවප්‍රමාණය විය. යුරෝ මුදලේ අගය බෙහෙවින් දුර්වල වීම නිසා යුරෝවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය සියයට 8.8 කින් අධිප්‍රමාණය විය. සමුච්චිත වටිනාකම් ඒකකයක් වූ විගැහිවලට සාපේක්ෂව රුපියල 1999 වසර තුළ සියයට 3.5 කින් අවප්‍රමාණය විය.

විදේශ ව්‍යවහාර මුදල් වර්ග 24 ක වටිනාකම් එකතුවට එරෙහිව ශ්‍රී ලංකා රුපියලේ මූර්ත සඵල විනිමය අනුපාතය 1999 වසර තුළ සියයට 7 කින් අවප්‍රමාණය වීම කැපී පෙනෙන කරුණකි. ශ්‍රී ලංකාවේ උද්ධමනයේ පහළ යන උපනතියත්, ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියලේ නාමික අගය අවප්‍රමාණය වීමත් මෙරට බාහිර තරඟකාරිත්වය වැඩි දියුණු කිරීමට උපකාරී විය.

## 9.8 විදේශ වත්කම්

විශේෂයෙන්ම ආසියානු අර්බුදය තුළින් පැන නැගුණු බාහිර වාතාවරණයේ අයහපත් උපනතීන් 1999 වසර තුළ

**9.7 රූප සටහන**
**විදේශීය වත්කම් (අ) (ත්‍රෛමාසිකව)**




(අ) 1994 සිට විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (වි.ව්‍ය.මු.බැ.ඒ) දේශීය බැංකු ක්‍රමයේ කොටසක් ලෙස සලකන ලදී.

**9.8 සංඛ්‍යා සටහන**
**ශ්‍රී ලංකාවේ විදේශීය වත්කම්**

| | එ.ජ.ඩො.දශලක්ෂ (අ) | | | | | රුපියල් දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1995 | 1996 | 1997 | 1998 | 1999 | 1995 | 1996 | 1997 | 1998 | 1999 |
| 1. රජය (ආ) | 17 | 23 | 19 | 20 | 20 | 938 | 1,295 | 1,192 | 1,372 | 1,441 |
| 2. රාජ්‍ය නියෝජ්‍යතත්ව | - | - | - | - | - | - | - | - | - | - |
| 3. මහ බැංකුව (ඇ) | 2,046 | 1,915 | 2,009 | 1,964 | 1,619 | 110,521 | 108,506 | 123,093 | 132,900 | 116,571 |
| 4. මුළු නිල වත්කම් | 2,063 | 1,937 | 2,029 | 1,984 | 1,639 | 111,459 | 109,800 | 124,286 | 134,272 | 118,013 |
| 5. වෙළඳ බැංකු | 839 | 780 | 1,103 | 923 | 942 | 45,338 | 44,211 | 67,596 | 62,561 | 67,946 |
| 6. මුළු විදේශීය වත්කම් | 2,902 | 2,717 | 3,132 | 2,907 | 2,582 | 156,797 | 154,011 | 191,881 | 196,833 | 185,958 |
| 7. දළ නිල වත්කම් මගින් කළහැකි ආනයන මාස ගණන | | | | | | | | | | |
| 7.1 වෙළෙඳ භාණ්ඩ | 4.7 | 4.3 | 4.2 | 4.0 | 3.3 | | | | | |
| 7.2 භාණ්ඩ හා සේවා | 4.1 | 3.8 | 3.7 | 3.6 | 2.9 | | | | | |
| 8. මුළු වත්කම් මගින් කළහැකි ආනයන මාස ගණන | | | | | | | | | | |
| 8.1 වෙළෙඳ භාණ්ඩ | 6.6 | 6.0 | 6.4 | 5.9 | 5.3 | | | | | |
| 8.2 භාණ්ඩ හා සේවා | 5.8 | 5.3 | 5.7 | 5.2 | 4.6 | | | | | |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග එකඟ වන ලද නියෝජන අනුපාතිකයට අනුව පරිවර්තනය කරන ලද මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ සමහර ශීර්ෂයන් හැර ඉතිරිය පහත සඳහන් කාලපරිච්ඡේද අවසානයේ වූ විනිමයඅනුපාතිකයින්ට අනුව පරිවර්තනය කර ඇත.

| වර්ෂය | 1995 | 1996 | 1997 | 1998 | 1999 |
|---|---|---|---|---|---|
| එ.ජ.ඩොලර් එකකට රුපියල් | 54.05 | 56.71 | 61.29 | 67.78 | 72.12 |

(ආ) භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් නමින් ඇති ගිණුමේ හර ශේෂයන් ඇතුලත් කිරීම සඳහා 1985 සිට සංඛ්‍යා සංශෝධනය කර ඇත.

(ඇ) වාණිජ බැංකු විසින් මහ බැංකුවේ තැන්පත් කර ඇති විදේශ මුදල් ගිණුම්වලට අදළ මුදල් සංචිත ඇතුලත් කිරීම සඳහා 1993 සිට සංඛ්‍යා සංශෝධනය කර ඇත.

(ඈ) 1994 සිට විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක දේශීය වාණිජ බැංකු ව්‍යුහයේ කොටසක් ලෙස සලකනු ලැබීය. ඒ අනුව අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ගිණුම් තුලනයේදී යොද ගනු ලැබූ අතර, නේවාසික විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක සැලකිල්ලට ගනු නොලැබීය.

ශ්‍රී ලංකාවේ විදේශ වත්කම් තත්ත්වය මත දැඩි බලපෑමක් ඇති කළේය. වසර තුළ වූ ප්‍රාග්ධන ගලා ඒම් වල පසුබෑම හේතුකොටගෙන එක් අතකින් විදේශීය ගෙවීම් සඳහා සාපේක්ෂ වශයෙන් විශාල ලෙස නිල වත්කම් වැය කිරීමට සිදු වූ අතර පොලී අනුපාතික අතර වෙනස්කම් පහත වැටීමත්, පෞද්ගලික අංශයෙන් වූ ණය ඉල්ලුම සුළු වශයෙන් වැඩි වීමත් නිසා වාණිජ බැංකු විදේශ බැංකු වෙත වූ ඊ දියාව අඩු විය.

මෙම පසුබිම යටතේ ශ්‍රී ලංකාවේ දළ විදේශ වත්කම් ප්‍රමාණය 1998 අවසානයේ පැවති එ.ජ. ඩොලර් දශ ලක්ෂ 2,907 සමග සැසඳීමේදී සියයට 11 කින් අඩු වී 1999 වසර අවසාන වනවිට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 2,582 ක්වා පැවතුණි. මෙය ශ්‍රී ලංකා මහ බැංකුව සතු විදේශ වත්කම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 1,619 දක්වා සියයට 18 කින් පහළ වැටීමේත්, වාණිජ බැංකුවල දළ විදේශ වත්කම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 942 ක් දක්වා සියයට 2 කින් ඉහළ යාමේත් ඒකාබද්ධ ප්‍රතිඵලයකි. මහ බැංකුවේ වත්කම් පහළ යාම එහි ද්‍රවශීලතා ශේෂයන්හි අඩු වීම තුළින් පිළිබිඹු වූ අතර වාණිජ බැංකු සතු විදේශ වත්කම් ඉහළ යාම ඒවායේ දේශීය බැංකු ඒකකවල ද්‍රවශීලතා ශේෂයන් ඉහළ යාම තුළින් විද්‍යාමාන විය. විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකවල බාහිර ණය ගැනීම් පහත වැටීම නිසා වාණිජ බැංකුවල දළ විදේශීය වගකීම් සියයට 12 කින් අඩු විය. මේ අනුව 1999 වසරේ වාණිජ බැංකුවල ශුද්ධ විදේශ වත්කම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 120 කින් ඉහළ නැගුණි.


ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය සතු විදේශ වත්කම් වලින් සමන්විත වූ දළ නිල වත්කම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 345 කින් අඩු වී වසර අවසාන වනවිට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 1,639 ක්වා පැවතුණි. මේ අතර, එ.ජ. ඩොලර් දශ ලක්ෂ 100 ක් වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට කළ ආපසු ගෙවීම් හේතුවෙන් දළ නිල වගකීම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 81 කින් පහත වැටුණි. මෙහි ශුද්ධ ප්‍රතිඵලය ලෙස ශුද්ධ නිල වත්කම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 263 කින් පහළ වැටුණු අතර එය ගෙවුම් තුලනයේ හිඟය තුළ විද්‍යාමාන විය. 1999 අවසානයේ පැවති සමස්ත විදේශ වත්කම් ප්‍රමාණය 1999 වසර සඳහා වූ මුළු ආනයන වලින් මාස 5.3 ක ප්‍රමාණය මූල්‍යයනය කිරීමට ප්‍රමාණවත් වූ අතර දළ නිල වත්කම් ප්‍රමාණවත් වූයේ මාස 3.3 ක ආනයනයන් මූල්‍යයනය කිරීමට පමණි.

## 9.9 විදේශීය ණය

ශ්‍රී ලංකාවේ සමස්ත විදේශ ණය 1998 දී පැවති එ.ජ. ඩොලර් දශ ලක්ෂ 8,749 සිට 1999 දී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 9,049 දක්වා සියයට 3 කින් ඉහළ නැගුණි. විනිමය අනුපාතයන්හි උච්චාවචන, විශේෂයෙන්ම එ.ජ. ඩොලරයට සාපේක්ෂව ජපන් යෙන් මුදල් ඒකකයේ අගය වසර තුළදී සියයට 9 කින් පමණ වැඩි වීම, ඉහළ නැගුණු විදේශ ණය ප්‍රමාණයෙන් සියයට 65 කට පමණ දායක විය. සමස්ත ණය තොගයෙන් සියයට 92 කට දායක වූයේ ආසියානු සංවර්ධන බැංකුව, ජපානය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් සපයන ලද සහනදායී ආධාර වලින් සමන්විත වූ මැදි හා දිගුකාලීන ණයයි.

සමස්ත ණය තොගයෙන් සියයට 78 කට දායක වූ රජයේ විදේශ ණය එ.ජ. ඩොලර් දශ ලක්ෂ 7,088 ක් විය. ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා ගුවන් සමාගම සිය ප්‍රතිෂ්ඨාපන යෝජනා ක්‍රමය මූල්‍යයනය කිරීම සඳහා ගත් විදේශ ණය පිළිබිඹු කරමින් රජයේ ණය සහතික කිරීම යටතේ පොදු සමාගම් සහ පෞද්ගලික අංශය ලබාගත් ණය එ.ජ. ඩොලර් දශ ලක්ෂ 941 දක්වා සියයට 31 කින් ඉහළ නැගුණි. මේ අනුව විදේශ ණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 55.5 සිට සියයට 57.4 දක්වා 1999 දී සුළු වශයෙන් ඉහළ නැගුණි. මේ අතර, සැපයුම් ණය වශයෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මගින් වූ ණය ගැනීම් අඩු වීම හේතුවෙන් නොපියවා පැවති කෙටිකාලීන ණය එ.ජ. ඩොලර් දශ ලක්ෂ 475 දක්වා සියයට 2 කින් පහත වැටුණි. මුළු කෙටිකාලීන ණය, සමස්ත ණය තොගයෙන් සියයට 5 කට ආසන්නය.

බැංකු අංශයේ බාහිර වගකීම්ද ඇතුළත්ව සමස්ත විදේශ වගකීම් ප්‍රමාණය 1999 අග වනවිට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 9,934 ක්වා පැවතුණි. මෙයින් සියයට 14 කට දායක වූයේ බැංකු අංශයේ විදේශ වගකීම් සහ කෙටිකාලීන විදේශ වගකීම්ය.




9.8 රූප සටහන
විදේශීය ණය

:සටහන : 1994 සිට විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක (වි.ව්‍ය.මු.බැ.ඒ.) දේශීය බැංකු ක්‍රමයේ කොටසක් ලෙස සලකන ලදී.

## 9.10 විදේශ ණය සේවා ගෙවීම්

විදේශ ණය ආපසු ගෙවීම් සහ පොලී ගෙවීම් ඉහළ යාම නිසා දිගු සහ මධ්‍යකාලීන ණය ගෙවීම් සහ සියළුම විදේශ ණය සඳහා වූ පොලී ගෙවීම් යන කොටස් දෙකෙන්ම සමන්විත වූ සමස්ත ණය සේවා ගෙවීම් වසර තුළදී එ.ජ. ඩොලර් දශ ලක්ෂ 846 ක් දක්වා සියයට 12 කින් ඉහළ නැගුණි. විදේශ ණය ආපසු ගෙවීම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 550 ක් දක්වා සියයට 17 කින් ඉහළ නැගුන අතර ජාත්‍යන්තර

**9.9 සංඛ්‍යා සටහන**

**නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය සහ බැංකු අංශයේ විදේශීය වගකීම් (අ)**

| | එ.ජ.ඩොලර් දශලක්ෂ | | | | | රුපියල් දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1995 | 1996 | 1997 | 1998 | 1999(ආ) | 1995 | 1996 | 1997 | 1998 | 1999(ආ) |
| **1. මැදි හා දිගුකාලීන ණය** | 8,152 | 7,988 | 7,719 | 8,264 | 8,574 | 440,570 | 452,944 | 473,043 | 557,530 | 617,504 |
| 1.1 රජයේ (ඇ) | 6,637 | 6,554 | 6,346 | 6,902 | 7,088 | 358,710 | 371,648 | 388,925 | 467,798 | 511,152 |
| 1.2 රජය විසින් සහතික කරන ලද රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය(ඈ) | 640 | 637 | 670 | 718 | 941 | 34,582 | 36,098 | 41,061 | 48,673 | 67,839 |
| 1.3 රජය විසින් සහතික නොකරන ලද රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය (ඈ) | 279 | 267 | 270 | 277 | 288 | 15,066 | 15,144 | 16,521 | 18,789 | 20,747 |
| 1.4 ජා.මූ.අ. න් කළ ගැණුම් | 596 | 530 | 433 | 367 | 258 | 32,212 | 30,054 | 26,536 | 22,271 | 17,766 |
| **2. කෙටිකාලීන ණය** | 542 | 498 | 478 | 484 | 475 | 29,309 | 28,262 | 29,323 | 32,833 | 34,240 |
| 2.1 රජය | - | - | - | - | - | - | - | - | - | - |
| 2.2 අනෙකුත් (ඈ) | 542 | 498 | 478 | 484 | 475 | 29,309 | 28,262 | 29,323 | 32,833 | 34,240 |
| **3. බැංකු අංශය විදේශ වගකීම් ((ඉ)** | 1,078 | 1,047 | 1,202 | 958 | 885 | 58,287 | 59,356 | 73,638 | 64,926 | 63,838 |
| 3.1 මහ බැංකුව | 1 | 1 | 1 | ... | ... | 27 | 43 | 65 | 24 | 7 |
| 3.2 වාණිජ බැංකු | 1,004 | 964 | 1,094 | 865 | 765 | 54,256 | 54,678 | 67,030 | 58,656 | 55,142 |
| 3.3 ආ.නි.සංගමයේ වගකීම් | 74 | 82 | 107 | 92 | 121 | 4,005 | 4,634 | 6,543 | 6,247 | 8,689 |
| **4. මුළු විදේශ ණය (1+2)** | 8,694 | 8,486 | 8,197 | 8,749 | 9,049 | 469,879 | 481,206 | 502,366 | 590,363 | 651,744 |
| 5. මුළු විදේශ ණය සහ වගකීම් (1+2+3) | 9,772 | 9,533 | 9,399 | 9,707 | 9,934 | 528,166 | 540,562 | 576,004 | 655,289 | 715,582 |
| **විශේෂිත අයිතමයන්** | | | | | | | | | | |
| **මැදි හා දිගු කාලීන ණය** | | | | | | | | | | |
| 1. ව්‍යාපෘති ණය | 4,594 | 4,654 | 4,530 | 5,150 | 5,453 | 248,296 | 263,918 | 277,637 | 349,043 | 393,249 |
| 2. ව්‍යාපෘති නොවන ණය | 1,871 | 1,724 | 1,612 | 1,656 | 1,578 | 101,137 | 97,745 | 98,788 | 112,237 | 113,819 |
| 3. සැපයුම්කරුවන්ගේ ණය | 256 | 239 | 343 | 251 | 182 | 13,837 | 13,537 | 21,015 | 17,020 | 13,132 |
| 4. ජා.මූ.අ.ණය | 596 | 530 | 433 | 367 | 258 | 32,212 | 30,054 | 26,536 | 22,271 | 17,766 |
| 5. අනෙකුත් ණය (ඊ) | 834 | 841 | 801 | 840 | 1,103 | 45,088 | 47,690 | 49,067 | 56,960 | 79,539 |
| කෙටිකාලීන ණය සහ බැංකු අංශයේ වගකීම් | 1,621 | 1,545 | 1,680 | 1,442 | 1,360 | 87,597 | 87,618 | 102,961 | 97,759 | 98,078 |
| මුළු විදේශ ණය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් වශයෙන් | 66.7 | 61.1 | 54.3 | 55.5 | 57.4 | 70.4 | 62.6 | 56.4 | 58.0 | 58.7 |
| බැංකු අංශයේ මුළු විදේශීය වගකීම් ද.දේ.නි.යේ ප්‍රතිශතයක් වශයෙන් | 8.3 | 7.5 | 8.0 | 6.1 | 5.6 | 8.7 | 7.7 | 8.3 | 6.4 | 5.7 |
| මුළු විදේශීය ණය සහ බැංකු අංශයේ විදේශීය වගකීම් ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස | 75.0 | 68.6 | 62.3 | 61.6 | 63.0 | 79.1 | 70.4 | 64.7 | 64.4 | 64.4 |
| කෙටිකාලීන ණය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් වශයෙන් | 4.2 | 3.6 | 3.2 | 3.1 | 3.0 | 4.4 | 3.7 | 3.3 | 3.2 | 3.1 |
| කෙටිකාලීන ණය සහ බැංකු අංශයේ විදේශ වගකීම් ද.දේ.නි.යේ ප්‍රතිශතයක් වශයෙන් | 12.4 | 11.1 | 11.1 | 9.2 | 8.6 | 13.1 | 11.4 | 11.6 | 9.6 | 8.8 |
| කෙටිකාලීන ණය මුළු ණයවල ප්‍රතිශතයක් වශයෙන් | 5.5 | 5.2 | 5.1 | 5.0 | 4.8 | 5.5 | 5.2 | 5.1 | 5.0 | 4.8 |
| කෙටිකාලීන වගකීම් මුළු ණයවල ප්‍රතිශතයක් වශයෙන් | 11.0 | 11.0 | 12.8 | 9.9 | 8.9 | 11.0 | 11.0 | 12.8 | 9.9 | 8.9 |

(අ) 1994 සිට අනේවාසිකයින්ගේ විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක හැර, නේවාසිකයින් සතු විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක දේශීය බැංකු කටයුතු ව්‍යුහයේ කොටසක් සේ සලකනු ලැබේ. ඒ අනුව දේශීය ආයතනවලට දී ඇති විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක ණය දේශීය ගණුදෙනු සේ සලකා, නොපියවා ඉතිරි වූ විදේශ ණය දත්තයන්ගෙන් ඉවත්කර ඇත.

(ආ) තාවකාලික

(ඇ) වැඩිමනත් තොරතුරු ඇතුලත් කිරීම සඳහා 1994 සිට දත්ත සංශෝධනය කර ඇත.

(ඈ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රතිග්‍රහණ ණය සහ වෙළෙඳ ණය ඇතුලත් කොට ඇත.

(ඉ) ආසියානු නිෂ්කාශන සංගමයේ ණය සහ වි.ව්‍ය.මු.බැ.ඒ. ඇතුලත් වාණිජ බැංකුවල විදේශ වගකීම්ද ඇතුලත් වේ.

(ඊ) රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය මගින් ගත් ණය ඇතුළුව දිගුකාලීන ණය

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව
විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

මූල්‍ය අරමුදලට (ජා.මූ.අ.) වූ ණය ආපසු ගෙවීම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 100 ක් දක්වා සියයට 20 කින් ඉහළ නැගුණි. ජා.මූ.අ. ට වූ ණය ආපසු ගෙවීම් සමන්විත වූයේ පිළිවෙලින් 1988 - 1990 සහ 1991 - 1994 අතර ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම සහ දීර්ඝ කරන ලද ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම යටතේ ලබා ගත් ණය සඳහා වූ ආපසු ගෙවීම් වලිනි. මේ අතර අනෙකුත් ආයතනවලට කළ ණය ගෙවීම් ප්‍රධාන වශයෙන් සමන්විත වූයේ රජයේ දිගුකාලීන සහනදායී ණය ආපසු ගෙවීම් වලිනි. ජාත්‍යන්තර පොලී අනුපාතිකයන්හි පහත වැටෙන උපනතිය සහ ඉහළ ගිය ණය තොගය යන දෙකෙහි ඒකාබද්ධ ප්‍රතිඵලය වශයෙන් 1999 වසරේදී විදේශ ණය සඳහා වූ පොලී ගෙවීම් ඉහළ නැගුනේ එ.ජ. ඩොලර් දශ ලක්ෂ 296 දක්වා ඉතා සුළු වශයෙන් සියයට 2 කිනි. ජා.මූ.අ. ට වූ නොපියවූ ණය ප්‍රමාණය අඩු වීම නිසා ජා.මූ.අ. ට වූ පොලී ගෙවීම් එ.ජ. ඩොලර් දශ ලක්ෂ 7 සිට එ.ජ. ඩොලර් දශ ලක්ෂ 5 ක් දක්වා අඩු විය. ණය සේවා අනුපාතය වෙළඳ ද්‍රව්‍ය අපනයන සහ සේවාවන්හි ප්‍රතිශතයක් ලෙස ගත් කළ සියයට 13.3 සිට සියයට 15.2 දක්වා ඉහළ නැගුණි අතර එය භාණ්ඩ, සේවා, ආදයම් සහ පෞද්ගලික සංක්‍රාම ලැබීම්වල ප්‍රතිශතයක් ලෙස සියයට 11 සිට 1999 දී සියයට 12.5 දක්වා ඉහළ නැගුණි.

**9.10 සංඛ්‍යා සටහන**
**ණය සේවා ගෙවීම් (අ)**

| | එ.ජ.ඩොලර් දශලක්ෂ | | | | | රුපියල් දශලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1995 | 1996 | 1997 | 1998 | 1999(ආ) | 1995 | 1996 | 1997 | 1998 | 1999(ආ) |
| 1. ණය සේවා ගෙවීම් | 764 | 746 | 733 | 759 | 846 | 38,652 | 40,953 | 42,645 | 48,773 | 59,304 |
| 1.1 ණය ආපසු ගෙවීම් | 452 | 439 | 430 | 469 | 550 | 22,642 | 24,007 | 24,764 | 30,076 | 38,472 |
| (i) ජා.මූ.අරමුදලට | 33 | 47 | 66 | 83 | 100 | 1,184 | 2,314 | 3,290 | 5,100 | 6,813 |
| (ii) අනෙකුත් (ඇ) | 419 | 392 | 364 | 387 | 451 | 21,458 | 21,693 | 21,475 | 24,975 | 31,658 |
| 1.2 පොලී ගෙවීම් | 312 | 307 | 303 | 289 | 296 | 16,011 | 16,946 | 17,881 | 18,697 | 20,833 |
| (i) ජා.මූ.අරමුදලට | 8 | 7 | 6 | 7 | 5 | 407 | 409 | 361 | 443 | 376 |
| (ii) අනෙකුත් (ඇ) | 304 | 300 | 297 | 282 | 290 | 15,604 | 16,537 | 17,520 | 18,254 | 20,457 |
| 2. වෙළෙඳ භාණ්ඩ අපනයනය හා සේවාවන් ගේ ඉපැයීම | 4,627 | 4,861 | 5,514 | 5,712 | 5,565 | 237,137 | 269,159 | 325,885 | 369,484 | 392,408 |
| 3. වෙළෙඳ භාණ්ඩ අපනයන, සේවා හා පෞද්ගලික සංක්‍රාම | 5,644 | 5,878 | 6,670 | 6,925 | 6,788 | 289,215 | 325,420 | 394,122 | 447,951 | 478,573 |
| 4. ණය සේවා අනුපාතික (ඇ) | | | | | | | | | | |
| 4.1 2 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය | 16.5 | 15.3 | 13.3 | 13.3 | 15.2 | 16.3 | 15.2 | 13.1 | 13.2 | 15.1 |
| (ii) ජා.මූ.අරමුදලේ ගණුදෙනු හැර | 15.6 | 14.2 | 12.0 | 11.7 | 13.3 | 15.6 | 14.2 | 12.0 | 11.7 | 13.3 |
| 4.2 3 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය | 13.5 | 12.7 | 11.0 | 11.0 | 12.5 | 13.4 | 12.6 | 10.8 | 10.9 | 12.4 |
| (ii) ජා.මූ.අරමුදලේ ගණුදෙනු හැර | 12.8 | 11.8 | 9.9 | 9.7 | 10.9 | 12.8 | 11.7 | 9.9 | 9.7 | 10.9 |
| 5. රජයේ ණය සේවා ගෙවීම් | | | | | | | | | | |
| 5.1 රජයේ ණය සේවා ගෙවීම් (ඉ) | 342.2 | 378.5 | 393.4 | 419.5 | 449.0 | 17,888 | 20,947 | 24,060 | 27,126 | 31,613 |
| 5.2 1 හි ප්‍රතිශතයක් වශයෙන් | 44.8 | 50.7 | 53.7 | 55.3 | 53.1 | 46.3 | 51.1 | 56.4 | 55.6 | 53.3 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 1994 සිට අනේවාසිකයින්ගේ විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක හැර නේවාසිකයින්ගේ විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක දේශීය බැංකු ක්‍රමයේ කොටසක් සේ සලකන ලදී. ඒ අනුව දේශීය ආයතන විසින් කරන ලද විදේශ ණය සේවා ගෙවීම්, දේශීය බැංකු ගණුදෙනු සේ සලකා, විදේශීය ණය සේවා ගෙවීම් වලින් ඉවත් කොට ඇත.
(ආ) තාවකාලික
(ඇ) වැඩිමනක් කොරතුරු ඇතුළත් කිරීම සඳහා 1994 සිට දත්ත සංශෝධනය කර ඇත.
(ඈ) වර්ෂය තුළ විනිමය අනුපාතිකයන්හි සිදුවූ වෙනස්වීම හේතුවෙන් රුපියල් වටිනාකම හා ඇ.එ.ජ.ඩොලර් වටිනාකම අනුව වෙන් වෙන් වශයෙන් ගත් කල ණය සේවා අනුපාතිකයන් වෙනස් වේ.
(ඉ) ජා.මූ.අරමුදලෙහි ගණුදෙනු හැර

## 9.11 විදේශීය වෙළෙඳ වාතාවරණය සහ ප්‍රතිපත්තිය

### ආනයන හා අපනයන පාලනය

ශ්‍රී ලංකාවෙහි වෙළඳ හා තීරු බදු ප්‍රතිපත්තිය අපනයන අංශයෙහි තරඟකාරිත්වය වර්ධනය කිරීමට සුදුසුවන්නා වූ පරිසරයක් ඇති කිරීමටත් අඩු තීරු ගාස්තු සහිත, සරල පුළුල් පදනමකින් යුතු විනිවිද දැකිය හැකි තීරුබදු ක්‍රමයක් ඇති කිරීම, ධෛර්යමත් කිරීමක් තුලින් අපනයන මූලික වූ වර්ධනයක් දිරිගැන්වීම කෙරෙහි තව දුරටත් යොමු විය. සරල වූත් විනිවිද පෙනෙන්නාවූත් වෙළඳ හා තීරු බදු ප්‍රතිපත්තිය තුළින් ප්‍රමාණාත්මක සීමා කිරීම් අවම කිරීම් මගින් හා විශේෂිත තීරුබදු, තීරුබදු අධිභාරයන්, සැඟවුණු තීරු බදු ආන්තිකයන්, සෙස් බද්ද, අවිධිමත් තීරු බදු සහ බදු අත්හැරීම් වැනි දෑ ඉවත් කිරීම තුලින් සරල හා විනිවිද පෙනෙන සුළු වෙළඳ හා තීරු බදු ක්‍රමයක් තහවුරු කරන ලදී.

1969 අංක 1 දරණ ආනයන හා අපනයන පාලන පනත යටතේ විදේශීය වෙළඳම සඳහා බලපත්‍ර අවශ්‍යතාවයන්, ප්‍රධාන වශයෙන් ජාතික ආරක්ෂාව, මහජන සෞඛ්‍යය, පරිසර සංරක්ෂණය සහ දේශීය නිෂ්පාදකයා ආරක්ෂා කිරීම වැනි කරුණු සඳහා අවශ්‍ය යයි සැලකෙන හොඳින් නිර්වචනය කරන ලද පටු ලැයිස්තුවකට සීමා කර ඇත. රජය සහ ඇඹරුම් කම්හලක් වන ප්‍රීමා ලංකා සමාගම අතර ඇති ගිවිසුම ප්‍රකාරව තිරිඟු හා ධාන්‍ය, තිරිඟු හා ධාන්‍ය පිටි ආනයනය 1999 වර්ෂය තුළදී බලපත්‍ර අවශ්‍යතාවයන් යටතේ පැවතිණි.

භාණ්ඩ ප්‍රවාහනය සඳහා භාවිතා කරන ඇතැම් මෝටර් රථ ආනයන කිරීමේදී බලපත්‍ර ලබාගත යුතුව පැවති කාලසීමාව පැරණිකම අනුව අවුරුදු 5 සිට 7 දක්වා වැඩි කරමින් 1998 නොවැම්බර් මස 17 දින සිට බලපැවැත්වෙන පරිදි ආනයන හා අපනයන (පාලන) පනතට කරන ලද සංශෝධනය 1999 මාර්තු 31 දින දක්වා බලපැවැත්විනි. මීට පෙරදී සාමාන්‍ය තත්ත්වය යටතේ වසර 5 ට වඩා පැරණි වාහන සඳහා ආනයනකරුවන් බලපත්‍රයක් ලබා ගත යුතු විය. පරිසරය සුරැකීමේ අපේක්ෂාවන් නොසලකා හරිමින් ගන්නා ලද මෙම තීරු බදු අත් හැරීමේ අවිධිමත්

ප්‍රතිපත්තිය, වර්තමාන ප්‍රතිපත්තිමය දිශාවට පරස්පර විරෝධී බවක් දක්වයි. සංක්ෂිප්ත වශයෙන් ගත් කල රේගු දත්ත ලේඛණ අංකිත ක්‍රමයේ (Harmonised System Code-ISC) අංක 6 මට්ටමේ ඇති 6,000 ක් පමණ වන මුළු භාණ්ඩ සංඛ්‍යාවෙන් භාණ්ඩ 300 ක් පමණ 1999 අවසානය වනවිට ආනයන බලපත්‍ර යටතේ පැවතිණි.

පරිසරය සුරැකීමේ සහ පෞරාණික වස්තූන් ආරක්‍ෂා කිරීමේ අරමුණින් අපනයන වර්ග 4 ක් පමණක් එනම් කොරල් කොටස් සහ සිප්පිකටු, දව සහ දව භාණ්ඩ (කළුවර), ඇත් දළ සහ ඇත් දළ නිෂ්පාදිත සහ 1945 ට පෙර ලියාපදිංචි කරන ලද මගී ප්‍රවාහන මෝටර් රථ යනාදිය අපනයන බලපත්‍ර යටතේ තවදුරටත් පවත්වාගෙන යන ලදී.

## විදේශීය වෙළඳම මත වූ තීරු බදු සහ අනෙකුත් බදු

සරල කරන ලද, වඩාත් නිදහස් හා අඩුවෙන් ආරක්‍ෂාව සැලසීමේ අරමුණු කෙරෙහි යොමුවීමක් පැහැදිලිව පෙන්නුම් කරමින් විදේශීය වෙළඳ ප්‍රතිපත්තිය වෙනස් වීමකට භාජනය විය. තීරු බදු ව්‍යුහය අධ්‍යනය කොට යෝග්‍ය වූ වෙනස් කිරීම් යෝජනා කිරීම රජය විසින් 1997 දී පත් කරන ලද තීරු බදු පිළිබඳ ජනාධිපති කොමිසමේ නිර්දේශ කිරීම්වලට අනුකූලවන පරිදි තීරු බදු ක්‍රමය 1998 නොවැම්බර් මස 6 වන දින සිට බලපැවැත්වෙන පරිදි 5, 10, 30 යන ප්‍රතිශතවලින් යුත් තීරු තුනේ තීරු බදු ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු නොලබන සියළුම කාර්මික අමු ද්‍රව්‍ය හා යන්ත්‍රසූත්‍ර සියයට 5 තීරුව යටතේ වර්ගීකරණය කරන ලදී. සියයට 50 - 100 පරාසයක් යටතේ පැවති මෝටර් කාර් හා ජීප් රථවල තීරු ගාස්තු ඒකීය බද්දක් ලෙස සියයට 30 දක්වා අඩු කරන ලදී. කෙසේ නමුදු ආනයන භාණ්ඩ කීපයක් මෙම තීරු තුනෙන් බැහැරව පැවතිණි. දේශීය කෘෂිකාර්මික අංශයට, මධ්‍යකාලීනව පහළ මට්ටමක තීරු බදු ක්‍රමයකට හැඩ ගැසීමට හුරු වීමට ඉඩ සලසනු පිණිස කෘෂිකාර්මික නිෂ්පාදනයන්ගේ ආනයන තීරු බදු සියයට 35 ක මට්ටමේ පවත්වා ගැනිණ. අවම මට්ටමක ජීවන තත්ත්වයන් පවත්වා ගැනීමට අවශ්‍ය වන්නාවූ භාණ්ඩ තීරු ගාස්තු රහිත තත්වයක පවත්වා ගනු ලැබීය. ජීවන වියදම් තත්ත්වය සලකා බලා භාණ්ඩ ස්වල්පයක් සියයට 20 තීරුවේ තබා ඇත. සීනි, දුම්කොළ හා මත්පැන් වැනි සීමිත භාණ්ඩ සංඛ්‍යාවක් තීරු තුනේ බදු ක්‍රමයෙන් පිටත විශේෂිත බදු අනුපාත යටතේ පවත්වා ගන්නා ලදී. 2000 වසර අයවැය ලේඛණය මගින් තීරු බදු ව්‍යුහය සියයට 10 සහ 25 වශයෙන් වූ තීරු දෙකේ බදු ක්‍රමයක් දක්වා තව දුරටත් ඒකාබද්ධ කිරීමට යෝජනා කරන ලද අතර කෘෂිකාර්මික නිෂ්පාදන භාණ්ඩ කීපයක සියයට 35 ක බදු ව්‍යුහයේ තව දුරටත් තබා ගැනීමට අපේක්ෂා කෙරේ. සහනදායී සියයට 5 හි තීරුව ක්‍රමයෙන් අහෝසි කරනු ලැබේ.

1998 නොවැම්බර් මස 6 වන දින සිට බලපවත්වන ලද බදු වලින් නිදහස් භාණ්ඩ ලැයිස්තුව භාණ්ඩ 39 ප්‍රමාණයෙහිම නොවෙනස්ව පැවැතිණි. අපනයන අංශය වෙත 1992 අවසාන භාගයෙහි සිටම අපනයන අංශයේ සියළුම අපනයන බදු සහ වටිනාකම අනුව පනවන බදු වලින් නිදහස් ව පැවැති අතර සමහර භාණ්ඩ සඳහා පනවන ලද අපනයන සෙස් බදු හා පුරස්කාර ආදිය 1999 දී ද නොවෙනස්ව පැවැතින.

ආනයනයන් සඳහා පැවැති 8, 12, 18 යන අනුපාතවලින් සැදුනු තීරු තුනේ පිරිවැටුම් බදු ක්‍රමය වෙනුවට 1998 අප්‍රේල් මස පළමුවන දින සිට බලපවත්වන පරිදි සියයට 12.5 ක තනි සාමාන්‍ය අනුපාතිකයකින් යුතු භාණ්ඩ හා සේවා බද්දක් පනවන ලදී. බදු ආපසු ගෙවීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම පිළිබඳව ගන්නා ලද පියවර කිහිපයක් හැරුණු විට 1999 වර්ෂය තුළ භාණ්ඩ හා සේවා බද්ද සම්බන්ධයෙන් වෙනත් කිසිදු වෙනස්කමක් සිදු නොවීය.

වර්තමාන ප්‍රතිපත්තිවල අපේක්‍ෂාවන් අනුව යමින් ජාතික වැදගත්කමක් ඇති ඉතා අත්‍යාවශ්‍ය භාණ්ඩ කීපයකට පමණක් ආනයන බදු අත්හැරීම් සීමා කරන ලදී. මෙම බදු අත්හැරීම් හා ඉවත් කිරීම් ජාතික අවශ්‍යතාවන්හිදී වැදගත්කමෙහි ලා උපකාරී වූවද මෙම අවිධිමත් බදු අත් හැරීම් ප්‍රතිපත්තිය අස්ථාවරතාවයක් ඇති කරන අතරම සරල වූත්, විනිවිද පෙනෙන්නාවූ තීරු බදු ව්‍යුහයක් ඇති කිරීමේ ක්‍රමික ක්‍රියාවලියට බාධා පමුණුවයි. ඉතා සුළු වශයෙන් කිහිප අවස්ථාවක දී හැර මෑතකදී තීරු බදු ව්‍යුහයේ ඇති වූ වෙනස්කම් වලින් අක්‍රමිකතා අවම කිරීම සඳහා පැවැති කැප වීම දකිය හැකි වේ.

1999 වර්ෂය තුළ බලපවත්වන ලද තීරු බදු අත්හැරීම් කිහිපය අතර 1998 ජනවාරි මස 13 දින සිට කොප්පරා සඳහා දෙන ලද සියයට 20 ක තීරු බදු අත්හැරීමක්ද, 1998 ජූනි මස 18 දින සිට පොල් තෙල් හැර කෑමට ගන්නා තෙල් සඳහා ලබා දුන් සියයට 30 ක බදු අත්හැරීමක්ද නොවෙනස්ව පැවතිණි. 1999 ඔක්තෝබර් මස 22 සිට දෙසැම්බර් 31 වැනි දින දක්වා සහල් සඳහා සියයට 25 ක අර්ධ වශයෙන් තීරු ගාස්තු අත්හැරීම හඳුන්වා දෙන ලදී. උත්සව සමය තුළ සැපයුමෙහි සිදු විය හැකි වෙනස්වීම් වලකා සහල්වල දේශීය මිල අඩු මිල මට්ටමක තබා ගැනීම මෙහි අරමුණ විය. පෙර වසරට වඩා යල අස්වැන්න වැඩි වූ නිසාත් (මෙට්රික් ටොන් 130,000), 1999 නොවැම්බර් දෙසැම්බර් මාස තුළ සහල් මෙට්රික් ටොන් 142,800 ක් ආනයනය කිරීම නිසාත් මෙම තීරණය නිසා වෙළඳපොළෙහි සැපයුම් අතිරික්තයක් ඇති විය. මේ අතර මෙම අරමුණ මතම 1999 ඔක්තෝබර් මස 22 වන දින සිට 1999 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා උඳු, උඳු පිටි, මෑ, පියලි කරන ලද මඳු, තෝර පරිප්පු සඳහා මුළුමණින්ම තීරු බදු අත් හැරීමක් අනුමත කරන ලදී. විශේෂ යෝජනා ක්‍රමයක් යටතේ රජයේ සේවකයන් සඳහා 1999 පෙබරවාරි 22 වැනි දින සිට ඩීසල් වාහන සඳහා සියයට 6 ක් හා පෙට්‍රල් වාහන සඳහා සියයට 19 අර්ධ වශයෙන් තීරු බදු අත්හැරීමක් හඳුන්වා දෙන ලදී.

### 9.11 වැනි සංඛ්‍යා සටහන
### සාමාන්‍ය ආනයන බදු එකතු කිරීමේ අනුපාතය (අ)

| වර්ගය | 1995 | 1996 | 1997 | 1998 | 1999(ආ) |
|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | **10.7** | **10.3** | **11.8** | **12.7** | **12.8** |
| **ආහාරපාන වර්ග** | **10.1** | **9.1** | **11.5** | **12.6** | **13.6** |
| සහල් | 35.5 | 0.3 | 6.3 | 2.4 | 16.4 |
| පිටි | - | 2.3 | - | - | - |
| සීනි | 14.6 | 15.9 | 17.8 | 20.8 | 21.3 |
| තිරිඟු හා ධාන්‍ය | - | - | - | - | 0.3 |
| කිරි හා කිරි නිෂ්පාදන | 11.5 | 11.5 | 11.8 | 11.5 | 11.6 |
| කරවල | 2.0 | 2.1 | 1.6 | 1.1 | 1.2 |
| වෙනත් මාළු නිෂ්පාදන | 4.6 | 4.2 | 4.9 | 4.8 | 4.8 |
| වෙනත් ආහාර | 18.7 | 19.0 | 17.9 | 20.5 | 19.9 |
| **ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ** | **11.8** | **12.6** | **12.2** | **12.8** | **12.0** |
| මෝටර් රථ හා සයිකල් | 21.7 | 24.3 | 24.5 | 23.6 | 20.1 |
| ගුවන් විදුලි යන්ත්‍ර හා රූපවාහිනී යන්ත්‍ර | 6.9 | 12.1 | 11.5 | 12.4 | 11.9 |
| රබර් ටයර් හා ටියුබ් | 33.6 | 32.5 | 33.5 | 32.0 | 28.4 |
| බෙහෙත් හා ඖෂධ නිෂ්පාදන | 1.5 | 1.5 | 1.3 | 0.9 | 0.6 |
| ආහාර නොවන වෙනත් ද්‍රව්‍ය | 11.1 | 10.6 | 9.4 | 10.1 | 9.1 |
| **අන්තර් භාණ්ඩ** | **9.1** | **8.0** | **5.9** | **4.7** | **4.1** |
| පොහොර | - | - | 0.1 | - | - |
| බොර තෙල් | 41.1 | 33.6 | 21.7 | 25.8 | 15.8 |
| වෙනත් ඛනිජ තෙල් | 23.4 | 24.6 | 18.7 | 16.7 | 16.1 |
| රසායන ද්‍රව්‍ය හා සංයෝග | 9.8 | 7.6 | 7.6 | 5.8 | 3.6 |
| ඩයි වර්ග පදම් කිරීමේ හා වර්ණ වර්ග | 8.8 | 8.2 | 7.1 | 7.5 | 5.3 |
| කඩදාසි හා ඝන කඩදාසි | 9.8 | 6.9 | 6.0 | 6.0 | 5.7 |
| රෙදිපිළි හා ඇඟළුම් | 1.0 | 1.1 | 0.8 | 0.1 | 0.1 |
| වෙනත් අන්තර් භාණ්ඩ | 9.2 | 5.7 | 5.2 | 4.8 | 4.1 |
| **ආයෝජන භාණ්ඩ** | **10.1** | **7.6** | **7.0** | **6.0** | **4.4** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 8.7 | 9.3 | 9.1 | 9.3 | 7.8 |
| ගමනාගමන උපකරණ | 21.6 | 18.9 | 17.3 | 11.8 | 7.4 |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 6.2 | 3.9 | 3.4 | 3.0 | 2.2 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 10.1 | 6.7 | 6.3 | 4.4 | 3.4 |
| **එකතුව** | **9.7** | **8.5** | **7.7** | **7.4** | **7.0** |

(අ) මුළු තීරුබදු එකතුව මුළු ආනයන වටිනාකමෙහි (පි.ර.ගැ.) ප්‍රතිශතයක් ලෙස
(ආ) තාවකාලිකයි

මූලයන් : ශ්‍රී ලංකා රේගුව
සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

අන්තර් භාණ්ඩ සම්බන්ධයෙන් සලකා බැලීමේදී සහනයක් සැලසීමේ අරමුණින් සීමිත තීරු බදු අත්හැරීම් ප්‍රදානය කරන ලදී. 1998 දී මහා පරිමාණයේ නිෂ්පාදකයින්ට තිරිඟු පිටි ආනයනය කරනු සඳහා හඳුන්වාදෙන ලද පූර්ණ බදු අත්හැරීම සහ රාජ්‍ය මාධ්‍ය ආයතන සඳහා මාධ්‍ය උපකරණ ආනයනය සඳහා ලබා දුන් පූර්ණ බදු අත්හැරීම 1999 වසරේදී ද ක්‍රියාත්මකව පැවතුනි. පසුව දෙන ලද සහනය 1988 දීද ප්‍රදානය කරන ලද්දේ ආයෝජන මණ්ඩලයේ වරප්‍රසාද යටතේ වාසි උද කර ගත් පෞද්ගලික මාධ්‍ය ආයතන සමග රාජ්‍ය මාධ්‍ය ආයතනවලට තරඟකාරිවීමට හැකි වනු පිණිසය.

1998 දී ක්‍රියාත්මක වූ පියලි කරන ලද හා නොකල කඩල (සියයට 35) බදු තීරුව, කරවල, පියලි හාල්මැස්සන්, වියලි ඉස්සන් (සියයට 10) බදු තීරුව, තිරිඟු (සියයට 20) බදු තීරුව, බෝ කිරීම සඳහා යොදා ගනු ලබන සජීවී සතුන් (සියයට 10) බදු තීරුව, ෆ්ලෝරසන්ට් ලාම්පු (සියයට 10) බදු තීරුව, ඉස්සන් සඳහා ආහාර, විටමින් වර්ග, මගී ප්‍රවාහනයට යොදා ගනු ලබන ආසන 15 ට හෝ ඊට වඩා වැඩි බස් රථ සඳහා (සියයට 10) තීරු ගාස්තු අත්හැරීම හා කිරි පිටි (සියයට 10), ටින් මාළු (සියයට 5) සඳහා අර්ධ වශයෙන් තීරු බදු අත්හැරීම ඉවත් කිරීමත් පුද්ගල පදනම මත ලබාදෙන ලද බදු අත්හැරීම් අඩු වීම නිසාත් බදු අත්හැරීම් හේතුකොට ගෙන රජයට අහිමි වී ගිය ආදායම 1998 පැවැති රුපියල් දශ ලක්ෂ 4,091 සිට 1999 දී රුපියල් දශ ලක්ෂ 2,258 දක්වා අඩු විය.

බදු අනුපාතය සහ බද්දට යටත් වන ආනයනයන්හි අඩු වීම පිළිබිඹු කරමින් සාමාන්‍ය ආනයන බදු අනුපාතය එනම් ආනයන බදු එකතුව සහ ගලපන ලද මුළු ආනයන අතර අනුපාතය 1998 පැවති සියයට 7.4 සිට 1999 සියයට 7.0 දක්වා පහත වැටුණි. අන්තර් භාණ්ඩ හා ආයෝජන භාණ්ඩ වලින් බද්දට යටත් වන ආනයනවල අඩු වීම පිළිබිඹු කරමින් බද්දට යටත් වන හා ආනයන හා මුළු ආනයන අතර අනුපාතය 1998 සියයට 35 සිට 1999 සියයට 34 දක්වා පහත වැටුණි. අන්තර් භාණ්ඩ කාණ්ඩය තුළ බදු අය කළහැකි ආනයනයන් සියයට 27 සිට 24 දක්වා අඩු වූ අතර ආයෝජන භාණ්ඩ කාණ්ඩය තුළ බදු අය කළහැකි ආනයනයන් සියයට 42 සිට සියයට 39 දක්වා පහත වැටුණි. 1999 වසර පුරා බලපවත්වන ලද අඩු තීරු බදු අනුපාතයෙහි බලපෑම ආයෝජන භාණ්ඩ හා අන්තර් භාණ්ඩවල සියළුම කාණ්ඩයන්වල පිළිබිඹු වී ඇත. අන්තර් භාණ්ඩ කාණ්ඩය තුළ සාමාන්‍ය තීරු බදු අනුපාතය 1998 සියයට 4.7 සිට 1999 දී සියයට 4.1 දක්වා පහත වැටුණි. එමෙන්ම 1999 වසර තුළ ආයෝජන භාණ්ඩ සම්බන්ධයෙන් වන බදු අනුපාතය සියයට 4.4 දක්වා පහත වැටුණි.

පාරිභෝගික භාණ්ඩ කාණ්ඩයෙහි ආහාර සහ පාන වර්ග හා ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ කාණ්ඩ දෙකේම ආනයන සඳහා සාමාන්‍ය තීරු බදු අනුපාතය ඉහළ නැංවිණි. ආහාර සහ පාන වර්ග කාණ්ඩයෙහි සාමාන්‍ය තීරු බදුවල ඉහළ යෑම ප්‍රධාන වශයෙන් සීනි හා සහල් ආනයනයෙන් පිළිබිඹු වේ. සීනි සඳහා වන තීරු බදු අත්හැරීම ඉවත් කිරීම සමග 1998 ජනවාරි මස 16 දින සිට විශේෂිත බදු අනුපාතයන් හඳුන්වා දීමේ ප්‍රතිඵලයක් ලෙස 1999 වසර පුරාම ඉහළ බදු අනුපාතයන් පැවැතුණි. 1998 ජනවාරි මාසය පුරා බලපවත්වන ලද සහල් සඳහා සම්පූර්ණ බදු අත්හැරීම් වෙනුවට 1999 ඔක්තෝබර් 22 දින සිට සති 10 ක කාලයක් සඳහා බලපවත්වන ලද අර්ධ වශයෙන් බදු අත්හැරීම නිසා සහල් සඳහා සාමාන්‍ය බදු අනුපාතය ඉහල මට්ටමක පැවැත්විණි. ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ සඳහා පවතින සාමාන්‍ය බදු අඩු වීම 1999 අයවැය මගින් රජයේ සේවකයන්ට මෝටර් රථ ආනයනය සඳහා අර්ධ වශයෙන් බදු අත්හැරීම මගින් නිරූපනය වේ.

## රෙදිපිළි සහ ඇඟළුම් පංගු ප්‍රමාණයන් වෙන් කිරීම

1995 හඳුන්වා දෙන ලද ක්‍රියාකාරිත්වය මත පදනම් කර ගත් පංගු ක්‍රමය 1999 දීද ක්‍රියාත්මක විය. 1999 වසරේදී පංගු කිරීම් සම්බන්ධයෙන් කිසිදු වෙනසක් සිදු නොවිණි. රෙදිපිළි පංගු මණ්ඩලය (TQB) මූලික වශයෙන් පෙර වර්ෂයෙහි අපනයන ක්‍රියාකාරිත්වය පදනම් කරගෙන සෑම අවුරුද්දක් පාසාම රෙදිපිළි පංගු වෙන් කරනු ලබයි. අතීත ක්‍රියාකාරිත්වය මත පංගු වෙන් කිරීම "ප්‍රධාන පංගු" හෝ "ක්‍රියාකාරී පංගු" වෙන් කිරීම යනුවෙන් හඳුන්වයි. ක්‍රියාකාරී පංගු හිමි අපනයනකරුවන්ට කර්මාන්තයන්හි නම්‍යතාවය ඇති කරනු වස් ප්‍රයෝජනයට නොගන්නා ලද පංගු රෙදිපිළි පංගු මණ්ඩලය හරහා වෙනත් අපනයනකරුවෙකුට ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් පැවරීමට අවසර දෙනු ලැබේ. නමුත් පංගු විකිණීමට හෝ මිලදී ගැනීමට අවසර දෙනු නොලැබේ. සියළුම කාණ්ඩ වලින් දුසිම් 4,000 වඩා අඩු පංගු ප්‍රමාණයක් ඇති කුඩා ප්‍රමාණයේ පංගු හිමියන්ට සියයට 3 ක පංගු ප්‍රමාණයක් ප්‍රමාණාත්මකව බෙද වෙන් කර ඇත. නම්‍ය කොන්දේසි යටතේ ලැබූ අළුත් පංගු වෙන්කිරීමේ දී අළුත් ආයෝජකයින්ට හා අළුත් යන්ත්‍රසූත්‍ර හා උපකරණ උපයෝගී කර සිය ධාරිතාව පුළුල් කල දනට කර්මාන්තයෙහි නියැලුන අපනයන කරුවන් සඳහා ප්‍රමුඛතාව ලබා දෙන ලදී. ක්‍රියාකාරිත්වය මත පදනම් කර ගත් පංගු වෙන් කිරීමෙන් අනතුරුව ඉතිරි පංගු ප්‍රමාණය වෙන් කිරීම සිදු කරන ලද්දේ ප්‍රධාන සංචිත පංගු ක්‍රමය යටතේ සේවක සංඛ්‍යාව පදනම් කරගෙනය. පංගු ප්‍රමාණය අදාළ නොවන රටවලට අපනයන කරන්නන්ට සහ පංගු ප්‍රමාණය අදාළ වන රටවලට පංගු ප්‍රමාණය යටතට නොගෙනෙන ඇඟළුම් වර්ග අපනයන කරන්නන්ට ප්‍රමුඛත්වය ලබා දුණි. පසුගිය වසරේ අඩු උපයෝජනයක් ඇති කාණ්ඩ "අක්‍රිය" කාණ්ඩ ලෙස නම් කල අතර ඒවා වෙන් කිරීම සිදු කරන ලද්දේ නැව්ගත කිරීම වැඩ කරන දින හතක් තුළ සිදු කළයුතුය යන කොන්දේසිය මතය.

නම්‍ය කොන්දේසි යටතේ ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය සහ කැනඩාව සඳහා ලැබී ඇති පංගු ප්‍රමාණය පිළිවෙලින් සියයට 4, සියයට 7 සහ සියයට 1 කින් වැඩි විය. ඒ අනුව 1999 වසර තුළදී ලැබී ඇති සමස්ථ පංගු ප්‍රමාණය සියයට 4 කින් වැඩි විය. සමස්ථ පංගු උපයෝජන අනුපාතය 1998 දී සියයට 74 සිට 1999 දී සියයට 80 දක්වා වැඩි වූයේ ඇමෙරිකා එක්සත් ජනපදය ලබා දුන් පංගු උපයෝජනය වැඩි වීම නිසාය. එක්සත් ජනපදය ලබා දුන් පංගු උපයෝජනය 1998 සියයට 78 සිට 1999 දී සියයට 85 දක්වා වැඩි විය. විවිධ රටවල් හා කාණ්ඩයන් අනුව පංගු උපයෝජනයෙහි පුළුල් වෙනස්කම් පෙන්වීය. ඇතැම් භාණ්ඩ සඳහා ප්‍රමාණවත් ඉල්ලුමක් නොමැති වීමත් දේශීය නිෂ්පාදකයින් වෙනත් පංගු කාණ්ඩ යටතේ හෝ පංගු යටතට නොගැනෙන ඉහළ එකතු කළ වටිනාකමක් ඇති භාණ්ඩ නිෂ්පාදනය කරනු සඳහා ස්වකීය ධාරිතාව යොද ගැනීම පංගු උපයෝජනය අඩු වීමට බලපෑ හේතුන් සමහරකි. පංගු යටතේ නොගැනෙන අපනයනයන් වැඩි වීම හා සමහර ජනප්‍රිය කාණ්ඩවල ඇඟළුම් වල උපයෝජනය පංගු ප්‍රමාණය ඉක්මවා යාම තුළින් මේ බව විද්‍යාමාන වේ. කාන්තා ඇඳුම්, කමිස හා හැට්ට, කාන්තා ගවුම්, පිරිමින්ගේ හා පිරිමි ළමුන්ගේ කමිස, පිරිමින්ගේ හා කාන්තාවන්ගේ කලිසම්, පිරිමින්ගේ කොට කලිසම්, කුඩා හා අනෙකුත් සිනිඳු තුවා සහ සාප්පු තුවා යන භාණ්ඩ සඳහා එක්සත් ජනපදය හා යුරෝපා සංගමයට අයත් රටවලින් වෙන් කරන ලද පංගු ප්‍රමාණය මුළුමණින්ම ප්‍රයෝජනයට ගත් අතර කලිසම්, කමිස යන කාණ්ඩයන්හි උපයෝජනය පංගු මට්ටම් ඉක්මවා පැවතිණි. එක්සත් ජනපදය වෙත කරනු ලබන අපනයනයන් සඳහා සමහර පුද්ගලයින් වංචනික ලියකියවිලි යොද ගැනීම මෙයට අර්ධ වශයෙන් හේතු විය.

යුරෝපා සංගමයට හා කැනඩාවට වෙන් කරන ලද පංගු ප්‍රමාණය ඉහළ ගියද පංගු උපයෝජන අනුපාතය එක්සත් ජනපදයට වඩා පහළ මට්ටමක පැවතිණි. කෙසේ නමුදු උපයෝජන අනුපාතය පෙර වසරට වඩා වැඩි විය. යුරෝපා සංගමය වෙත පිරිමින්ගේ හා කාන්තාවන්ගේ කලිසම් හා පිරිමින්ගේ කොට කලිසම්ද, කැනඩාව වෙත කලිසම්, කබා සහ කොට කලිසම්, කාන්තාවන්ගේ කමිස සහ හැට්ට හැර පංගු ක්‍රමයට ගැනෙන අනෙකුත් භාණ්ඩයන් සැළකිය යුතු අන්දමින් අඩු උපයෝජනයක් පෙන්වීය. ඇමෙරිකා එක්සත් ජනපදයට කරන ලද ඇඟළුම් අපනයනය විශාල වශයෙන් පංගු ක්‍රමය මත රැඳී පැවැති අතර, මෙම ක්‍රමය යටතේ එක්සත් ජනපදයට කරන ලද ඇඟළුම් අපනයනය සියයට 6 කින් අඩු වීම හේතුකොට ගෙන රෙදිපිළි හා ඇඟළුම් අපනයනයෙහි සමස්ථ අඩු වීම සියයට 1 ක් විය. යුරෝපා සංගමය වෙත කරනු ලබන අපනයනය පංගු උපයෝජනය අඩු මට්ටමක පැවතුනද, පංගු ක්‍රමයෙන් බැහැර වෙළෙඳ පොලවල් කරා යොමු වීම පෙන්නුම් කරමින් යුරෝපා සංගමය වෙත කරනු ලබන අපනයනය සියයට 11 කින් වැඩි විය. පංගු ක්‍රමයේ සිට පංගු වලින් තොර අපනයන වෙළඳපොළකට අවතීර්ණ වීමේ හැකියාව පෙන්නුම් කරමින් පංගු ක්‍රමයෙන් තොර රටවල් සඳහා කරන ලද අපනයනයන් 1999 වසරේදී සියයට 6 කින් වැඩි විය.

විද්‍යුත් වීසා තොරතුරු දන්වීමේ ක්‍රමයට (Electronic Visa Information System-ELVIS) අවතීර්ණ වීම 1999 වසර තුළ ශ්‍රී ලංකාවේ සිදු වූ සැළකිය යුතු වර්ධනයකි. විද්‍යුත් මාධ්‍ය ක්‍රමය තුළින් රෙදිපිළි හා ඇඟළුම් සඳහා වන මූලික සංඛ්‍යා ලේඛන එක්සත් ජනපදයෙහි රේගුව වෙත සම්ප්‍රේෂණය කිරීම සඳහා මෙය සැළසුම් කර ඇත. සංචාරයේදී පුද්ගලයන් සඳහා නිකුත් කරනු ලබන වීසා බලපත්‍ර බඳු නීත්‍යානුකූල බලපත්‍රයක් හෙවත් වීසා බලපත්‍රයක් ශ්‍රී ලංකාවෙන් එක්සත් ජනපදය වෙත අපනයනය කරනු ලබන රෙදිපිළි හා ඇඟළුම් සඳහා ගත යුතුව ඇත. ආයෝජන මණ්ඩලය හා කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය රෙදිපිළි සඳහා වීසා නිකුත් කරනු ලබති. එක්සත් ජනපදයේ සිටින ආනයනකරුවන්ට ඔවුන්ට අයත් භාණ්ඩ නිදහස් කර ගැනීම පිණිස මෙරට අපනයනකරුවන් විසින් ලියකියවිලි යැවිය යුතුව ඇත. ව්‍යාජ ලියකියවිලි ඉදිරිපත් කිරීම, වැරදි සහගත

අත්සන් යෙදීම නීත්‍යානුකූල නොවන මාර්ග අනුගමනයටද මෙම ක්‍රමය තුලින් අවකාශය සැලසෙනු ඇත. රෙදිපිළි හා පංගු මණ්ඩලය මෙම ව්‍යාජ වීසා ක්‍රමයන් මෑත අවුරුදුවල වර්ධනය වූ බව අවබෝධ කර ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම දුෂ්කරතාවයන් මග හැරවීම සඳහා ශ්‍රී ලංකාව මෙම විද්‍යුත් වීසා තොරතුරු දැන්වීමේ ක්‍රමයට සම්බන්ධ විය. වීසා නිකුත් කිරීමෙන් පසුව සම්ප්‍රේෂණය කරනු ලබන "එල්විස්" පණිවිඩයෙහි හඳුනාගැනීම සඳහා වූ වීසා අංකය, නිකුත් කරන ලද දිනය, කාණ්ඩය, ප්‍රමාණය හා ඒකකය, නිෂ්පාදකයාගේ නම හා ලිපිනය හා ඔවුන් හඳුනා ගැනීමේ සංකේතය හා මිලදී ගන්නන්ගේ නම හා ලිපිනය හඳුනා ගැනීමේ සංකේතයද අඩංගු වේ. අදළ තොරතුරු රෙදිපිළි පංගු මණ්ඩලය විසින් එක්සත් ජනපදයෙහි රේගුව වෙත විද්‍යුත් ක්‍රම මගින් සම්ප්‍රේෂණය කරනු ලබන අතර එක්සත් ජනපදයෙහි මිලදී ගන්නවුන් විසින් සපයනු ලබන තොරතුරු එම දත්තයන් සමග ගැලපෙන්නේ නම් පමණක් නැව් ගත කල භාණ්ඩ සමූහය නිකුත් කරනු ලබයි. ශ්‍රී ලංකාව විද්‍යුත් වීසා තොරතුරු දැන්වීමේ ක්‍රමය හඳුන්වා දීමේ මුල් අවස්ථාවේදී ලියවිලි වලින් සමන්විත වීසා ක්‍රමය හා විද්‍යුත් වීසා හා තොරතුරු දැන්වීමේ ක්‍රමයද යන ද්විත්ව ක්‍රමයම ක්‍රියාත්මක කරනු ලැබේ. වෙනස් වීමට භාජනය වන මෙම කාලය තුළදී පැරණි ක්‍රමය තුළින් ලැබෙන දත්තයන් නව ක්‍රමය තුළින් ලැබෙන දත්තයන් සමග රේගුවෙන් භාණ්ඩ නිදහස් කිරීමේදී සැසඳිය යුතුව ඇත. මෙම ක්‍රමය මුළුමණින්ම ක්‍රියාත්මක වූ විට අපනයනකරුවන් රෙදිපිළි පංගු මණ්ඩලය සහ එක්සත් ජනපද රේගුව නව ක්‍රමය මගින් සම්බන්ධ වීම තුළින් අපනයනකරුවන්ගේ කාර්යාල වලින් රෙදිපිළි පංගු මණ්ඩලයට හා එමගින් එක්සත් ජනපදය රේගුව වෙත තොරතුරු සම්ප්‍රේෂණය කිරීමට ඉඩකඩ සැලසේ.

ශ්‍රී ලංකාව තුළ විද්‍යුත් වීසා තොරතුරු දැන්වීමේ ක්‍රමය ක්‍රියාත්මක වීමෙන් සැලසෙන ව්‍යාජ ලියකියවිලි වලින් බැහැර වීම මෙන්ම වාසිදයක ක්‍රමයට අමතරව අපනයන කර්මාන්තය විද්‍යුත් යුගයකට පිවිසීමේ අවස්ථාවද උදවනු ඇත. අපනයනකරුවන්ට වීසා ලබා ගැනීම හා එක්සත් ජනපදය රේගුව භාණ්ඩ නිදහස් කිරීම ඉතා කෙටි කාලයක් තුළදී සිදු කිරීමට මෙම ක්‍රමය මගින් ඉඩ සලසනු ඇත. මෙම ක්‍රමය මුළුමණින්ම ක්‍රියාත්මක කිරීමෙන් අපනයනකරුවන්ට ඔවුන්ගේ කාර්යාලවල සිටම අදළ විස්තර ලබා ගත හැකි වේ. පංගු උපයෝජනයට අදළ විස්තර ක්ෂණිකව අළුත් වන බැවින් රෙදිපිළි පංගු මණ්ඩලයට පංගු උපයෝජනයට ගැනීම මනා ආකාරයෙන් මෙහෙයවිය හැකි අතර ඉතිරි පංගු ප්‍රමාණය වඩා කායෂීක්ෂම අයුරෙන් බෙද වෙන් කිරීමට හැකි වනු ඇත. ව්‍යාජ ලියකියවිලි භාවිතය අවම වීම, අපනයන ලේඛන සරල වීම, වීසා නිකුත් කිරීමේ කායෂීක්ෂම බව වැඩි වීම, නිවැරදි බව, ප්‍රවෘත්ති සම්ප්‍රේෂණයෙහි ආරක්ෂාකාරී බව හා විශ්වාසනීයත්වය, එක්සත් ජනපදය වෙත ලැබෙන ආනයනයන් නිදහස් කිරීමේ වැඩපිළිවෙල වේගවත් වීම මෙම විද්‍යුත් වීසා තොරතුරු දැන්වීමේ ක්‍රමය මුළුමණින්ම ක්‍රියාත්මක වීමත් සමග සිදුවනු ඇත.

## අපනයන කරුවන් සඳහා දිරිගැන්වීම්

අපනයනකරුවන් හා ඔවුන්ගේ දක්ෂතාවයන් ඉලක්ක කර ගනිමින් 1999 අයවැයෙන් යෝජනා කරන ලද දිරි ගැන්වීම් රජය මගින් 1999 වසරේදී ක්‍රියාත්මක කරන ලදී. සියයට 15 ක අනුග්‍රාහක ආදයම් බද්දක් සහ පුහුණු පහසුකම් පිහිටුවීම සඳහා තීරු ගාස්තු වලින් තොර පහසුකම් ආයෝජන මණ්ඩලයට අයත් කර්මාන්තශාලා වෙත සපයනු ලබයි. ඇඟළුම්, මැණික්, ස්වර්ණාභරණ, විද්‍යුත් හා පරිගණක මෘදුකාංග වැනි අංශ සඳහා පුහුණු කටයුතු පිණිස පෞද්ගලික අංශයේ ආයෝජන තවදුරටත් උනන්දු කරවනු සඳහා පුද්ගලයන් 300 අවම වශයෙන් පුහුණුව ලබන පුහුණු ආයතන සඳහා සියයට 5 ක අයබදු විරාමයක් 1999 අයවැය ලේඛණයෙන් ප්‍රකාශ කරන ලදී.

ප්‍රාදේශීය කාර්මීකරණයෙහි ලා ආයෝජකයින් දිරි ගන්වනු වස් 1999 අයවැයෙන් ආයෝජන මණ්ඩලය සඳහා වූ දිරිගැන්වීම සමූහය තවත් වසරකට දීර්ඝ කරන ලදී. 1999 දෙසැම්බර් මස 31 වැනි දිනට පෙර නොදියුණු ප්‍රදේශවල සිය කර්මාන්තයන් පිහිටුවනු ලැබූ කර්මාන්තකරුවන්ට බදු විරාමය, ප්‍රාග්ධන භාණ්ඩ හා අමු ද්‍රව්‍ය සඳහා ආනයන තීරු බදු අත් හැරීම, විනිමය පාලන පනත බලපැවැත්වීමෙන් නිදහස් වීම වැනි ආයෝජන මණ්ඩලය වෙත පිරිනැමෙන දිරි ගැන්වීම් බලපවත්වනු ඇත.

1996 අයවැය ලේඛනය මගින් එවකට පැවති හා නව කර්මාන්ත සඳහා දියුණු ශිල්ප ක්‍රම උපයෝජනය කර ගැනීමට ආයෝජකයින් උනන්දු කිරීම සඳහා හඳුන්වා දෙන ලද දිරි ගැන්වීම් 1998 අයවැය ලේඛනය මගින් තවත් අවුරුදු දෙකක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. රුපියල් දශ ලක්ෂ 4 කට වඩා වැඩි ආයෝජනයක් කරනු ලබන නව සමාගම්ද, රුපියල් දශ ලක්ෂ 1 කට වඩා ආයෝජනය කරනු ලබන පවත්නා සමාගම්ද උදෙසා මෙම ව්‍යාපෘතිය යටතේ තීරු බදු රහිත ආනයනයන් සඳහා අනුමැතිය ලැබී ඇත. කුඩා කර්මාන්ත සඳහා යන්ත්‍රසූත්‍ර ආනයන කරනු සඳහා පහසුකම් සලසනු පිණිස මෙම ක්‍රමය යටතේ පැවැති අවම ආයෝජනයන්ගේ අවශ්‍යතාවය 1999 අයවැය ලේඛනය මගින් ඉවත් කරන ලදී.

## අපනයනකරුවන් සඳහා ආයතනික පහසුකම්

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, අපනයන සංවර්ධන අධිකාරීන්, අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව හා අනෙකුත් අදළ අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන මගින් අපනයනකරුවන් ආයතනික පහසුකම් ලබා ගන්නා ලදී. සම්ප්‍රදයික අපනයන සංවර්ධනය කරනු සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් පහසුකම් සපයන ලදී. සම්ප්‍රදයික නොවන අපනයනයන් වර්ධනය කිරීම හා දිරි ගැන්වීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය ප්‍රධාන කාර්යයන් කීපයක් ඉටු කරන ලදී. නිෂ්පාදනය වැඩි දියුණු කිරීම, විවිධාංගිකරණය කිරීම, ගුණාත්මක බව

**විශේෂ සටහන 5**

# විද්‍යුත් වාණිජ්‍යයේ ශක්තිය ප්‍රයෝජනයට ගැනීම සඳහා සූදනම් වීම

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු ඉටු කිරීම සඳහා අන්තර්ජාලය (Internet) භාවිතයට ගැනීම හැඳින්වීම සඳහා පොදුවේ භාවිතා වන්නේ විද්‍යුත් වාණිජ්‍ය (e-commerce) යන පදයයි. විද්‍යුත් වාණිජ්‍ය සියුම් ලෙස නිර්වචන කළහොත් එය අන්තර්ජාලය යොදා ගනිමින් ඉටු කරන අලෙවි කටයුතුවලට පමණක් සීමා වේ. ඒ අනුව, විද්‍යුත් වාණිජ්‍ය යනු අන්තර්ජාලය පදනම් වූ ව්‍යාපාරයන්හි (e-business) පුළුල් ක්‍රියාකාරකම්වලින් එක් කොටසක් පමණි.

ව්‍යාපාරික ආයතන විද්‍යුත් වාණිජ්‍ය අවම වශයෙන් අරමුණු දෙකක් සඳහා යොදා ගනිති. එනම්, පාරිභෝගිකයන්ට නිෂ්පාදන අලෙවි කර ගැනීම හා සැපයුම් දාමය පාලනය කිරීම සඳහා වේ. සැපයුම් දාමය කළමනාකරණය යනු පරිගණකය මත පදනම් වූ භාණ්ඩ තොග පාලනයයි. අමු ද්‍රව්‍ය හා නිමි ද්‍රව්‍ය යන දෙකොටසම මේ යටතට ගැනේ. පාරිභෝගිකයන් අන්තර්ජාලය පදනම් වූ ව්‍යාපාර පහසුකම් භාණ්ඩ හා සේවා ලබා ගැනීම, බිල්පත් ගෙවීම හා තොරතුරු ලබා ගැනීම සඳහා භාවිතා කරති. මහජනතාවට පහසුකම් සැලසීමේ හා පාලනය කිරීමේ ලා අවශ්‍ය පිරිවැය කපා හැරීමට හා නිලධාරිවාදය අවම කිරීමට රජයට විද්‍යුත් ව්‍යාපාර කටයුතු භාවිතා කළහැක. ඒ අනුව අන්තර්ජාලය පදනම් වූ ව්‍යාපාරයන්, විද්‍යුත් වාණිජ්‍ය, විද්‍යුත් බැංකුකරණය (e-banking), විද්‍යුත් මහ බැංකුකරණය (e-central banking) හා විද්‍යුත් පරිපාලනය (e-governance) යනුවෙන් කොටස් කිහිපයකට බෙදේ. අන්තර්ජාලය පදනම් වූ ව්‍යාපාරයන්හි මූලික ලක්ෂණ වනුයේ පහසුව, කාර්යක්ෂමතාවය, සරලබව හා විනිවිද පෙනෙන සුළු බවයි. අන්තර්ජාලය මත පදනම් වූ ව්‍යාපාරික කටයුතුවල සාර්ථක භාවය රඳා පවතින්නේ ආයතනයේ කටයුතු විශ්ලේෂණයට, තාර්කීකරණයට හා ව්‍යාපාර කටයුතු ඒකාබද්ධ කිරීමට ව්‍යාපාරය සතු හැකියාව මත වේ.

අන්තර්ජාලය හා අන්තර්ජාලය මත පදනම් වූ ව්‍යාපාරික කටයුතුවල දියුණුවේ ඉතිහාසය දෙස බලනවිට එය ඇමරිකා එක්සත් ජනපද රජය, විශ්ව විද්‍යාල හා පෞද්ගලික ආයතනවල සාමූහික ප්‍රයත්නයේ ප්‍රතිඵලයක් බව පැහැදිලි වේ. මෙම තාක්ෂණය සඳහා වූ මූලික ඉල්ලුම ඇති කළේද, ඒ සඳහා අවශ්‍ය වූ අරමුදල් සැපයුවේද ඇමරිකා එක්සත් ජනපද රජයයි. විශ්ව විද්‍යාල වලින් සපයන ලද තාක්ෂණික දැනුම හා පෞද්ගලික අංශයේ වාණිජමය ඇල්ම හා ව්‍යවසායකත්වය මෙම සංවර්ධන ක්‍රියාදාමය වේගවත් කරන ලදී. අන්තර්ජාල තාක්ෂණය පහසුවෙන් ලබා ගැනීමට හැකියාව ලැබෙත්ම හා එය ව්‍යාපාර කටයුතු කිරීමේ ජනප්‍රිය මාධ්‍යයක් බවට පත්වෙත්ම, රජය තාක්ෂණය සැපයුමෙන් ඉවත් වූ නමුදු ඒ සඳහා අවශ්‍ය නෛතික, අධීක්ෂණ හා ආරක්ෂණ යාන්ත්‍රනය සැපයුමෙන් හා අන්තර්ජාලය මත පදනම් වූ ව්‍යාපාරවලට පහසුකම් සැලසීමෙන් හා අදාළ නීති සංශෝධනය කිරීමෙන් ඒ සඳහා සුදුසු පසුබිම දියුණු කිරීමේ යෙදුනි.

ඇමරිකා එක්සත් ජනපද රජයේ ආරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ වූ උසස් පර්යේෂණ ව්‍යාපෘති ඒජන්සිය (Advanced Research Project Agency (ARPA)) ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රධාන විශ්ව විද්‍යාල හතරක් හා සම්බන්ධව අර්පානෙට් (ARPANET) පිහිටුවීමෙන් පටන් ගත් අන්තර්ජාලයේ ආරම්භය 1969 දක්වා පසුපසට දිවේ. පරිගණක ජාලය (Network) දියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව 1968 දී උසස් පර්යේෂණ ව්‍යාපෘති ඒජන්සිය මගින් බෝල්ට් බර්නෙක් හා නිව්මන් (Bolt Berneck and Newman (BBN)) නමැති පෞද්ගලික සමාගමකට ප්‍රදානය කරන ලදී. අර්පානෙට් පිහිටුවීමේ න්‍යායාත්මක පදනම ඇමරිකාවේ මැසචුසෙට්ස් තාක්ෂණික ආයතනයේ (Massachusetts Institute of Technology) ලෙනාර්ඩ් ක්ලෙයින්රොක් (Lenoard Kleinrock) හා ජේ.සී.ආර්.ලික්ලයිඩර් (J.C.R.Licklider) විසින් පිළිවෙලින් 1961 හා 1962 කරනු ලැබූ පර්යේෂණයන්ගේ ප්‍රතිඵල මත පදනම් විය.

බෝල්ට් බර්නෙක් හා නිව්මන් සමාගමේ රේ තොම්ප්සන් (Ray Thomson) විසින් 1972 දී ප්‍රථම ඉලෙක්ට්‍රොනික තැපැල (E-mail) නිර්මාණය කරන ලදී. විවිධ පරිගණක ජාලයන් සම්බන්ධ කිරීමට සන්ධානයක් (Protocol) දියුණු කිරීමේ වැඩ කටයුතු 1973 දී පටන් ගැණින. කල්යත්ම මෙම සන්ධානය විකාශණ පාලන සන්ධානයක්/අන්තර්ජාල සන්ධානයක් (Transmission Central Protocol/Internet Protocol) නමින් හැඳින්වූ අතර, එය වත්මන් අන්තර්ජාලයේ භාවිතා වන සන්ධානයන්ගේ ආරම්භය විය. 1979 දී අධ්‍යාපනික සමාජය වටා මහා පරිමාණ පරිගණක සම්බන්ධ කිරීම සඳහා අයි.බී.එම්. සමාගම බිට්නෙට් (Because Its Time Network (BITNET)) නිර්මානය කරන ලදී. 1981 දී ඇමෙරිකානු ජාතික විද්‍යාත්මක පදනම (National Science Foundation (NSF)) වාණිජමය නොවන පරිපාලන හා පර්යේෂණ කටයුතු සඳහා භාවිතා කිරීමට පරිගණක ජාලයක් නිර්මාණය කළේය. මෙම දියුණුවීම් සමග 1985 වනවිට අන්තර්ජාලය විශාල ප්‍රමාණයක පර්යේෂකයන් හා නිර්මානකරුවනට ප්‍රයෝජනවත් වන තාක්ෂණයක් ලෙස හොඳින් ස්ථාපිතව තිබුණු අතර, එදිනෙදා

සන්නිවේදන කටයුතුවලට පරිගණක සමාජයට පරිබාහිර අතිකුත් පුද්ගලයන් විසින්ද යොදගෙන තිබිණි. ජාතික විද්‍යාත්මක පදනම තවදුරටත් තම පරිගණක ජාලය වැඩි දියුණු කල අතර, 1995 දී පරිගණක භාවිතා කරන්නන් සෘජුවම සිය පරිගණක ජාලයට ප්‍රවේශ වීම වලක්වා එම ප්‍රවේශය භාවිතා කරන්නන්ට අලෙවි කිරීම සඳහා සමාගම් 4 ක් සමහ ගිවිසුමකට එළඹෙන ලදී. ඒ අනුව 1969 දී අන්තර්ජාල ග්‍රාහකයන් සිව් දෙනෙකු වැනි ඉතා සුළු මට්ටමකින් ආරම්භ වූ අන්තර්ජාලය, 1999 වනවිට ග්‍රාහකයන් දශ ලක්ෂ 30 කටත් වඩා වැඩි කිරීමට තාක්ෂණයේ දියුණුව, රාජ්‍ය අනුග්‍රහය හා වාණිජකරණය හේතු විය. අන්තර්ජාලය භාවිතා කරන්නන් හා වැඩි දියුණු කරන්නන් අතර වූ අඛණ්ඩ අදහස් හුවමාරුව, සම්මන්ත්‍රණ හා වැඩමුළු යනාදිය තුළින් අන්තර්ජාලය වාණිජකරණය කිරීම ජනප්‍රිය විය. පෞද්ගලික පරිගණකජාල සේවාවන් හා අන්තර්ජාල තාක්ෂණය යොදවමින් නිපදවූ වාණිජ භාණ්ඩ වැඩි දියුණු කිරීම වාණිජකරණයට අයත් විය.

ඇමරිකා එක්සත් ජනපදය පමණක්නොව අතිකුත් රටවල්ද ඉතා ඉක්මණින් නව අන්තර්ජාල තාක්ෂණය වැළඳගත් අතර, විද්‍යුත් වාණිජකරණයේ හැකියාවන්ගෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට අවශ්‍ය පසුබිම සකස් කිරීමට පටන් ගත්හ. උදහරණයක් ලෙස අසල්වැසි ඉන්දියාව තොරතුරු තාක්ෂණ සඳහා අමාත්‍යාංශයක් පිහිටුවා ඒ හා අදළ නීති සංශෝධනය කල අතර, අඩු පිරිවැයකට අන්තර්ජාලය හා සම්බන්ධ යටිතල පහසුකම් ලබා දීමට සැලසුම් කළහ.

රටවල් අතර විද්‍යුත් වාණිජ්‍යය භාවිතය වැඩිවත්ම ඒ හා අදළ ප්‍රමිතීන් හා නීති හා කෙටුම්පත් සකස් කිරීමට ජාත්‍යන්තර සංවිධාන මැදිහත් විය. ඒ අතර, ලෝක වෙළෙඳ සංවිධානය (World Trade Organization) පරිපාලනය, වාණිජ්‍ය හා ප්‍රවාහනයට අදල ක්‍රියා මාර්ග හා ව්‍යවහාරයන් සඳහා පහසුකම් සැලසීම සඳහා වූ එක්සත් ජාතීන්ගේ මධ්‍යස්ථානය හා ක්‍රම උපාය හා ජාත්‍යන්තර ප්‍රමිති මධ්‍යස්ථානය (Center for Strategic and International Standards) මීත් සමහරකි.[1]

ශ්‍රී ලංකාවේ පුද්ගලික අංශයේ විද්‍යුත් වාණිජ කටයුතු යම් ප්‍රමාණයකට සිදු වන නමුදු, අඩු වියදමකින් යුත් දුරකථන සන්නිවේදන පහසුකම්, නීති කෙටුම්පත් හා ආරක්ෂක විධිවිධාන වැනි ඒ හා අත්‍යවශ්‍ය මූලිකාංග තවමත් සම්පූර්ණයෙන්ම දියුණු වී නැත. ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශය විද්‍යුත් වාණිජයට මග පෙන්වූ විද්‍යුත් දත්ත හුවමාරුව (Electronic Data Interchange) ඉතා විශාල ලෙස භාවිතා කරයි. විද්‍යුත් දත්ත හුවමාරුවේදී මෙහෙයුම් පථයක් ලෙස අන්තර්ජාලය භාවිතා නොවන අතර, පෞද්ගලික පරිපථ ඒ සඳහා යොදු ගනී. ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන විද්‍යුත් දත්ත හුවමාරුව විශාල වශයෙන් මූල්‍ය සේවාවන් සැපයීම සඳහා භාවිතා කරයි. ලෝක ව්‍යාප්ත අන්තර් බැංකු මූල්‍ය තොරතුරු හුවමාරු කිරීමේ පද්ධතිය (SWIFT) භාවිතයෙන් අරමුදල් හුවමාරුව, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සේවාව හා පාරිභෝගික බැංකු ක්‍රමය එම සේවාවන් අතර වේ.

තොරතුරු තාක්ෂණය සංවර්ධනය කිරීම සඳහා කටයුතු කරන්නේ තොරතුරු තාක්ෂණ කවුන්සලයයි (CINTEC). එය විද්‍යා හා තාක්ෂණික අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. අන්තර්ජාලය මත පදනම් වූ ව්‍යාපාරික කටයුතු හා විද්‍යුත් වාණිජ ප්‍රවර්ධන කටයුතු සිදු කරන්නේ අභ්‍යන්තර හා අන්තර්ජාතික වාණිජ හා ආහාර අමාත්‍යාංශය හා එහි අනුබද්ධ ආයතනයක් වන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය මගිනි.

විද්‍යුත් වාණිජ්‍යයේ සාර්ථකත්වය සඳහා අංශ කිහිපයක සහයෝගීතාවය අවශ්‍ය වේ. අඩු වියදමකින් ලබා ගත හැකි පුළුල්ව පැතිරුණු විදුලි සංනිවේදන පහසුකම් වැනි යටිතල පහසුකම් ඇති කළ යුතුය. පාරිභෝගික ආරක්ෂණය, පෞද්ගලිකත්වය හා ගණුදෙනුවේ සුරක්ෂිතභාවය හා අදල මිනුම් දඬු ඇති කිරීම අවශ්‍ය වේ. දිගු කාලයේදී විද්‍යුත් වාණිජ්‍ය භාවිතා කරන්නන්ගේ ගුණාත්මක භාවය හා ජනතාවගේ බුද්ධිමය හැකියාවන් දියුණු කිරීම අවශ්‍ය වේ. ඒ අනුව විද්‍යුත් වාණිජ්‍ය නගා සිටුවීමේදී රජයට සැළකිය යුතු කාර්ය භාරයක් ඉටු කිරීමට තිබේ. විදුලි සංනිවේදන කටයුතු හා අදල නීති රීති ලිහිල් කිරීම නිසා ඉහළ තරගකාරිත්වය තුළින් අඩු වියදමකින් පුළුල්ව පැතිරුණ විදුලි සංනිවේදන පහසුකම් ලබා ගැනීමට මග පැදෙනු ඇත. පවත්නා නීති සංශෝධනය හා විද්‍යුත් වාණිජයට පහසුකම් සලසන නව නීති කෙටුම්පත් සම්පාදනය අවශ්‍ය වේ. අන්තර්ජාලය මගින් සිදු කෙරෙන ගණුදෙනු සඳහා ආරක්ෂාව සැපයුමට අදළ තාක්ෂණය (encryption technology) වර්තමානයේ ක්‍රමයෙන් සකස් වෙමින් පවතී. අන්තර්ජාලය පදනම් කරගෙන සිදු කරන ගණුදෙනු සඳහා ආරක්ෂාව සැපයුමට තෙවැනි පාර්ශවයක් හෝ සහතික කළහැකි නියෝජිතයෙකු අවශ්‍ය වේ. එවැනි පහසුකම් සැළසිය යුත්තේ රජයේ ආයතනයක් මගිනි. රජයට එහි පිළිවෙත් හා ක්‍රියාකාරකම් නැවත සකස් කර ගැනීමට විද්‍යුත් වාණිජ්‍යය යොදගත හැක. මෙමගින් විද්‍යුත් වාණිජ්‍යය සඳහා දේශීය ඉල්ලුම වැඩිවීමට හේතු වන අතර පෞද්ගලික අංශය ආරම්භ කරන කටයුතු මත උද්දීපනාත්මක බලපෑමක් ඇති කරයි.

1 WWW.gjic.org හා එක්සත් ජාතීන්ගේ, UN/EDIFACT ප්‍රමිතියයි.

වර්ධනය කිරීම, තාක්ෂණික හැකියාව හා නිෂ්පාදනය වර්ධනය කිරීම, සුරක්ෂිත ලෙස ඇසිරීම හා උසස් අපනයන තත්ත්වයක් අත්පත් කර ගැනීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය උපදෙස් දෙනු ලැබේ. එමෙන්ම අපනයන කරුවන්ට නව වෙළඳපොළ වෙත ඇතුල් වීමටත්, දැනට පවත්නා වෙළඳපොළ එලෙසින්ම පවත්වා ගැනීමටත් මෙම ආයතනය උදව් කර ඇත.

ශ්‍රී ලංකා ණය රක්ෂණ සංස්ථාව මගින් ණය රක්ෂණය හා ඇපකර සැපයීමේ සේවාව සිදු කරන ලදී. අනෙකුත් අදාළ ආයතන විශේෂයෙන්ම විදේශීය කටයුතු අමාත්‍යාංශය, අභ්‍යන්තර හා ජාත්‍යන්තර වෙළඳ හා ආහාර අමාත්‍යාංශය මගින් ද්විපාර්ශ්වික, කලාපීය හා බහු පාර්ශ්වීය සංවිධාන යටතේ ලබා ගත හැකි පහසුකම් පිළිබඳව අපනයනකරුවන් උනන්දු කිරීම සිදු කල අතර, ශ්‍රී ලංකාවේ අපනයන සහ විදේශීය ගැණුම්කරුවන් අතර සම්බන්ධතා ගොඩ නගා ගැනීමට උපකාරී විය. වාණිජ මණ්ඩලය පෞද්ගලික අංශයෙහි ව්‍යාපාර සංවිධාන අපනයනකරුවන් සඳහා ආයතනික පහසුකම් සපයන ලදී.

අපනයන සංවර්ධන මණ්ඩලයෙහි තාක්ෂණික හා කුසලතා සංවර්ධන වැඩපිළිවෙල යටතේ විශේෂ වූ සම්මන්ත්‍රණ සහ සාමාන්‍ය වැඩමුළු ඇතුළත් වැඩපිළිවෙලවල් 111 ක් පවත්වන ලදී. 1999 වසර තුළ ශ්‍රී ලංකාවෙහි අපනයනකරුවන් භාණ්ඩ විශේෂ හා පොදු ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන 35 කට සහභාගී වීම සඳහා සංවිධානය කළේය. මීට අමතරව, පිලිපීනය, ජපානය, පකිස්ථානය, හංගේරියාව, ඉන්දියාව, ස්කැන්ඩිනේවියානු කලාපය යන රට වලින් මිලදී ගැනීම් සඳහා දූත පිරිස් ගෙන්වීමටද චිලි හා දකුණු ඇමෙරිකාව යන රට වලින් භාණ්ඩ විකිණීම සඳහා දූත පිරිස් කැඳවාගෙන යාමද සංවිධාන කළහ. මේ අතර පකිස්ථානය, මාලදිවයින, ඔස්ට්‍රේලියාව, රුසියාව, ඉන්දියාව, සිංගප්පූරුව, ජපානය, මැදපෙරදිග සහ යුගෝස්ලෝවියාව යන රටවල වෙළඳ විමසීම් 43 ක් සඳහා විස්තර සපයන ලදී. එමෙන්ම අපනයන සංවර්ධන මණ්ඩලය විද්‍යුත් වෙළඳම ප්‍රචලිත කරනු සඳහා සැලකිය යුතු උත්සාහයක් දැරීය. අපනයන සංවර්ධන මණ්ඩලයෙහි "සයිබර් ට්‍රේඩර්" යනුවෙන් හඳුන්වනු ලබන විද්‍යුත් ව්‍යාපාරික අංශය 1999 මැයි මස ආරම්භ කරන ලදී. වෙළඳම පිළිබඳ විස්තර, වෙළඳම පිළිබඳ නීති රීති හා වෙළඳ අවස්ථා පිළිබඳව කරුණු දැන ගැනීමට ලෝක අන්තර් ජාලය තුළින් අවකාශ ලැබුණි. ගාල්ල, මාතර හා හම්බන්තොට යන නගරවල විද්‍යුත් වෙළඳම පිළිබඳව මධ්‍යස්ථානයන් පිහිටුවනු ලැබීය. "රොටර්ඩෑම්" හා "මාලේ" යන නගරවල පිහිටි අපනයන සංවර්ධන මණ්ඩලයෙහි එතෙර ශාඛා මගින් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය හා සේවාව වැඩි දියුණු කිරීම නිසා එම ප්‍රදේශවල ආයෝජකයින් පොළඹවා ගැනීමට හැකි විය.

ගුවන් මගින් හා නැව් මගින් භාණ්ඩ යැවීම හා අන්තරාළ වෙළෙඳම පිළිබඳව අපනයනකරුවන්ට විවිධ ගැටළු ඇති වනවිට ඒවාට පිළියම් යෙදීම හා උපදෙස් දීම අපනයන සංවර්ධන මණ්ඩලය මගින් නොකඩවා සිදු කෙරිණි. කොළඹ පවත්වන ලද ණය නිපුන ප්‍රදර්ශනයට සහභාගී වීම සඳහා කුඩා හා මධ්‍යම ප්‍රමාණයෙහි කර්මාන්ත ව්‍යාපාරකයින් 24 දෙනෙකු සඳහා පහසුකම් සැලසිණි. ජපානයෙහි බාහිර වෙළඳ සංවිධානයෙහි (Japanese External Trade Organisation) ආධාර ඇතිව ලංකාවෙහි නිෂ්පාදන ආදර්ශයන් ප්‍රදර්ශනය කරන ලද ජපන් සමාගම් 5 ක් උදෙසා ප්‍රදර්ශනයක් සංවිධානය කරන ලදී.

ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව මගින් අපනයන වර්ධනය සඳහා අපනයන රක්ෂණ ආවරණය සහ ඇපකර නිකුත් කිරීම වැනි සේවා නොකඩවා සිදු කරන ලදී. 1999 වසර අවසන් වනවිට රක්ෂණ ඔප්පු 224 ක් ක්‍රියාත්මක වූ අතර රුපියල් දශ ලක්ෂ 1,736 වටිනා අපනයනයන් සඳහා 1999 වසර අවසන් වනවිට ආරක්ෂණය ලබා දී තිබුණි. වර්ෂය පුරා රුපියල් දශ ලක්ෂ 262 ක් වටිනා රක්ෂණ ඔප්පු 37 ක් නිකුත් කර තිබුණ අතර 1998 වසරේදී රුපියල් දශ ලක්ෂ 476 ක් වටිනා රක්ෂණ ඔප්පු 60 ක් නිකුත් කර තිබුණි. භාණ්ඩ හා සේවා බද්ද හේතු කරගෙන වාරිකය ඉහළ යෑම රක්ෂණ ඔප්පු නිකුත් කිරීම අඩු වීමට බෙහෙවින් හේතු විය. 1998 වසර තුළ රුපියල් දශ ලක්ෂ 2,132 ක් වටිනා ඇපකර 1,477 ක් වෙනුවට 1999 වසරේදී රුපියල් දශ ලක්ෂ 2,045 ක් වටිනා බැංකු ඇපකර 1,392ක් ක්‍රියාත්මකව පැවැතුණි. බැංකු ඇපකර යටතේ ප්‍රාරක්ෂණය කල නව ආයතන සංඛ්‍යාව සියයට 32 කින් වැඩි වූ අතර වටිනාකම සියයට 45 කින් වැඩි විය. 1998 වසර තුළ ප්‍රාරක්ෂණය කරන ලද රුපියල් දශ ලක්ෂ 145 ක් සඳහා වන අළුත් බැංකු ඇපකර 144 වෙනුවට 1999 වසර තුළ රුපියල් දශ ලක්ෂ 210 ක් වටිනා අළුත් ඇපකර 190 ක් නිකුත් කිරීම මෙයට හේතු විය. රක්ෂණ ඔප්පු හා ඇපකර යටතේ ගෙවන ලද හිමිකම් ප්‍රමාණය 1998 වසරේදී රුපියල් දශ ලක්ෂ 8.6 ක් වූ අතර මෙය 1999 වසරේදී රුපියල් දශ ලක්ෂ 6.4 ක් විය. අපනයනකරුවෝ 24 ක් සඳහා අපනයන ණය රක්ෂණ සංස්ථාව රුපියල් දශ ලක්ෂ 9.2 ක් වටිනා ඇපකර නිකුත් කළේය. 1999 වසර තුළ කුඩා ප්‍රමාණයේ ආනයනකරුවන් සඳහා රුපියල් දශලක්ෂ 18 ක් වටිනා අපනයන ගෙවීම් සඳහා රක්ෂණ ඔප්පු නිකුත් කළේය. එමෙන්ම 1999 මැයි මස තුළ අපනයන සේවාවන් ආරක්ෂණය කරනු සඳහා විස්තරාත්මක ඔප්පු සැපයීමේ ව්‍යාපෘතියක් සංස්ථාව ආරම්භ කර ඇත. මෙම පහසු ලැබීම් සඳහා මෘදුකාංග, වෘත්තීය සේවා හා ඉදි කිරීම් අංශය සුදුසුකම් ලබයි. එතෙර මිලදී ගන්නවුන්ගේ නොගෙවා හැරීම් හා ගෙවීම් ප්‍රමාද වීම මෙම රක්ෂණ ඔප්පුව මගින් ආවරණය වේ. මෘදුකාංග ආවරණය සඳහා රුපියල් දශ ලක්ෂ 173 ක වටිනාකමකින් යුතු මෙබඳු බදු රක්ෂණ ඔප්පු දෙකක් නිකුත් කර ඇත.

ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර නිදහස් වෙළඳ ගිවිසුම, ප්‍රවාහන ගැටළු හා ඒවාට විසඳුම්, පරිපාලන කුසලතාවය සඳහා නිපුණත්වය හුවමාරු කර ගැනීම, පරිසරය පිළිබඳ නීති සමුදය හා වසර 2000 පරිගණක ගැටලුව සඳහා සූදානම් වීම, ගුණාත්මක කළමනාකරණය හා ලියකියවිලි

මත පදනම් වූ ණය පිළිබඳව 1999 වර්ෂය තුළ වාණිජ මණ්ඩලය මගින් සමුළු හා සාකච්ඡා කීපයක් පවත්වන ලදී. එමෙන්ම වාණිජ මණ්ඩලය, භාණ්ඩාගාරය, අපනයනකරුවන්, සහ ශ්‍රී ලංකා රේගුව සමග මාසික රැස්වීම් පවත්වා සිය සාමාජිකත්වයෙහි ගැටළු විසඳන ලදී. ඔවුහු අපනයනය හා ආනයනය හා බද්ධ ව්‍යාපාර සම්බන්ධයෙන් වන අවකාශයන් සම්බන්ධව, විදේශ වෙළඳම විමසීම වලට අදාළ දත්ත පදනමක් පවත්වාගෙන යනු ලබති. 1999 වසර තුළදී වෙළඳ මණ්ඩලය ප්‍රභවය පිළිබඳ සහතික හා අන්තරාළ වෙළෙඳම පිළිබඳව සහතිකද නිකුත් කරන ලදී. මේ අතර තත්ත්වය හා බර පිළිබඳව සහතිකය නියෝජිත සම්මුති, විකිරණශීලී ක්‍රියාකාරිත්වය පිළිබඳ හා නැව් ඒජන්ත සහතික වැනි වාණිජ ලියකියවිලි ද නිකුත් කරනු ලැබේ.

## නැව් ගාස්තු

1999 වසරේදී විවිධ අන්තයන් සඳහා වන සාමාන්‍ය නැව් ගාස්තුවල විවිධ වෙනස්කම් පෙන්වනු ලබයි. එක්සත් රාජධානිය, එක්සත් ජනපදය, ප්‍රංශය, ඊජිප්තුව සඳහා වන සාමාන්‍ය නැව් ගාස්තු 1998 වසරට වඩා ඉහළ ගිය අතර මැද පෙරදිග හා ආසියානු රටවල් සඳහා වන නැව් ගාස්තු 1999 වසරේදී අඩු විය. ඇමෙරිකා එක්සත් ජනපදය සඳහා වන නැව් ගාස්තු තියුණු අන්දමින් වැඩි විය. එක්සත් රාජධානියට යැවෙන තේ, රබර්, ඇඟළුම් සහ කෙඳි වර්ග සඳහා වන සාමාන්‍ය නැව් ගාස්තු වැඩි වූ අතර කපාපු පොල් සඳහා වන නැව් ගාස්තු අඩු විය. උතුරු මහද්වීපය සඳහා යැවෙන තේ, රබර් හා කපාපු පොල් සඳහා වන සාමාන්‍ය නැව් ගාස්තු අඩු වූ අතර ඇඟළුම් සඳහා වන නැව් ගාස්තු වැඩි විය. ඊජිප්තුව, සවුදි අරාබියාව සඳහා වන නැව් ගාස්තු වැඩි වූ අතර ජපානය, සිංගප්පූරුව, ඩුබායි, පකිස්ථානය සඳහා වන නැව් ගාස්තු අඩු විය. කෙඳි වැනි අඩු නැ.වි.ස. මිලක් දක්වන භාණ්ඩ සඳහා මෙම ගාස්තු අහිතකර අන්දමින් බලපා ඇත. මෙම කරුණ එක්සත් ජනපදයෙහි ප්‍රධාන කෙඳි වෙළඳපොළෙහි මිලට වඩා ශ්‍රී ලංකා කෙඳි සඳහා වූ මිල ඉහල මට්ටමක පැවැතීමට හේතුවිය.

ආසියාවෙහි ගමනාන්තය කරා යන නැව් සමාගම් සියළුම මාදිලියෙහි නැව් ගාස්තු සකසා ගත් අතර එක්සත් රාජධානිය, උතුරු මහද්වීපය මධ්‍යධරණී රටවල්, ප්‍රංශය, ඊජිප්තුව, ඇමෙරිකා එක්සත් ජනපදය, කැනඩාව යන රටවල් භාණ්ඩ පදනම් කර ගත් නැව් ගාස්තු ක්‍රමයක් සකස් කර ගත්තේය.

නැව් ගාස්තු තීරණය කරනු ලබන්නේ ලෝක ඉල්ලුම හා සැපයුම බලපෑම් සහ නැව් සේවා අතර පවතින තරඟකාරිත්වයේ ප්‍රමාණය මතයි. ශ්‍රී ලංකාව තුළ දේශීය නියෝජිතයන් ක්‍රියාත්මක කරනු ලබන්නේ වැඩි වශයෙන්ම පිටරටවල සිට ක්‍රියාත්මක වන ඔවුන්ගේ ප්‍රධාන නැව් සමාගම් මගින් ඔවුන්ට නියම කර ඇති ගාස්තුය.

1996 සැප්තැම්බර් මස සිට නැව් සමාගම් විසින් හඳුන්වා දෙන ලද පර්යන්ත මෙහෙයුම් ගාස්තුව 1997 ජුනි මසදී නැවත ඉහළ නැංවිය. මෙම ගාස්තු පැනවීම සම්බන්ධයෙන් නැව් සමාගම් ඔවුන්ගේ විරෝධය තවදුරටත් ගෙන ගිය අතර, ඇතැම් නැව් සමාගම් 1999 වසර මුල් කාර්තුවේදී දනට පැවති පර්යන්ත මෙහෙයුම් ගාස්තු වැඩි කළේය. නැව් බඩු හිමියන්ගේ මණ්ඩලය, අපනයන කරුවන්ගේ සංගමය හා වෙළෙඳ මණ්ඩලය 1999 වසර අවසාන කාලය තුළ නැව් ගාස්තු හා වෙනත් අධි භාරයන් පැනවීම සම්බන්ධයෙන් ගෙන ගිය වැඩ පිළිවෙලට නැව් සමාගම් විසින් අනුකූලතාවය දක්වා නොමැත. මෙම වැඩපිළිවෙලෙහි බිඳ වැටීම නිසා අපනයනකරුවන්ට සිය නැව් භාණ්ඩ සඳහා ප්‍රමාණවත් කොන්දේසි ලබාගැනීම සම්බන්ධයෙන් පසුබැසීමක් ඇති කළේය.

1999 වසර තුළදී ශ්‍රී ලංකා නැව් බඩු කාර්යාංශය ප්‍රතිපත්තීන් තුළ කිසිදු වෙනසක් සිදු නොවිණි. "නාවික බල මණ්ඩලය" යනුවෙන් නාවික ප්‍රතිපත්තීන්හි වෙනසක් ඇති කිරීමේ අරමුණින් අළුත් ආයතනයක් බිහි කිරීමට රජය යෝජනා කර ඇත. මෙම නව ආයනතනය බිහි කිරීමෙන් අනතුරුව නැව් බඩු කාර්යාංශය වෙත නව කාර්යයන් පැවරෙනු ඇත.

## 9.12 වෙළෙඳ සබඳතා වෙළෙඳ හා නිෂ්කාෂණ වැඩපිළිවෙලවල්

ඉන්දු ලංකා නිදහස් වෙළඳ ගිවිසුම අත්සන් කිරීමත්, ලෝක වෙළඳ සංවිධානයෙහි 3 වන අමාත්‍ය මට්ටමේ රැස්වීම අසාර්ථක වීමත් සමග 1999 වසර තුළ ශ්‍රී ලංකා වෙළඳ සබඳතාවල නව ස්වරූපයක් ඇති විය. සෙසු ලෝකයා සමග ශ්‍රී ලංකා වෙළඳ සබඳතාවල ස්වරූපය හා නිදහස් වෙළඳාමෙහි ඇති අභියෝගයන්ට මුහුණ දීමට ශ්‍රී ලංකාව සූදනම් වන ආකාරය පිළිබඳවත්, දේශීය වෙළඳපොළ තුළ නිෂ්පාදන පිරිවැයට වඩා අඩු මිලට භාණ්ඩ විකිණීම වැළැක්වීම සඳහා නීති සම්පාදනය, ආනයනයන්ගේ ප්‍රමිතීන් නිසි අයුරින් පවත්වාගෙන යෑම, ජාතික අවශ්‍යතාවය ආරක්ෂා කර ගැනීම, ජාතික තරඟකාරිත්වය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම යන අංශ වලින් ගෝලීකරණය වීම පිළිබඳවත් මහජනතාවගේ උනන්දුව වැඩි විය.

2000 පෙබරවාරි මස අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එක පාර්ශවීය තීරු බදු අඩු කිරීම හා ඉන්දු ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ක්‍රියාත්මක වීම සිදු විය. කෙසේ නමුත් ජාත්‍යන්තර වෙළඳමට පාදක වන්නාවූ නීත්‍යානුකූල හා ආයතනික රාමුව ශක්තිමත් කිරීම 1999 වර්ෂයේ ප්‍රධාන ඉලක්කය විය. නිෂ්පාදන පිරිවැයට වඩා අඩු මිලකට බඩු විකිණීම හා ප්‍රතිතෝලන බදු සඳහා වූ අමාත්‍ය මණ්ඩල අතර සම්බන්ධතා කමිටුව මෙම කරුණු දෙක සම්බන්ධ ප්‍රථම නීති කෙටුම්පත සකස් කරන ලදී. තක්සේරු කිරීම් හා බුද්ධිමය දේපල සම්බන්ධයෙන් අදල වන යෝජිත නීති කෙටුම්පත් පිළිවෙලින් රේගු දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා ජාතික බුද්ධිමය දේපල කාර්යාලය විසින් පිළියෙල කරන ලදී.

**විශේෂ සටහන 6**

# ඉන්දු ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජය හා ඉන්දීය ජනරජය අතර නිදහස් වෙළෙඳ ගිවිසුම" ලෙස නිල නම් දරූ ඉන්දු ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ඉ.ලං.නි.වෙ.ගි.)අතිගරු ශ්‍රී ලංකා ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය හා ඉන්දියානු අගමැති ශ්‍රී අතල් බිහාරි වජ්පායි මැතිතුමා විසින් 1998 දෙසැම්බර් 28 වැනි දින අත්සන් තබන ලදී. 1998 වසරෙහි ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවෙන් විස්තර කරන ලද පරිදි මෙම ගිවිසුම අත්සන් කල අවස්ථාවේදී ගිවිසුමෙහි වැදගත් කොන්දේසි සම්බන්ධයෙන් අවසන් තීරණයක් ගෙන නොතිබුණි.[1] ඉන් අනතුරුව 1999 වසර පුරා රාජ්‍යයන් දෙක විසින්ම විවිධාකාර තීරු ගාස්තු අඩු කිරීම් යටතේ මෙම ගිවිසුම නිසා සිදු විය හැකි බලපෑම් තක්සේරු කළහ. ඔවුන්ගේ සොයා ගැනීම් පදනම් කරගෙන විවිධ ආකාරයේ තීරු ගාස්තු අඩු කිරීම් සම්බන්ධයෙන් තීරණයන් ගන්නා ලදී. තීරු ගාස්තු අඩු කිරීම් පිළිබඳ විස්තරයක් 1 වන හා 2 වන සංඛ්‍යා සටහන් වලින් ඉදිරිපත් කෙරේ.

ශ්‍රී ලංකා මහ බැංකුව මෑතකදී කරන ලද අධ්‍යයනයකදී මෙම ගිවිසුම හේතුවෙන් ශ්‍රී ලංකාවේ වෙළඳ හා කර්මාන්ත ක්ෂේත්‍රයට විය හැකි කෙටිකාලීන බලපෑම් තක්සේරු කරන ලදී.[2] ශ්‍රී ලංකාව විසින් නිෂ්පාදනය කර ලෝක වෙළෙඳ පොල ‍වෙත අපනයනය කරනු ලබන භාණ්ඩ සඳහා ඉන්දියාව සිදුකළ තීරු බදු අඩු කිරීම් පරීක්ෂා කිරීමෙන් ශ්‍රී ලංකාවේ අපනයනයන්ට ඇති විය හැකි බලපෑම තක්සේරු කරන ලදී. තීරු ගාස්තු අඩු කිරීම, ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සඳහා ඉන්දියානු වෙළෙඳපොළ විවෘත වීමට උපකාරි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එම ආකාරයෙන්ම ශ්‍රී ලංකාව තීරු ගාස්තු අඩු කිරීම හේතුවෙන් ඇතිවන වෙළඳපල විවෘත වීමට සමානුපාතිකව ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් ආනයනය කරනු ලබන භාණ්ඩ ප්‍රමාණය ඉහල යනු ඇත. 3 වන හා 4 වන සංඛ්‍යා සටහන් වලින් දනට පවත්නා වෙළෙඳම හා වෙළෙඳම කෙරෙහි ඇති විය හැකි බලපෑම පෙන්වයි.

ගිවිසුම යටතේ ඉන්දියාව ආනයනය කරනු ලබන භාණ්ඩ සඳහා තීරු ගාස්තු අඩු කරන ප්‍රමාණය මත එවැනි භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන දේශීය කර්මාන්තවලට බලපෑමක් ඇති විය හැක. එසේ වුවද, මෙම ගිවිසුමෙන් විශාල ලෙස තීරු ගාස්තු ඉවත් කිරීමක් සිදු නොවේ. 1 වන සංඛ්‍යා සටහනින් පෙන්වා ඇති පරිදි මුළු භාණ්ඩ වලින් සියයට 6 ක ප්‍රමාණයක් පමණක් සියයට 100 ක තීරු ගාස්තු ඉවත් කිරීමට ලක්වී ඇති අතර මුළු භාණ්ඩ වලින් සියයට 25 ක ප්‍රමාණයක් කිසිදු තීරු ගාස්තු ඉවත් කිරීමකට භාජනය නොවිණි. (නිශේධ ලැයිස්තුව). ක්‍රමයෙන් තීරු ගාස්තු ඉවත් කරනු ලබන භාණ්ඩ සඳහා මුල් වසරේදී සියයට 35 ක තීරු බදු අඩු කිරීමක් සිදු වන අතර, වසර අටක් තුළදී තීරු ගාස්තු මුළුමණින්ම ඉවත් කරනු ඇත.

දේශීය කර්මාන්තයන්ගේ ලාභදායිත්වයට ඇති වන බලපෑම තක්සේරු කිරීමෙන් එම කර්මාන්තයන්ට ඇති වන කෙටිකාලීන බලපෑම ගණනය කරන ලදී.[3] ශ්‍රී ලංකා මහ බැංකුව සිදුකළ අධ්‍යනයේදී වෙළඳ සමාගම් 475 ක නියදියක් මගින් ගිවිසුමෙහි බලපෑම තක්සේරු කරන ලදී. තීරු ගාස්තු සහනයන් ලබාදීමට පෙරාතුව හා පසුව වෙළඳ සමාගම්වල ලාභයට වන බලපෑම එම අධ්‍යනය මගින් අගය කර ඇත. තීරු ගාස්තු අඩු කිරීමෙන් දේශීය කර්මාන්තකරුවන් නිපදවනු ලබන ඒ හා සමාන භාණ්ඩවල වෙළඳපොළෙහි මිල ගණන් අඩු වනු ඇතැයි උපකල්පනය කරනු ලැබීය. ඒ අනුව එය පෞද්ගලික ව්‍යාපාරවල ලාභ දයිත්වයද අඩු කරනු ඇත. 5 වන සංඛ්‍යා සටහනේ එම අධ්‍යනයේ ප්‍රතිඵල දක්වේ. 5 වන සංඛ්‍යා සටහනින් දක්වා ඇති පරිදි කර්මාන්ත අංශය මත ඉතා සුළු බලපෑමක් පමණක් ඇති වෙනු ඇතැයි අපේක්ෂා කරයි. එවැනි සුළු බලපෑමක් ඇති වීමට හේතු කිහිපයක් වේ. ශ්‍රී ලංකාව සාමාන්‍යයෙන් අඩු තීරු ගාස්තු පවතින රටකි. බොහොමයක් තීරු ගාස්තු අඩු කර ඇත්තේ දනටමත් අඩු තීරු ගාස්තු ඇති භාණ්ඩ සඳහාය. ඉහළ තීරු ගාස්තු ඇති භාණ්ඩ නිශේධ ලැයිස්තුවෙහි අන්තර්ගතව ඇති බැවින් එම භාණ්ඩ කිසිදු ක්ෂණික බලපෑමකට මුහුණ නොදෙනු ඇත. ක්‍රමයෙන් තීරු ගාස්තු අඩු කරන ලැයිස්තුවෙහි ඇති භාණ්ඩ ප්‍රථම අවුරුදු තුන ඇතුළත සියයට 35 ක තීරු ගාස්තු අඩු කිරීමකට පමණක් යටත් වනු ඇත. ඒ අනුව, කෙටිකාලීන බලපෑම ඉතා අවම වනු ඇත.

මාර්ගයන් කිහිපයක් ඔස්සේ මෙම ගිවිසුමෙන් දිගුකාලීන වාසි අපේක්ෂා කරයි. අඛණ්ඩව තීරු ගාස්තු ඉවත් කිරීමෙන් දේශීය කර්මාන්තවල තරඟකාරිත්වය ඉහළ යනු ඇත. ශ්‍රී ලංකාවේ අපනයනකරුවන්ට විශාල වෙළෙඳපොළකට පිවිසීමේ වඩාත් ඉහළ අවස්ථාවක් සැපයෙනු ඇත. වඩාත් හොඳ භෞතික හා ක්‍රියාපිළිවෙත් වලින් යුතු යටිතල පහසුකම් සැපයීමට හැකි වන්නේ නම් ශ්‍රී ලංකාවෙහි සිටිමින් ඉන්දියාවට භාණ්ඩ අපනයනය කිරීමට අභිප්‍රාය ඇති සමාගම්වලින් විදේශ ආයෝජනයන් ආකර්ශනය කර ගැනීමට හැකි වනු ඇත.

---

1 ශ්‍රී ලංකා මහ බැංකුව, 1998 වාර්ෂික වාර්තාව, කොළඹ, ශ්‍රී ලංකාව.

2 ජයතිස්ස ආර්. ඒ, සහ එච්. එන් තේනුවර, ශ්‍රී ලංකා වෙළඳ හා කර්මාන්ත ක්ෂේත්‍රයට ඉන්දු-ලංකා නිදහස් වෙළඳ ගිවිසුමෙහි කෙටිකාලීන බලපෑම. මාණ්ඩලික පත්‍රිකා 25-26 වෙළුම, 1995/96 (වසර 2000 පළ කරනු ලැබීය).

3 ලාභදායිත්වය ආදයමෙහි හා ලාභයෙහි අනුපාතිකයක් වශයෙන් නිර්වචනය කර ඇත. විවිධ දේශීය කර්මාන්තවල ලාභ දයිත්වය පිළිබඳ දත්තයන් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි වාර්ෂික වාර්තාවෙහි පළ කර ඇත.

1 වන සංඛ්‍යා සටහන

## ඉන්දු-ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ තීරු ගාස්තු සම්බන්ධයෙන් වූ සවිස්තරාත්මක ගිවිසුම

| අනුග්‍රාහක රට | තීරු ගාස්තු අඩු කිරීමේ ප්‍රමාණය | තීරු ගාස්තු අඩු කිරීම් ලබන භාණ්ඩ පිළිබඳ විස්තර |
|---|---|---|
| ඉන්දියාව | තීරු ගාස්තු ඉවත් නොකිරීම. | ගිවිසුමෙහි 'D' ඇමුණුවෙහි සඳහන් භාණ්ඩ සඳහා (නිශේෂ ලැයිස්තුව) |
| | සියයට 25 ක් තීරු ගාස්තු ඉවත් කිරීම | 51-56, 58-60, 63 දරණ පරිච්ඡේදයන්හි භාණ්ඩ සඳහා |
| | සියයට 100 ක් තීරු ගාස්තු ඉවත් කිරීම | ගිවිසුමෙහි 'E' ඇමුණුමෙහි සඳහන් භාණ්ඩ |
| | සියයට 50 ක් තීරු ගාස්තු ඉවත් කිරීම | තේ කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 15 දක්වා, ඇඟළුම් දශලක්ෂ 2 හා ඉන්දියානු රෙදි උපයෝගී කරගෙන නිම කළ ඇඟළුම් දශලක්ෂ 6 (අ) |
| | සියයට 50 ක් තීරු ගාස්තු ඉවත් කොට පසුව ක්‍රමයෙන් තීරු ගාස්තු ඉවත් කිරීම | ඉතිරි භාණ්ඩ සඳහා (අවුරුදු 3 ක කාලයක් තුළදී අදියර දෙකකින් සීමාව සියයට 100 ක් දක්වා වැඩි කරනු ඇත) |
| ශ්‍රී ලංකාව | තීරු ගාස්තු ඉවත් නොකිරීම. | ගිවිසුමෙහි 'D' අරමුණුමෙහි සඳහන් භාණ්ඩ සඳහා |
| | සියයට 100 ක් තීරු ගාස්තු ඉවත් කිරීම | ගිවිසුමෙහි F - I ඇමුණුමෙහි සඳහන් භාණ්ඩ සඳහා |
| | සියයට 50 ක් තීරු ගාස්තු ඉවත් කොට පසුව ක්‍රමයෙන් තීරු ගාස්තු ඉවත් කිරීම | ගිවිසුමෙහි F - II ඇමුණුමෙහි දක්වා ඇති භාණ්ඩ සඳහා (මෙම ගිවිසුම බලපවත්වනු ලබන පළමු, දෙවන හා තුන්වන අවුරුද්ද අවසානයේදී පිළිවෙලින් සියයට 70 ක්, සියයට 90 ක් හා සියයට 100 ක් දක්වා තීරු බදු අඩු කරනු ඇත). |
| | ක්‍රමයෙන් තීරු බදු ඉවත් කිරීම | ඉතිරි භාණ්ඩ සඳහා අවුරුදු 3 අවසන් වීමට පෙරාතුව සියයට 35 ට නොඅඩු ප්‍රමාණයක්, අවුරුදු 6 අවසන් වීමට පෙරාතුව සියයට 70 ක් හා අවුරුදු 8 අවසන් වීමට පෙරාතුව සියයට 100 ක් |

(අ) ගිවිසුමට සකස් කරන අවස්ථාවේදී, තේ සඳහා වූ සලාකය කිලෝග්‍රෑම් දශලක්ෂ 15 දක්වා වැඩිකරන ලදී.

2 වන සංඛ්‍යා සටහන

## තීරු බදු සහනයන්ගේ සාරාංශය

| තීරු ගාස්තු අඩු කිරීම (%) | ශ්‍රී ලංකාවේ යෝජනා | | ඉන්දියාවේ යෝජනා | |
|---|---|---|---|---|
| | තීරු බදු කාණ්ඩ | | තීරු බදු කාණ්ඩ | |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 100 | 319 | 6.2 | 1,441 | 28.1 |
| 50 | 893 | 17.4 | 2,510 | 49.0 |
| 50 සලාකය | | | | |
| තේ | - | - | 4 | 0.1 |
| ඇඟළුම් | - | - | 251 | 4.9 |
| 35 | 2,630 | 51.4 | - | - |
| 25 | - | - | 527 | 10.3 |
| 0 (නිශේධ ලැයිස්තුව) | 1,279 | 25.0 | 388 | 7.6 |
| එකතුව | 5,121 | 100.0 | 5,121 | 100.0 |

3 වන සංඛ්‍යා සටහන

## 1998 වර්ෂයේ ශ්‍රී ලංකා අපනයනය හා වර්ධනය වීමේ හැකියාව

| තීරු ගාස්තු අඩු කිරීම | ඉන්දියාවට | | | ලෝකයට | | | වෙළඳපොළ විවෘත කිරීමේ සාධනය (ආ) | නව අපනයන මට්ටම එ.ජ. ඩොලර් දශ ලක්ෂ |
|---|---|---|---|---|---|---|---|---|
| | තීරු බදු කාණ්ඩ | | වටිනාකම එ.ජ.ඩොලර් දශ ලක්ෂ | තීරු බදු කාණ්ඩ | | වටිනාකම එ.ජ.ඩොලර් දශ ලක්ෂ | | |
| | සංඛ්‍යාව | % (අ) | | සංඛ්‍යාව | % (අ) | | | |
| 100 | 59 | 2.3 | 2.6 | 475 | 18.3 | 87 | 8 | 21 |
| 50 | 167 | 6.4 | 2.7 | 1,060 | 40.9 | 1,221 | 6 | 171 |
| 50 තේ | 4 | 0.1 | 1.4 | 11 | 0.4 | 780 | 17 | 30 |
| 50 ඇඟළුම් | 48 | 1.9 | 0.1 | 373 | 14.4 | 2,460 | 480 | 48 |
| 25 | 28 | 1.1 | 0.8 | 304 | 11.7 | | 11 | 9 |
| 0 | 79 | 3.1 | 2.6 | 367 | 14.2 | 1,576 | 1 | 3 |
| එකතුව | 384 | 14.8 | 3.5 | 2,590 | 100 | 4,548 | 8 | 282 |

(අ) ප්‍රතිශත දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවේ වැඩි වශයෙන් අපනයනය කරන මුළු තීරු බදු කාණ්ඩ සංඛ්‍යාව වන 2,590 හි ප්‍රතිශතයක් ලෙසිනි.

(ආ) ලෝකයට වැඩි වශයෙන් සිදු කරන අපනයනවල තීරු බදු කාණ්ඩ සංඛ්‍යාවේ හා ඉන්දියාවට අපනයන කරන තීරු බදු කාණ්ඩ සංඛ්‍යාවේ අනුපාතයක් ලෙස වෙළෙඳපොල විවෘත වීමේ සාධකය ලබාගෙන ඇත.

4 වන සංඛ්‍යා සටහන

**1998 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ආනයනය හා වර්ධනය වීමේ හැකියාව**

| තීරු ගාස්තු අඩු කිරීම | ඉන්දියාවෙන් | | | ලෝකයෙන් | | | වෙළඳපොළ විවෘත කිරීමේ සාධකය | නව අපනයන තත්වය එ.ජ. ඩොලර් දශ ලක්ෂ |
|---|---|---|---|---|---|---|---|---|
| | තීරු බදු කාණ්ඩ | | වටිනාකම එ.ජ.ඩොලර් දශ ලක්ෂ | තීරු බදු කාණ්ඩ | | වටිනාකම එ.ජ.ඩොලර් දශ ලක්ෂ | | |
| | සංඛ්‍යාව | %(අ) | | සංඛ්‍යාව | %(අ) | | | |
| 100 | 158 | 3.5 | 5 | 281 | 6.2 | 38 | 1.8 | 9 |
| 50 | 583 | 12.8 | 65 | 821 | 18.1 | 570 | 1.4 | 92 |
| 35 | 1,383 | 30.4 | 216 | 2,315 | 50.9 | 3,199 | 1.7 | 362 |
| 0 | 684 | 15.1 | 267 | 1,127 | 24.8 | 2,084 | 1.0 | 267 |
| එකතුව | 2,808 | 61.8 | 553 | 4,544 | 100 | 5,891 | 1.6 | 729 |

(අ) ප්‍රතිශත දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවේ වැඩි වශයෙන් ආනයනය කරන්නාවූ මුළු තීරු බදු කාණ්ඩ සංඛ්‍යාවේ 4,544 ප්‍රතිශතයක් ලෙසිනි.

5 වන සංඛ්‍යා සටහන

**කර්මාන්ත කෙරෙහි කෙටිකාලීන බලපෑම් සාරාංශය**

| බලපෑම | පෞද්ගලික වෙළෙඳ සමාගම්වල ප්‍රතිශතය |
|---|---|
| බලපෑම් රහිත | 76 |
| මධ්‍යස්ථ බලපෑම(අ) | 22 |
| දැඩි බලපෑම්(ආ) | 2 |
| එකතුව | 100 |

(අ) 10 ට ඉහළ පරාසයක ලාභ ලැබීමේ හැකියාව ඇති සමාගම් 10 ට ඉහළ පරාසයේම පැවතීම හෝ 10 ට පහළ පරාසයේ ඇති සමාගම් 10 ට පහළ පරාසයේම පැවතීම.

(ආ) 10 ට ඉහළ පරාසයේ ලාභ ලැබීමේ හැකියාව ඇති සමාගම් 10 ට පහළ පරාසයකට වැටීම හෝ 10 ට අඩු පරාසයේ පැවති සමාගම් 0 අඩු පරාසයකට වැටීම.

1999 වසර තුළ ශ්‍රී ලංකාව ද්විපාක්ෂික ගිවිසුම් කීපයකට ඇතුළත් විය. යුක්‍රේනය සමග ඇති කර ගත් ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම මගින් ශ්‍රී ලංකාවෙන් ආනයන කරනු ලබන තේ සඳහා සියයට 50 ක තීරු බදු අඩු කිරීමක් යුක්‍රේනයට ප්‍රදානය කරනු ඇත. චෙක් සමූහ ආණ්ඩුව වෙළඳ සබඳතා ශක්තිමත් කරනු පිණිස ගිවිසුමක් අත්සන් තැබීය. ශ්‍රී ලංකාව ඉරානය සමග ද්විපාර්ශ්වික සාකච්ඡා පවත්වනු ලැබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස "ආහාර සඳහා තෙල් වැඩපිළිවෙල" හි 6 වන අදියර යටතේ ඉරානය ශ්‍රී ලංකාවෙන් තේ කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 6 ක් දක්වා ආනයනය කරනු ඇති අතර එළවළු තෙල් කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 3 ක්ද මිලදී ගනු ඇත. ශ්‍රී ලංකාව ඉරානයෙන් බොර තෙල් මෙට්‍රික් ටොන් 120 ක් මිලදී ගැනීමට එකඟ විය. ශ්‍රී ලංකා යුරෝපා හවුලේ ඒකාබද්ධ කොමිසම සමග නොකඩවා ඇති වූ සාකච්ඡාවල ප්‍රතිඵලයක් ලෙස යුරෝපා හවුලට අයත් රට වලින් ආනයනය කරනු ලබන නූල් වලින් නිම කළ රෙදි සහ ඇඟළුම් සඳහා තීරු බදු සහන ලැබිණි. ශ්‍රී ලංකාව නෝර්වේ රාජ්‍ය සමඟද වෙළෙඳ හා වාණිජ කටයුතු පිළිබඳව සහභාගිත්වය සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වීය. ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාවය පිළිබඳව ශ්‍රී ලංකාව, රුසියාව, ජෝර්ජියාව, උස්බෙකිස්තානය, මෝල්ඩෝව, ආර්මේනියාව, බෙලාරුස් සහ කසකස්ථානය යන රටවල් සමග ගිවිසුම් ඇති කර ගැනීමට යෝජනා ඉදිරිපත් කර තිබේ.

දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සමුළුව (සාර්ක්), බැංකොක් සම්මුතිය, බංගලදේශය, ඉන්දියාව, මියන්මාරය, ශ්‍රී ලංකාව, තායිලන්ත ආර්ථික සහයෝගිතාවය (බිම්ස්ට්-එක්) හා කලාපීය සහයෝගිතාව සඳහා වූ ඉන්දියානු සාගර වට සංගමය සමඟ අඛණ්ඩ සාකච්ඡා මගින් කලාපීය ආර්ථික සහයෝගිතාවය 1999 දී තවදුරටත් පෝෂණය කරන ලදී.

සාමාජික රටවල් අතර එකඟතාවයක් නොතිබීම හේතුකොට 1999 දී කත්මණ්ඩු නුවරදී පැවැත්වීමට සැළසුම් කර තිබූ එකළොස් වැනි සාර්ක් සමුළුව නොපැවැත්විණි. පකිස්ථානය නියෝජනය කිරීමක් සිදු නොවූ බැවින් දකුණු ආසියානු වරණීය වෙළඳ වැඩපිළිවෙල (සැප්තා) පිළිබඳව හතර වන වටයේ සාකච්ඡා සැලසුම් කර ගත් පරිදි නොපවත්වන ලදී. 9.12 සංඛ්‍යා සටහනෙහි දක්වෙන පරිදි ඒ ඒ සාමාජික රටවලට කරන ලද මුළු අපනයන හා අදළව සමානුපාතිකව වර්ධනය වූයේ නැති නමුත්, 1999 වසර තුළ සැප්තා ගිවිසුම යටතේ සාර්ක් රටවලට ශ්‍රී

**9.12 වැනි සංඛ්‍යා සටහන**
**සප්තා ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවෙන් කරන ලද අපනයනය**

| රට | වටිනාකම එ.ජ. ඩොලර් දහස් ගණනින් | | | ඒ ඒ රටවලට කරන ලද අපනයනයෙහි ප්‍රතිශතවටිනාකම | | |
|---|---|---|---|---|---|---|
| | 1997 | 1998 | 1999 | 1997 | 1998 | 1999 |
| බංගලාදේශය | - | 15.6 | 47.0 | - | 0.15 | 1.06 |
| භූතානය | - | - | - | - | - | - |
| ඉන්දියාව | 1,408.3 | 7,338.3 | 18,132.0 | 3.22 | 19.47 | 10.83 |
| මාලදිවයින | 5.0 | 0.5 | 102.5 | 0.02 | 0.001 | 0.59 |
| නේපාලය | 588.7 | 65.2 | 23.5 | 36.94 | 5.93 | 28.35 |
| පකිස්ථානය | 99.1 | 342.6 | 740.7 | 0.26 | 1.27 | 0.80 |
| එකතුව | 2,101.0 | 7,768.2 | 19,049.9 | 1.77 | 6.84 | 6.72 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

ලංකාවෙන් කරන ලද අපනයනයන්හි සැළකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි.

1999 වර්ෂය තුළ දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (සැප්තා) ක්‍රියාත්මක වීමේ වැඩකටයුතු සෙමෙන් සිදු විය. 1999 වර්ෂය තුළ සැප්තා සඳහා විස්තරාත්මක ගිවිසුම් සමූහයක් කෙටුම්පත් කිරීමට සැලසුම් කර ඇත.

වාර්ෂික බිම්ස්ට්-එක් අමාත්‍ය මණ්ඩල සාකච්ඡාව 1999 වර්ෂයේදී නොපැවැත්විණි. 1998 පවත්වන ලද බිම්ස්ට්-එක් අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ශ්‍රී ලංකාවට පැවරූ වගකීම සපුරා ගනු වස් සංචාරක කර්මාන්තය හා රෙදිපිළි හා ඇඟළුම් සම්බන්ධ විශේෂඥ කණ්ඩායමේ රැස්වීම් දෙකක් කොළඹදී පවත්වන ලදී. 1999 දී පවත්වන ලද කලාපීය සහයෝගිතාව සඳහා වූ ඉන්දියානු සාගර වට සංගමයෙහි සමුළු වාරයේදී වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්තිය පිළිබඳ වැඩපිළිවෙලක් සකස් කරනු පිණිස ශ්‍රී ලංකාවද සාමාජිකයෙකු වශයෙන් සිටින කමිටුවක් පත් කරන ලදී.

වරණය පිළිබඳව පොදු ක්‍රමය යටතේ (ජී.එස්.පී) සහභාගී වූ සංවර්ධනය වන රටවල්, වලින් ප්‍රති තීරු බදු සහන ලැබීමේ අපේක්ෂාවෙන් තොරව ශ්‍රී ලංකාවට තීරු බදු සහන නොකඩවා ලබා දුන්හ. 1999 වසර තුළ මෙම ක්‍රමය යටතේ අපනයන දිසාව පිළිබඳව සැළකිය යුතු වෙනසක් සිදු නොවිණි. සාමූහික සම්භවය පිළිබඳව මූලධර්මය යටතේ දේශීය නිමවුම් අන්තර්ගත අවශ්‍යතාවය මත සිය සාමාජිකයන්ට විශේෂ සහන ලබා ගැනීම පිණිස සාක් සාමාජික රටවල් හා සාක් ලේකම් කාර්යාලය යුරෝපා හවුලේ ඒකාබද්ධ කොමිසම සමඟ සාකච්ඡා පවත්වනු ලබයි. මෙම නිර්ණකය යටතේ දේශීය නිමවුම් අන්තර්ගත අවශ්‍යතාවයන් සලකා බැලීමේදී සාක් රට වලින් ආනයනය කරනු ලබන කිසියම් අමු ද්‍රව්‍යයක් කිසියම් සාමාජික රටක් ඔවුන්ගේ නිෂ්පාදන සඳහා යොදා ගනු ලැබුවේ නම්, එම රටෙහි ඒවා දේශීය අමු ද්‍රව්‍ය වශයෙන් සැලකිය යුතු වේ.

වෙළඳ වාරණයන් පිළිබඳ පොදු ක්‍රමයට (ජී.එස්.ටී.පී) සහභාගී වන දියුණු වෙමින් පවතින රටවල් වලින් සහනයක් ලබා ගැනීමේ ලා ශ්‍රී ලංකාව තවදුරටත් ඉදිරියට යනු ලැබීය. මෙම ක්‍රමය යටතේ දියුණු වෙමින් පවතින රටවල් කණ්ඩායම එකිනෙකා අතර තීරු බදු සහනයන් හුවමාරු කර ගත්තේය. 1999 වසර තුළ ශ්‍රී ලංකාව, රුමේනියාව, පේරු, ටියුනීසියාව, මෙක්සිකෝව හා චිලී යන රටවලට රුපියල් දශ ලක්ෂ 268 වටිනා භාණ්ඩ අපනයනය කළේය.

බැංකොක් ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව අඛණ්ඩව තීරු බදු සහනයන් භුක්ති වින්දේය (ඉන්දියාව, බංගලාදේශය, කොරියානු ජනරජය, ලාඕසය හා ශ්‍රී ලංකාවේ සාමාජිකත්වය සහිතව) චීනය මෙම ගිවිසුමේ සාමාජිකයෙකු වීමට බලාපොරොත්තු වන අතර සාමාජික රටවල් සමඟ තීරු බදු සහන සඳහා දැන් සාකච්ඡා පවත්වයි. 1999 දී චීනය ශ්‍රී ලංකාව සමඟ සාකච්ඡා පවත්වා අවසන් කොට ඇත. සීමිත රටවල් ප්‍රමාණයක් ආවරණය වීම මෙම ගිවිසුම යටතේ ක්‍රියාකාරකම් මධ්‍යස්ථ මට්ටමක පැවතීමට හේතුව ලෙස සාමාජික රටවල් සළකයි. එබැවින් පීජී දූපත් මෙම කණ්ඩායමට එකතු කර ගැනීමට උත්සාහයක ඔව්හු යෙදී සිටිති. කෙසේ නමුදු පීජී දූපත් මෙම කණ්ඩායමට බැඳීම සඳහා මේ වනතුරු ඉල්ලීමක් කර නොමැත.

ශ්‍රී ලංකාව අන්තර් ජාතික ස්වභාවික රබර් ගිවිසුමෙන් ඉවත් වීමට 1999 දී තීරණය කළාය. මැලේසියාව හා තායිලන්තයද මෙම ගිවිසුමින් ඉවත් විය. ශ්‍රී ලංකාව ඇතුළු සියළුම රබර් නිපදවන රටවලට බලපෑම් ඇති කළ ස්වභාවික රබර් මිල ගණන් ක්‍රමයෙන් පිරිහීම වැළැක්වීමට අන්තර් ජාතික රබර් ගිවිසුමෙහි ස්ථාවර කිරීමේ හස්තය ලෙස සැළකෙන අන්තර් ජාතික ස්වභාවික රබර් සංවිධානයට නොහැකි වීම මෙයට හේතු විය. මෙම ඉවත්වීම්වල ප්‍රතිඵලයක් ලෙස අන්තර් ජාතික රබර් ගිවිසුම 1999 වසරේදී ඇවර කරන ලදී.

ජාත්‍යන්තර කටයුතු පිළිබඳව රටවල් 24 හි රාජ්‍යයන් අතර තාක්ෂණික කණ්ඩායමෙහි (පර්යේෂණ හස්තය) සහභාගිත්වය දැරීමෙන් අනතුරුව 1999 අප්‍රේල් මස අවුරුද්දක කාලසීමාවක් සඳහා ශ්‍රී ලංකාව රටවල් 24 කණ්ඩායමෙහි සභාපතිත්වයට පත් විය. රටවල් 24 කණ්ඩායමෙහි ඇමතිවරුන්ගේ වාර්ෂික රැස්වීම 1999 අප්‍රේල් මස ශ්‍රී ලංකාවෙහි සභාපතිත්වය යටතේ වොෂින්ටන් නුවරදී පවත්වනු ලැබීය. රටවල් 24 කණ්ඩායම මගින් නිකුත් කල නිවේදනයෙහි, මින්පෙර නොවූ ආකාරයෙන් සිදුවූ මූල්‍ය වෙළෙඳපොල අර්බුදය හමුවේ, ලෝක ආර්ථිකය පිළිබඳ තියුණු ඇගැයීමක් සිදුකර ඇති අතර, එම නිවේදනය මගින් අවධානය යොමු කල අනිකුත් ද අතර, ජාත්‍යන්තර අවසාන ණයදෙන්නෙකු, අතිරේක වශයෙන් ජාත්‍යන්තර ද්‍රවශීලතාවය සැපයීම පිණිස විදේශ හැර ගැනීමේ හිමිකම් (විගැහි) වඩා වැඩි වාරගණනක් භාවිතය, ප්‍රග්ධන වෙළෙඳපොල නිදහස්කරණයේ ලා වඩා ප්‍රවේශම්කාරි පිළිවෙතක් අනුගමනය කිරීම හා ප්‍රධාන මුදල් වගී අතර පමණට වඩා විදේශ විනිමය අනුපාතයේ විචලනයන් අඩුකිරීමට හා දියුණුවෙමින් පවතින රටවල අපනයන සඳහා දියුණු රටවල වෙළෙඳපොල අඛණ්ඩව විවෘතව තැබීමේ අවශ්‍යතාවය අවධාරණය කිරීම සඳහා කාර්මික රටවල් සිය සාර්ව ආර්ථික

කළමනාකරණයේලා වඩා සහයෝගී පිලිවෙතක් අනුගමනය කිරීම වේ.

1999 පවත්වන ලද රටවල් 15 කණ්ඩායමේ රැස්වීමට ශ්‍රී ලංකාවද සහභාගී විය. රටවල් 15 කණ්ඩායමෙහි අරමුණ නම් අන්‍යොන්‍ය විශ්ව ගැටළු දකුණු - දකුණු දර්ශණය ඇසුරෙන් විසඳ ගැනීමයි. ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් විශ්ව මට්ටමෙන් සංවිධාන කිරීමේ හා සහයෝගිතා වැඩපිළිවෙලවල් දියුණු කිරීමට හා ස්ථාපනය කිරීමට උදව් කිරීමේ අරමුණ ඇතිව දියුණු වෙන රටවල් අතර අඛණ්ඩ උපදේශාත්මක සේවාවන් සපයන මණ්ඩලයක් ලෙස මෙය සැලසුම් කොට තිබේ. ශ්‍රී ලංකාවෙහි සභාපතිත්වය යටතේ රටවල් 24 කණ්ඩායමෙහි හා රටවල් 15 කණ්ඩායම අතර සම්බන්ධතාවයක් ගොඩ නැගුන අතර මෙහි අරමුණ වූයේ කණ්ඩායම් දෙක අතර අන්‍යොන්‍ය සම්බන්ධතා වර්ධනය කිරීමය. මෙලෙස රටවල් 15 කණ්ඩායමෙහි රැස්වීමේ සාකච්ඡාවට භාජනය වූ කරුණු ලෝක වෙළඳ සංවිධානයෙහි තුන් වන අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ශ්‍රී ලංකාවෙහි තත්ත්වය එහි ක්‍රමානුකූලව සකස් කර ගැනීමට උපකාරී විය.

ලෝක වෙළෙඳ සංවිධානයට අදළව ශ්‍රී ලංකාවේ තත්ත්වය හා ප්‍රතිපත්ති සාර්ක් ඇතුළුව බොහෝ සංවර්ධනය වන ආර්ථිකයන්ගේ කණ්ඩායම්වල පොදු තත්ත්වය හා සමගාමීව පැවතිණි. 1999 ලෝක වෙළඳ සංවිධානයෙහි තුන් වන අමාත්‍ය මණ්ඩල රැස්වීමට පෙරාතුව ශ්‍රී ලංකාව සාක් සාමාජික රටවල් හා "කුඩා හා පීඩාවට පත් ආර්ථිකයන්ගේ" කණ්ඩායම් සමග ප්‍රාරම්භක රැස්වීම් පවත්වා පොදු එකඟතාවයක් ගොඩ නගා ගනු ලැබිණ. නව බහු පාර්ශවීය වෙළඳ සාකච්ඡා ආරම්භ වීමට පෙරාතුව උරුගුවේවට සාකච්ඡාව පදනම් කරගෙන ඇති වූ ගිවිසුම් හා තීරණයන් නිසි පරිදි ක්‍රියාවට නැගීමක් සිදු කළයුතු බව පොදු එකඟතාවයෙන් හැඟවිණි. කෘෂිකර්මය හා රෙදිපිළි හා ඇඟළුම් පිළිබඳ ගිවිසුම් සංවර්ධිත රටවල වෙළඳපොළ වෙත ප්‍රවේශ වීමට ප්‍රමාණවත් ඉඩ ප්‍රස්ථාවන් නොසපයන බවට පොදුවේ පිළි ගැණිනි. සංවර්ධනය වන රට වලින් අපනයනය කරනු ලබන රෙදිපිළි සඳහා වූ පංගු සීමාවන් මුළුමණින්ම ඉවත් කර හමාර වනතුරු නිෂ්පාදන පිරිවැයට වඩා අඩු මිලට භාණ්ඩ විකිණීම වැළැක්වීම පිළිබඳ නීති රීති ස්ථාපනය නොකළයුතු බවට හා සනීපාරක්ෂාව සහ හරිත ආරක්ෂණ ගිවිසුමේ කොන්දේසි සහ තාක්ෂණික බාධක වෙළෙඳමට බාධාවන අයුරින් ක්‍රියාත්මක නොකළ යුතුය යන කරුණ පිළිබඳව පොදු එකඟතාවයක් අවශ්‍ය විය.

ඉහත සඳහන් කරුණු මත වූ ජාත්‍යන්තර වෙනස් කම් හා බහු පාර්ශවීය වෙළඳමට සම්බන්ධ වන්නාවූ ආයෝජන, තරඟකාරී ප්‍රතිපත්තිය, රජයේ නියෝජ්‍යත්වයේ විනිවිද පෙනෙන සුළු බව, කම්කරු ප්‍රමිති හා පරිසරය සම්බන්ධ අනෙකුත් කරුණ තුන් වන අමාත්‍ය මණ්ඩල රැස්වීම අසාර්ථක වීමට බලපාන ලදී.

ලෝක වෙළඳ සංවිධානය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවෙහි වගකීම ඉටු කිරීමේලා ප්‍රගතියක් දක්නට ලැබුණි. ලෝක වෙළඳ සංවිධානයට අදළව වෙළඳ ගිවිසුම් සම්බන්ධයෙන් වන අන්තර් අමාත්‍යාංශ සහයෝගිතා කමිටුව යටතේ පිහිටුවන ලද නිෂ්පාදන පිරිවැයට වඩා අඩු මිලකට විකිණීම හා ප්‍රතිතෝලන බදු සම්බන්ධයෙන් වන උප කමිටුවෙහි වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමේ අවසන් අදියරට එළඹ ඇත. 1999 දී ශ්‍රී ලංකාව වෙළඳම හා තීරු බදු පිළිබඳව පොදු ගිවිසුමෙහි 5 වන මූල් කෙටුම්පත අත්සන් තබන ලදී. සේවා වෙළඳම පිළිබඳ පොදු ගිවිසුමෙහි අන්තර් අමාත්‍ය සහයෝගිතා කමිටුවෙහි පවත්වන ලද වෘත්තීය සේවාවන් ලිහිල් කිරීම පිළිබඳව සාකච්ඡා කිරීම පිණිස මූලික සාකච්ඡා ශ්‍රී ලංකාවෙහි වෘත්තිය ආයතන සමඟ පවත්වන ලදී.

තවදුරටත් භාණ්ඩ හා සේවා වෙළඳම ලිහිල් කිරීමෙන් ඇති විය හැකි බලපෑම හා තරඟකාරිත්වය පිළිබඳව නව සංකල්පයන් හඳුන්වා දීම පිළිබඳව ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයන්ගේ හා ප්‍රතිපත්ති සැලසුම් කරුවන්ගේ අවබෝධයන් වර්ධනය කිරීමේ අරමුණින් අභ්‍යන්තර හා අන්තර් ජාතික වෙළඳ හා ආහාර අමාත්‍යාංශය යටතේ පැවති වෙළඳ දෙපාර්තමේන්තුව සමුළු කීපයක් පවත්වන ලදී. මෙම සමුළුවලදී අනුමත කර ගන්නා ලද සාමාන්‍ය කරුණුවල වෙළඳම පිළිබඳ ජාත්‍යන්තර සබඳතා පැවැත්වීමේ ක්‍රමෝපාය, ආයතනික හැකියාව ගොඩ නැගීම හා වෙළඳ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් වන පරීක්ෂණයන් පිළිබඳව අඩංගු විය. ප්‍රතිපත්තිවල වෙනස්කම් ඇති කිරීමට පෙරාතුව විවිධ ජන කොටස් අතර ඒකමතිකත්වය ගොඩ නැංවීම සඳහා ශ්‍රී ලංකාව වැඩි සැළකිල්ලක් දක්විය යුතුව ඇත. එබඳු එකඟතාවයක් නොමැති වීම ආයෝජනයෙහි ඇති අවදනම හා අස්ථිරතාවක් ඇති වීමටත්, ප්‍රතිපත්ති සඵලත්වයට බාධා පමුණුවනු ලබන මහජන නොසන්සුන්තා ඇති වීමටත් බලපානු ඇත.

මෙසේ එලඹුනු බොහෝ ද්විපාර්ශවීය, කලාපීය හා බහු පාර්ශවීය ගිවිසුම් ක්‍රියාවට නැංවීමේ ක්‍රියාදමයෙහි ඇති කාර්යක්ෂමතාවය පිළිබඳ සැක පවතී. අයවැය පිළිබඳ ගැටළු සාකච්ඡාවලදී ප්‍රමාණවත් නියෝජනයන් නොමැති වීම, මෙම සාකච්ඡාවලට සහභාගී වූ අමාත්‍යාංශ මගින් එකඟ වූ කාර්යයන් හා ඒවා ක්‍රියාවට නැගීමේදී සම්බන්ධ වන අනෙකුත් අමාත්‍යාංශවල ප්‍රමුඛතාවන් එකිනෙකට නොගැලපීම මෙවැනි තත්ත්වයට දයක වන සමහර හේතූන් වේ.

## 9.13 අභ්‍යන්තර වෙළෙඳම හා ආයතනික වැඩපිළිවෙල

1999 දී අභ්‍යන්තර වෙළෙඳම මූර්ථ වශයෙන් සියයට 2.1 කින් වැඩි විය. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර වෙළෙඳම සාපේක්ෂ වශයෙන් නිදහස් වෙළඳ වාතාවරණයක් යටතේ මිල තීරණය කිරීම හා පාලනය කෙරෙහි රජයේ අවම මැදිහත් වීමක් සහිතවද වේ. වෙළෙඳ ව්‍යවස්ථාවන් කෙරෙහි ප්‍රධාන වශයෙන් මැදිහත් වෙමින්ද, ක්‍රියාත්මකවේ. සාමූහිකව මිල නියම කිරීම, පිරිවැයට වඩා අඩු මිලට විකිණීම, ප්‍රෝඩාකාරී මිල තීරණය කිරීම සහ අති විශාල ඒකාබද්ධ කිරීම්වල ප්‍රතිඵලයක් ලෙස ඒකාධිකාරයන් බිහි වීම වැනි වෙළෙඳමෙහි පවත්නා

තරගකාරීත්වයට පටහැනි කටයුතු නිසා ඇති විය හැකි අනර්ථකාරී ප්‍රතිවිපාක වැළැක්වීම සඳහා විශාල වශයෙන් රජය මැදිහත් වීම අත්‍යාවශ්‍යව පවතී. මිල ගණන් දැඩි ලෙස උච්චාවචනය වීම නිසා ඇති විය හැකි අනර්තකාරී පලවිපාක අවම කරමින් පාරිභෝගික හා නිෂ්පාදන සුභසාධනය තහවුරු කිරීම රජයේ බලාපොරොත්තුව වේ. අභ්‍යන්තර හා අන්තර් ජාතික වාණිජ හා ආහාර අමාත්‍යාංශය හා එහි අලෙවි කටයුතු කරන සංවිධානයන් වන සමූපකාර තොග වෙළඳ සංස්ථාව (ස.තො.ස.), ලංකා සළුසල, ලංකා ජෙනරල් ට්‍රේඩින් කොම්පැනි ලිමිටඩ්, සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය හා එහි අනුබද්ධ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය සහ රාජ්‍ය ඖෂධ සංස්ථාව මගින් මෙම මැදිහත් වීම සිදු කෙරේ. අභ්‍යන්තර හා අන්තර් ජාතික වාණිජ හා ආහාර අමාත්‍යාංශයට අනුබද්ධිත පාලන මණ්ඩල දෙකක් වන අභ්‍යන්තර වෙළඳම පිළිබඳ දෙපාර්තමේන්තුව හා සාධාරණ වෙළඳ කොමිසම ඖෂධ නිෂ්පාදනවල මිල පාලනය කිරීම හා අසාධාරණ වෙළඳ කටයුතු පිළිබඳ සෝදිසි කිරීම සිදු කරති. සමහර අවස්ථාවන්හි එකම කාර්යය ආයතන දෙක මගින්ම සිදු වීමත්, වෙළඳ කටයුතු සෝදිසි කරන වඩා ශක්තිමත් ආයතනයක් ඇති කිරීමේ අවශ්‍යතාවත් හේතුකොට මෙම ආයතන දෙක ඒකාබද්ධ කිරීමට 1997 දී යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. යෝජිත කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතුව ඇත.

ඛනිජ තෙල් සහ තිරිඟු පිටි සැපයුම 1999 වර්ෂයේදීද නොකඩවා රජය යටතේම පවත්වාගෙන යන ලදී. එල්පී ගෑස් හැර අනෙකුත් ඛනිජ තෙල් නිෂ්පාදනය සහ සැපයුම ලංකා ඛනිජ තෙල් සංස්ථාව මගින් පවත්වාගෙන ගිය අතර එල්පී ගෑස් සැපයුමේ ඒකාධිකාරය ලංකා ෂෙල් ගෑස් සමාගම සතුව පවතී. අභ්‍යන්තර හා අන්තර් ජාතික වාණිජ කටයුතු අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනයක් වන ආහාර දෙපාර්තමේන්තුව ප්‍රීමා ලංකා ආයතනය මගින් පිටි කරන තිරිඟු පිටි බෙද හැරීමේ පූර්ණ අයිතිය තබා ගන්නා ලදී. 2000 වසර දක්වා තිරිඟු ආනයන ප්‍රතිපත්ති ලිහිල් නොකරන ලද අතර තිරිඟු පිටි ආනයන බලපත්‍ර අවශ්‍යතාවය 2000 පෙබරවාරි මස ඉවත් කරන ලදී. ආහාර දෙපාර්තමේන්තුවේ කටයුතු සතොස සහ සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් වෙළඳසැල් හා එක්බද්ධව ඉටු කෙරිණි. වෙළඳපොළෙහි භාණ්ඩ හිඟයක් ඇති නොවන පරිදි ප්‍රමාණවත් ලෙස සීනි සහ සහල් සැපයිමට සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වග බලා ගන්නා ලදී. බන්ධිත ගුදම් සහ සතොස සේවාවන් මගින් මෙම කටයුතු ඉටු කෙරිණි. 2000 වසරේ අයවැයෙන් තිරිඟු ආනයන පිළිවෙත ලිහිල් කළ අතර නැව් හා ගුවන්යානා ඉන්ධන අලෙවිය කෙරෙහි පෞද්ගලික අංශයට සහභාගී වීමට ඉඩ සලසන ලදී.

සතොස ලාභ උපයන ආයතනයක් ලෙස කටයුතු කරන අතරම පාරිභෝගිකයාගේ හා නිෂ්පාදකයාගේ සුභසාධනය සලසන ආයතනයක් ලෙස ඉතා භාරදූර කාර්යයක් ඉටු කරයි. උදාහරණයක් ලෙස අස්වැන්න නෙලන කාලයේදී සතොස ලොකු ළූණු, අර්තාපල්, වියලි මිරිස් වැනි ආහාර ද්‍රව්‍ය ආනයනයෙන් වැලකී සිටි අතර පෞද්ගලික අංශයේ වෙළෙඳුන් මෙම ද්‍රව්‍ය ආනයනය කරන ලදී. එසේම සතොස, දේශීය නිෂ්පාදකයන්ට සාධාරණ ගොවිපල මිලක් ලබාදීම තහවුරු කරනු පිණිස සතොස මෙම භාණ්ඩ දේශීය නිෂ්පාදකයන්ගෙන් මිලට ගන්නා ලදී. එබැවින් දේශීය මිලදී ගැනීම් කෙරෙහි සතොසෙහි සහභාගිත්වය1998 වර්ෂයට වඩා 1999 වසරේදී ඉහළ මට්ටමක පැවතිණි. 1998 දී මිලදී ගත් දේශීය ලොකු ළූණු ප්‍රමාණය මෙට්‍රික් ටොන් 29 සිට 1999 දී මෙට්‍රික් ටොන් 2,625 ක් දක්වා වැඩි විය. එයට හේතු වූයේ දේශීය නිෂ්පාදනය වැඩි වීම සහ කෘෂි නිෂ්පාදනයන් සඳහා ගොවිපල මිල ස්ථායීකරණය කිරීමට ඇති අවශ්‍යතාවයයි. සතොස මිලදී ගත් දේශීය වියලි මිරිස් ප්‍රමාණයද 1998 දී මෙට්‍රික් ටොන් 90 ක් වූ අතර 1999 දී එය මෙට්‍රික් ටොන් 299 දක්වා වැඩි විය. සතොස දේශීය නිෂ්පාදකයන්ගෙන් අර්තාපල් මෙට්‍රික් ටොන් 203 ක් මිලදී ගන්නා ලදී. එසේම දේශීය වෙළඳපොළෙන් වී මෙට්‍රික් ටොන් 11,966 ක් මිලදී ගනිමින් දේශීය වී වෙළඳපොළට සැළකිය යුතු අන්දමින් මැදිහත් විය. සතොස දේශීය වශයෙන් මිලදී ගත් සීනි ප්‍රමාණය 1999 දී මෙට්‍රික් ටොන් 1,400 ක් විය.

1996 වසරේදී අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය කිහිපයක බලපත්‍ර අවශ්‍යතාවය ඉවත් කිරීමත්, අවම ගොවිපල මිලක් තහවුරු කිරීමට එහි ඇති වගකීමත් හේතුකොට සතොස මගින් ආනයනය කරන ලද අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය ප්‍රමාණය දිගින් දිගටම පහත වැටුණි. 1999 වසරේදී අර්තාපල් සහ වියලි මිරිස් ආනයන පිළිවෙලින් මෙට්‍රික් ටොන් 772 සහ මෙට්‍රික් ටොන් 97 ක් වූ අතර 1998 වසරේදී මෙය පිළිවෙලින් මෙට්‍රික් ටොන් 2,837 ක් සහ මෙට්‍රික් ටොන් 198 ක් විය. ලොකු ළූණු ආනයනයේ වර්ධනයක් පෙන්නුම් කරමින් 1998 වසරේදී ආනයනය කරන ලද ප්‍රමාණය මෙට්‍රික් ටොන් 5,148 සිට 1999 වසරේ මෙට්‍රික් ටොන් 6,280 දක්වා ඉහළ ගියේය. රජය මගින් විශාල වශයෙන් ස්වාරක්ෂක තොග පවත්වාගෙන යෑමට උපදෙස් දීම නිසා සතොස මගින් සහල් මෙට්‍රික් ටොන් 20,000 ක් ආනයනය කරන ලද අතර සහනදායී සියයට 10 ක බදු අනුපාතයක් යටතේ තවත් මෙට්‍රික් ටොන් 50,000 ක් ආනයනය කරන ලදී. 1999 වසරේදී සතොස මගින් තිරිඟු පිටි ආනයනය සිදු නොකරන ලදී.

1998 වසරට වඩා සිල්ලර වෙළඳසැල් 2 ක වැඩි වීමක් පෙන්නුම් කරමින් 1999 වසරේදී ක්‍රියාත්මක වූ සතොස වෙළඳසැල් සංඛ්‍යාව සිල්ලර වෙළඳසැල් 149 ක් සහ තොග වෙළඳසැල් ගණන 42 ක් විය. මුළු වෙළඳ පිරිවැටුම 1998 වසරේ වාර්තා වූ රුපියල් දශ ලක්ෂ 5,282 සිට රුපියල් දශ ලක්ෂ 6,836 දක්වා වර්ධනය විය. 1999 වසරේද වරලත් අලෙවි නියෝජිත වෙළඳසැල්වල පිරිවැටුමෙහි සිත් ගන්නා සුළු වර්ධනයක් වාර්තා විය. 1998 වසරේ පිරිවැටුම රුපියල් දශ ලක්ෂ 613 හා සැසඳීමේදී මෙම වසරේ පිරිවැටුම වූ රුපියල් දශ ලක්ෂ 1,689 දක්වා වැඩි විය. මෙයට හේතු වූයේ 1998 වසරේ හඳුන්වා දෙනු ලැබූ ජංගම අලෙවි ක්‍රමයේ ප්‍රතිඵලයක් ලෙස වරලත් අලෙවි සැල් වෙත භාණ්ඩ සැපයීම හේතුවෙනි. වරලත් අලෙවි වෙළඳ නියෝජිත ජාලය 1999

වසරේ දේශීය වරලත් අලෙවි නියෝජිත 304 දෙනෙකු හා ජපානය, ඇමෙරිකා එක්සත් ජනපදය, කැනඩාව සහ ප්‍රංශය යන රටවල් හතරෙහිද නියෝජිතයන් පත් කිරීම හේතුවෙන් වඩාත් ව්‍යාප්ත විය.

අභ්‍යන්තර සහ අන්තර්ජාතික වාණිජ කටයුතු සහ ආහාර අමාත්‍යාංශයට අයත් සළුසල, ලංකා ජෙනරල් ට්‍රේඩින් සමාගම වැනි අනෙකුත් අලෙවි කරන ආයතනද අත්‍යාවශ්‍ය පරිභෝගික භාණ්ඩවල තත්ත්වය මිල පිළිබඳ ප්‍රමිතීන් සපයන ආයතනයන් ලෙස කටයුතු කළේය. සාධාරණ තරඟකාරිත්වය තහවුරු කිරීමේ උත්ප්‍රේරක කාර්ය භාරයක් මෙම ආයතන මගින් ඉටු විය. සමූපකාර සංවර්ධන අමාත්‍යාංශය අස්වැන්න නෙලා ගන්නා කාලසීමාවන්වලදී වී මිලදී ගැනීමෙන් හා සමූපකාර සංගම් මගින් සිල්ලර වෙළඳාම සිදු කිරීමෙන් වෙළඳපොළ මැදිහත්කරුවකු වශයෙන් ක්‍රියා කළේය. තීරු බදු අත් හැරීම් සහ තීරු බදු වෙනස් කිරීම් තුළින් මහා භාණ්ඩාගාරයද අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය සැපයුම කෙරෙහි බලපෑමක් ඇති කළේය.

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ සංස්ථාව, රජයේ සෞඛ්‍ය සේවා සපයන ආයතනයන්ට ඖෂධ සපයන එකම සැපයුම්කරු මෙන්ම වෙළඳපොලෙහි ප්‍රධාන සැපයුම් කරුවකු වශයෙන් දිගටම කටයුතු කළේය. සාධාරණ වෙළඳ කොමිසම මගින් නියම කරන ලද මිල ගණන්වලට ඖෂධ වර්ග සැපයීම රාජ්‍ය ඖෂධ සංස්ථාව විසින් කරන ලදී. පෞද්ගලික අංශය මගින් ආනයනය කරන ලද ඖෂධ වර්ගද බලපත්‍ර අවශ්‍යතාව සහ මිල පාලනයට යටත්ව සිදු විය. මෙය ඖෂධ සඳහා පවතින අධික පිරිවැය අඩු කිරීම පිණිස ප්‍රමාණවත් ආරක්ෂක විධිවිධාන යටතේ ඖෂධ නිෂ්පාදන වෙළඳාමෙහි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම පිණිස රජයේ ඒකාධිකාරිය ඉවත් කළයුතු තවත් අංශයක් වේ.

නිදහස් වෙළඳ වාතාවරණයක් තුළ වෙළඳුන්ගේ විධිමත් ක්‍රියා පිළිවෙත් තහවුරු කිරීමේ කාර්යයන්හි අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව හා සාධාරණ වෙළඳ කොමිසම තවදුරටත් යෙදී සිටියහ. පාරිභෝගික අයිතීන් පිළිබඳ පාරිභෝගිකයින්ගේ දැනුවත් බව වැඩි කිරීම, පාරිභෝගික කණ්ඩායම් ඇති කිරීමට උනන්දු කිරීම, පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමට ක්‍රියා මාර්ග ගැනීම, සාධාරණ වෙළඳ පිළිවෙත් ඇති කිරීම අභ්‍යන්තර වෙළෙඳාම විධිමත් කිරීම හා අවශ්‍ය අවස්ථාවලදී මිල පාලනයක් පවත්වාගෙන යාම සඳහා මෙම ආයතන දෙක සැළකිය යුතු ප්‍රයත්නයක් දැරීය.

මිල පාලන පනත, පාරිභෝගික ආරක්ෂණ පනත හා පොහොර ආඥා පනතේ විධිවිධානයන්ට අනුව අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව කටයුතු කළේය. ආනයන කරන ලද බෙහෙත් හා ඖෂධ වර්ග පමණක් 1999 මිල පාලනයන්ට යටත් විය. අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව මිල පාලන පනත යටතේ පරීක්ෂණ කටයුතු 23 ක් මෙහෙයවූ අතර ඉන් 11 ක් වැරදි බව සොයා ගන්නා ලදී. පාරිභෝගික ආරක්ෂණ පනත යටතේ හදිසි වැටලීම් 1,760 ක් මෙහෙයවූ අතර උසාවියේ පැමිණිලි 1,112 ක් ගොනු කරන ලදී. පොහොර පනත යටතේ සිදු කළ පරීක්ෂණ වලින් පොහොර වැරදි අන්දමින් මිශ්‍ර කිරීම, ප්‍රමිතීන්ට අනුකූල නොවන මිශ්‍රණයන් විකිණීම, ගබඩා කිරීම, බෙදා හැරීම හා විකිණීම පිළිබඳ නීති උල්ලංඝණය කිරීම හා අදාළ සිද්ධීන් 119 ක් සොයා ගැනීමට හැකි විය.


සම්මන්ත්‍රණ පැවැත්වීම සහ සිය ප්‍රකාශනයන් තුළින් අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව සිය පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ වැඩපිළිවෙල අඛණ්ඩව සිදු කරන ලදී. මෙම දෙපාර්තමේන්තුව සම්මන්ත්‍රණ හා ප්‍රසිද්ධ රැස්වීම් ආදිය පවත්වමින් 1999 මාර්තු 15 දිනට යෙදී තිබූ ජාත්‍යන්තර පාරිභෝගික දිනය සැමරීය. දෙපාර්තමේන්තුව එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජයීය සංවිධානයේ සහයෝගීතාවය යටතේ ඇති ආසියාතු පැසිපික් කලාපීය අන්තර්ජාතික පාරිභෝගික සංගමයේ ක්‍රියාකාරී කමිටුවේ අඛණ්ඩව කටයුතු කළේය.

සාධාරණ වෙළඳ කොමිසම ඖෂධ වර්ගවල මිල තීරණය කිරීම දිගටම සිදු කළේය. 1999 වසරේදී කොමිසම වංචාකාරී ලෙස මිල නියම කිරීම් දෙකක්, පාරිභෝගික පැමිණිලි කිහිපයක් හා සමාගම් ඒකාබද්ධ වීමක් පිළිබඳව පරීක්ෂණ පවත්වන ලදී.

## 9.14 සංචාරක කර්මාන්තය

1998 සැප්තැම්බර් මස සිට ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වූ සංචාරක කර්මාන්තය 1999 වසර තුළදී තවදුරටත් වර්ධනය විය. ඉක්මණින් යථා තත්ත්වයට පත් වීමට කර්මාන්තය සතු හැකියාව නැවත සනාථ කරමින්, 436,440 ක් වූ සංචාරක පැමිණීම් පසුගිය වසරට වඩා සියයට 15 ක වර්ධනයක් පෙන්නුම් කරමින් මෙතෙක් පැමිණි ඉහළම මට්ටම වාර්තා කළේය. තවද, සංචාරක පැමිණීම්වල වර්ධන අනුපාතය දකුණු ආසියාතික කලාපයෙහි වැඩිම වර්ධන අනුපාතය විය. සංචාරක අංශයේ දළ ඉපැයීම් 1998 එ.ජ.ඩොලර් දශ ලක්ෂ 230 සිට 1999 එ.ජ.ඩොලර් දශ ලක්ෂ 274 දක්වා වර්ධනය විය. වසරේ වැඩි කාලයක් තුළ රටේ ආරක්ෂක තත්ත්වයට බාධා වන අයුරින් සැළකිය යුතු

9.9 රූප සටහන
**සංචාරක සංඛ්‍යාලේඛන**
(1997=100)



කිසිදු සිද්ධියක් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවලින් බාහිරව ඇති නොවීම සංචාරක පැමිණීම් වැඩි වීමට බලපෑ ප්‍රධාන සාධකය විය. රජය හා පෞද්ගලික අංශය විසින් පවත්වාගෙන ගිය ප්‍රචාරණ කටයුතු හා ශ්‍රීලංකන් ගුවන් සේවය හා අනිකුත් ගුවන් සමාගම් මගින් ශ්‍රී ලංකාව හා රටට සංචාරකයන් පැමිණෙන ප්‍රධාන සංචාරක මූලාශ්‍ර අතර ගුවන් ගමන් වාර ගණන වැඩි කිරීමද මෙම සතුටුදායක වර්ධනයට දායක විය. ලෝක ආර්ථික තත්ත්වයේ වර්ධනය, විශේෂයෙන්ම ජපානය ඇතුළුව අග්නිදිග ආසියාතික රටවල් නැවත යථා තත්ත්වයට පත් වීමද රටට සංචාරකයන් පැමිණීමට බලපෑ හේතු අතර විය.

සංචාරක පැමිණීම්වල වර්ධනයත් සමඟ සංචාරක රාත්‍රී ගණන සියයට 13 කින් වර්ධනය වූ අතර සමස්ත කාමර උපයෝජන අනුපාතය සියයට 9 කින් වැඩි විය. සියළුම කලාපයන්ගේ කාමර උපයෝජන අනුපාතයේ ඉහළ යාමක් දක්නට ලැබූ අතර දකුණු වෙරළබඩ, කඳුරට හා පෞරාණික නගරවල කැපී පෙනෙන වැඩි වීම් වාර්තා විය.

සංචාරක පැමිණීම් වලින් සියයට 63 කට දායක වෙමින් බටහිර යුරෝපය මෙරටට සංචාරකයන් පැමිණෙන ප්‍රධාන මූලාශ්‍රය ලෙස පැවතිණි. මෙම කලාපයෙන් පැමිණි සංචාරක සංඛ්‍යාව සියයට 15 ක වර්ධනයක් වාර්තා කළේය. එක්සත් රාජධානිය, ප්‍රංශය, ඉතාලිය හා නෙදර්ලන්තයෙන් පැමිණි ඉහළ සංචාරක සංඛ්‍යාව මෙම වර්ධනයට සැළකිය යුතු ලෙස දායක වූ අතර ඔස්ට්‍රියාව, ඩෙන්මාර්කය, ස්පාඤ්ඤය හා ස්විට්සර්ලන්තය හැර කලාපයේ අනිකුත් සියළුම රට වලින් වැඩි වීම් වාර්තා විය. 1998 දී ඉහළම සංචාරකයින් සංඛ්‍යාවක පැමිණීම වාර්තා කල ජර්මනිය අභිබවමින් එක්සත් රාජධානිය සංචාරකයන් පැමිණීම අතින් ප්‍රමුඛස්ථානය හිමිකර ගත්තාය.

**9.13 සංඛ්‍යා සටහන**
**සංචාරක ව්‍යාපාරය පිළිබඳ**
**සංඛ්‍යා ලේඛන 1997-1999**

| ශීර්ෂය | 1997 | 1998(අ) | 1999(ආ) | ප්‍රතිශත වෙනස 1998 | ප්‍රතිශත වෙනස 1999 |
|---|---|---|---|---|---|
| 1. සංචාරක පැමිණීම් | 366,165 | 381,063 | 436,440 | 4.1 | 14.5 |
| 2. සංචාරක රාත්‍රී ගණන(දහස්) | 3,680 | 3,944 | 4,478 | 7.3 | 13.4 |
| 3. කාමර උපයෝජන අනුපාතය (%) | 49.1 | 52.8 | 57.6 | 7.5 | 9.1 |
| 4. දළ සංචාරක ලැබීම් (රු.දශ ලක්ෂ) | 12,316 | 14,873 | 19,288 | 20.8 | 29.7 |
| 5. ඒකපුද්ගල සංචාරක ලැබීම් (රුපියල්) | 33,635 | 39,030 | 44,194 | 16.0 | 13.2 |
| 6. මුළු සේවා නියුක්තිය | 82,080 | 83,472 | 87,600 | 1.6 | 5.0 |
| සෘජු | 34,200 | 34,780 | 36,500 | 1.7 | 4.9 |
| වක්‍ර | 47,880 | 48,692 | 51,100 | 1.6 | 5.0 |

(අ) සංශෝධිතයි
(ආ) තාවකාලිකයි

මූලයන් : සංචාරක මණ්ඩලය
ශ්‍රී ලංකා මහ බැංකුව

නැගෙනහිර ආසියාවෙන් ඉහළ සංචාරක පැමිණීම් සංඛ්‍යාවක් සහිතව ආසියාවෙන් පැමිණි සංචාරකයන්ගේ ගණන සියයට 15 කින් වර්ධනය විය. නැගෙනහිර ආසියාවෙන් පැමිණි සංචාරකයින්ගේ ගණන සියයට 22 කින් වැඩි වීමට සියයට 18 ක වර්ධනයක් වාර්තා කළ ජපානයෙන් පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව මූලික විය. ඉන්දියාවෙන් පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව හේතුකොටගෙන දකුණු ආසියාවෙන් පැමිණි සංචාරකයින්ගේ ගණන සියයට 10 කින් වර්ධනය විය. ඕස්ට්‍රේලියාවෙන් හා උතුරු ඇමරිකාවෙන් පැමිණි සංචාරකයින්ගේ සංඛ්‍යාව පිළිවෙලින් සියයට 25 කින් හා සියයට 5 කින් වැඩි වූ අතර නැගෙනහිර යුරෝපයෙන් පැමිණි සංචාරක සංඛ්‍යාව එරට පවතින සිවිල් යුද්ධය හේතුකොටගෙන සියයට 14 කින් පහත වැටිණි.

රට තුළ සංචාරකයකු නැවතී සිටින සාමාන්‍ය කාලය 1998 දී දින 10.4 සිට 1999 දී දින 10.3 දක්වා සුළු වශයෙන් පහත වැටිණි. කෙසේ වුවද, සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදම එ. ජ. ඩොලර් 59 සිට එ.ජ. ඩොලර් 61 දක්වා 1999 දී වැඩි වීම, මින් සංචාරක කර්මාන්තයෙන් ලද ආදයමට වන බලපෑම සමනය කිරීමට පමණටත් වඩා ප්‍රමාණවත් විය. රට තුළ සංචාරකයකු නැවති සිටින සාමාන්‍ය කාලය සුළු වශයෙන් පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ සාමාන්‍යයෙන් දිගු කාලයක් ශ්‍රී ලංකාවේ රැඳෙන ජර්මනියෙන් පැමිණෙන සංචාරකයින්ගේ කොටස 1998 සියයට 19 සිට 1999 සියයට 17 දක්වා පහත වැටීමයි. ජර්මනියෙන් පැමිණෙන සංචාරකයන් සාමාන්‍යයෙන් දින 14 ක් රට තුළ රැඳී සිටින අතර ඉන්පසු පිළිවෙලින් නෙදර්ලන්තය (දින 13.5), ඔස්ට්‍රියාව (දින 13), හා එක්සත් රාජධානිය (දින 12) වේ.

මුළු සංචාරක පැමිණීම් වලින් සියයට 70 ක් අන්තර් කලාපීය ගුවන්යානා වලින්ද, සියයට 20 ක් කලාපීය ගුවන්යානා වලින්ද පැමිණි අතර ඉතිරිය කුලී ගුවන්යානා වලින් පැමිණියහ. 1998 වූ සියයට 42 හා සසඳනවිට 1999 මුළු සංචාරක පැමිණීම් වලින් සියයට 47 ක් ශ්‍රී ලංකන් ගුවන් සේවයෙන් පැමිණියහ. 1999 දී විශේෂයෙන්ම සංචාරකයන් වැඩි වශයෙන් රටට පැමිණෙන කාලයේදී අළුතින් ගුවන්යානා 3 ක් ගුවන්යානා සංඛ්‍යාවට එකතු වීම ගුවන් සේවයේ අදල කොටස වැඩි වීමට හේතු විය. කුලී ගුවන්යානා වලින් පැමිණි සංචාරකයින්ගේ කොටස 1998 සියයට 11 සිට 1999 සියයට 10 දක්වා පහත වැටිණි.

මුළු සංචාරක පැමිණීම් වලින් සියයට 93 කට වඩා දායක වෙමින් 1999 දීද නිවාඩු ගත කිරීම් සංචාරක පැමිණීම්වල ප්‍රධාන අරමුණ විය. ඉතිරිය ව්‍යාපාරික කටයුතු, නෑදෑයින් හා මිතුරන් බැහැ දැකීම සඳහා විය. පරිසර හිතකාමී සංචාරක කටයුතු (Eco-tourism) හා සංස්කෘතිකමය සංචාරක කටයුතු (culture tourism) වැනි නව ආකාරයේ සංචාරක කටයුතු වැඩි දියුණු කිරීමට ශ්‍රී ලංකාවට ඇති හැකියාව සනාථ කරමින් වන ජීවී උද්‍යාන, උද්භිද උද්‍යාන, සත්ව උද්‍යාන හා සංස්කෘතික ත්‍රිකෝණය නැරඹීමට පැමිණි සංචාරකයන්ගෙන් ලද ආදායම 1999 දී තවදුරටත් ඉහළ

ගියේය. ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය (Sri Lanka Convention Bureau) 1999 දීද රැස්වීම්, සංචාර, සම්මේලන හා ප්‍රදර්ශන (MICE) සඳහා සංචාරකයින්ගේ පැමිණීම වැඩි දියුණු කිරීමේ කටයුතු අඛණ්ඩව සිදු කළේය. කාර්යාංශය 1999 දී සම්මන්ත්‍රණ හා ප්‍රදර්ශන 7 ක් මෙහෙයවූ අතර මෙම සංචාරක කාණ්ඩය යටතේ 1998 පැමිණි සංචාරක සංඛ්‍යාව වූ 1,925 හා සසඳන කල 1999 දී සංචාරකයන් 9,885 ක් රට තුළට ගෙන ඒමට සමත් විය. රැස්වීම්, සංචාර, සම්මේලන හා ප්‍රදර්ශන සංචාරක පැමිණීම් සඳහා ආසියාවේ ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ජනප්‍රිය කරවීම සඳහා කාර්යාංශය ජාත්‍යන්තර ප්‍රචාරක කටයුතු කිහිපයකට සහභාගී විය.

සංචාරක හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට අනුව සංචාරක අංශය යථා තත්ත්වයට පත් වීමත් සමග සෘජු සේවා නියුක්තිය සියයට 5 කින් 36,500 දක්වා වැඩි වූ අතර, වක්‍ර සේවා නියුක්තිය 48,692 සිට 51,100 දක්වා වැඩි විය. හෝටල් හා ආපනශාලා, සංචාරක ඒජන්සි, ගුවන් සේවා සමාගම්, විනෝදස්වාදය සඳහා පහසුකම් සපයන ඒජන්සි, සංචාරකයන්ට භාණ්ඩ අලෙවි කරන වෙළඳසැල් සහ සංචාරක මණ්ඩලයෙහි සේවා නියුක්තිය සෘජු සේවා නියුක්තිය ලෙස සැලකේ. සංචාරක අංශයට අවශ්‍ය අමු ද්‍රව්‍ය සපයන දේශීය නිෂ්පාදකයන් හා සැපයුම් කරුවන්, අත්කම් භාණ්ඩ නිෂ්පාදකයන් හා සැපයුම් කරුවන් යනාදීන් වක්‍ර සේවා නියුක්තිය ඇති කිරීමට දායක වෙයි.

ප්‍රධාන වශයෙන් කඳුරට හා දකුණු වෙරළබඩ මුහුදු තීරයේ සංචාරක හෝටල් සංඛ්‍යාව වැඩි වීම නිසා ශ්‍රේණිගත නවාතැන් අංශයේ හෝටල් ඒකක සංඛ්‍යාව 163 සිට 170 දක්වා වැඩි විය. හෝටල් ඒකක සංඛ්‍යාව වැඩි වීමත් සමග කාමර ධාරිතාවය 12,772 සිට 12,928 දක්වා වැඩි විය. සංචාරක කර්මාන්තයට අවශ්‍ය ප්‍රමිතීන් ඇති බවට සහතික කිරීමට හා එම ප්‍රමිතීන් පවත්වාගන යාමේ අරමුණ ප්‍රධාන කොටගෙන 1973 සංචාරක හෝටල් නීති සංග්‍රහය වෙනුවට 1999 දී නව සංචාරක හෝටල් නීති සංග්‍රහයක් හඳුන්වා දෙන ලදී. නව නීති සංග්‍රහය අනුව සියළුම සංචාරක හෝටල් ලංකා සංචාරක මණ්ඩලය යටතේ ලියාපදිංචි වීම අනිවාර්යය වේ. කෙසේ වුවද, සංචාරක හෝටල් තරු වර්ගීකරණය (star classification) අනිවාර්ය නොවේ.

සංචාරක හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය 1999 දී සතියක ගුවන් වාර ගණන වැඩි කිරීම සඳහා එක්සත් රාජධානිය, ඉතාලිය, ජර්මනිය, පකිස්ථානය, මලයාසියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, නේපාලය හා රුසියාව සමග ගුවන් ගමන් අයිතීන් සඳහා වූ ද්විපාර්ශ්වික ගිවිසුම් 8 ක් අත්සන් කරන ලදී. 1999 කුලී ගුවන් යානා ක්‍රියාත්මක වීම ඉතා මඳ වශයෙන් සිදු විය. 1998 දී ක්‍රියාත්මක වූ කුලී ගුවන් සේවා සංඛ්‍යාව වූ 9 හා සසඳන කල 1999 දී කුලී ගුවන් සේවා 6 ක් පමණක් ක්‍රියාත්මක විය. ගුවන් ගමන්වල ආරක්ෂාව වැඩි කිරීම සඳහා 1999 දී ශ්‍රී ලංකාවේ ගුවන් ගමන් පාලන ක්‍රමය හා පිළිවෙත් නවීකරණය කරන ලදී. මෙමගින් ජාත්‍යන්තර ගුවන් සේවාවන් ශ්‍රී ලංකාවේ ගුවන් සීමාව හරහා පියාසර කිරීම දිරිමත් වනු අතර එමගින් සංචාරක පැමිණීම් වැඩි වීමෙන් රටට අමතර ආදායමක් උපයා ගැනීමට හැකිවනු ඇත.

සංචාරකයන්ට සිදු වන හිරිහැර නැවැත්වීමට හා පරිසර දූෂණය අවම කිරීමට සංචාරක හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය 1999 අමාත්‍යාංශ කාර්ය සාධන බලකා කමිටුවක් පත් කරන ලදී. රටේ සංචාරක කර්මාන්තය තවදුරටත් දියුණු කිරීම සඳහා ස්වභාව සෞන්දර්යයෙන් යුත් ස්ථාන හඳුනා ගැනීම සඳහාද අමාත්‍යාංශ කමිටුවක් පත් කරන ලදී. රාජ්‍ය මූල්‍ය අංශයෙන් ගත් කල රජය මගින් සංචාරක හෝටල් නවීකරණය හා දියුණු කිරීම සඳහා තීරු බදු වලින් නිදහස් කිරීමේ සහනදායි වැඩපිළිවෙල 1999 ඔක්තෝබර් 31 වනදා සිට 1999 දෙසැම්බර් 31 දක්වා තවත් මාස 2 කින් දීර්ඝ කරන ලදී.

සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා ජාත්‍යන්තර හා කලාපීය සංවිධාන වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි. 1998 දී බංගලදේශ, ඉන්දියා, මියැන්මාර්, ශ්‍රී ලංකා හා තායිලන්ත ආර්ථික සහයෝගිතාවයේදී (BIMS-TEC) සංචාරක කර්මාන්තය සඳහා "පෙරමුණු රට" (lead country) ලෙස ශ්‍රී ලංකාව තෝරා ගන්නා ලදී. ඒ අනුව ශ්‍රී ලංකාව 1999 දී ප්‍රථම විශේෂඥ සමුළුව කොළඹදී පවත්වන ලදී. මෙම කණ්ඩායම මගින් දියුණු කිරීම සඳහා සනිටුහන් කර ගත් අංශ අතර කලාපීය සංචාරක කටයුතු දිරිමත් කිරීම, සංචාරක ප්‍රවර්ධන අවස්ථාවන් පිළිබඳ සොයා බැලීම, සංචාරකයන් සඳහා නව නිෂ්පාදන වැඩි දියුණු කිරීම හා පරිසරය කළමනාකරණය හා සංස්කෘතිය රැක ගැනීම සඳහා නව වැඩපිළිවෙලවල් ඇති කිරීම වේ.

**විශේෂ සටහන 7**

# පරිසර හිතකාමී සංචාරක කටයුතු (Eco - Tourism)

රටක සංවර්ධනයට හා දියුණුවට සංචාරක ව්‍යාපාරය සැලකිය යුතු ලෙස දායක වේ. සංචාරක ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ විදේශ විනිමය උපයන සිව්වන විශාලතම මාර්ගයයි. 1999 වසරේ සංචාරක ව්‍යාපාරයෙන් ලද ලැබීම් රුපියල් දශ ලක්ෂ 18,518 ක් විය. එසේ වුවද, සංචාරක ව්‍යාපාරය දියුණු වන රටවල සංස්කෘතියට, සමාජයට සහ ස්වභාවික පරිසරයට අයහපත් ලෙස බලපාන බවට ඇති චෝදනාව හේතුකොටගෙන සංචාරක ව්‍යාපාරයෙහි සිදු වන අනර්ථයන් පිළිබඳව අඛණ්ඩ විවාදයක් පවතී. එහි ප්‍රතිඵලයක් ලෙස සංචාරක ව්‍යාපාරය අඛණ්ඩ දියුණුවක් ඇති වන ආකාරයට සංවර්ධනය කිරීම පිළිබඳව ලෝකය පුරා දැඩි අවධානයක් ලැබෙමින් පවතී.

පාරිසරික, සංස්කෘතික හා සමාජයීය අංශයන්ට අයහපත් බලපෑමක් නැති සේ සැලකෙන පරිසර හිතකාමී සංචාරක කටයුතු නව සංචාරක මාධ්‍යයකි. පරිසරය සුරකින හා දේශීය ජනතාවගේ සුභසිද්ධිය දියුණු කරන ආකාරයෙන් ස්වභාවික ප්‍රදේශවලට වගකීමකින් යුතුව සංචාරය කිරීම ලෙස පරිසර හිතකාමී සංචාරක කටයුතු නිර්වචනය කරනු ලබයි.[1] පරිසර පද්ධතියේ (eco-system) සාමූහිකත්වයට වෙනසක් සිදු නොවීමට වග බලා ගන්නා අතරම ස්වභාවික සම්පත් සුරැකීම දේශීය ජනතාවගේ ආර්ථික පැවැත්මට උපකාරී වන ආකාරයේ ආර්ථික අවස්ථාවන් බවට පත් කරමින් විවිධ රටවල සංස්කෘතික හා ස්වභාවික ඉතිහාසයට හා ඔවුන්ගේ වටපිටාව අවබෝධ කර ගැනීම සඳහා සංචාරය කිරීම පරිසර හිතකාමී සංචාරක කටයුතුවලට අයත් වේ.[2] ඒ අනුව පරිසර හිතකාමී සංචාරක කටයුතු සංරක්ෂණය සඳහා ආදායම් ලබා දීම මගින් ස්වභාවික හා සංස්කෘතික පරිසරයන් ආරක්ෂා කිරීමට ඉවහල් වන අතරම කර්මාන්තයක් වශයෙන් සංචාරක ව්‍යාපාරය මගින් ආර්ථික වර්ධනය වැඩි දියුණු කිරීමට ඉවහල් වේ.

පරිසරාත්මක සංචාරක කටයුතු ආකාර කිහිපයකින්ම සම්ප්‍රදායික සංචාරක කටයුතු වලින් වෙනස් වේ. මේ අතර මූලික ක්‍රියාකාරකම්, අරමුණු, නවාතැන් ගන්නා ස්ථානවල හා අනිකුත් පහසුකම්වල ස්වභාවයෙහි වෙනස්කම් පවතී. සම්ප්‍රදායික සංචාරක කර්මාන්තයේදී ක්‍රියාකාරකම්, පවතින පහසුකම් මත පදනම් වන අතර, විශ්‍රාමය හා විනෝදය අරමුණු කර ගනී. පරිසර හිතකාමී සංචාරක කටයුතුවල ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ ඇවිදීම, කිමිදීම, වන සතුන් හා කුරුල්ලන් නැරඹීම හා කඳු ගවේශණයයි. නවාතැන් පහසුකම් සැපයීමේදී සම්ප්‍රදායික සංචාරක කර්මාන්තයේදී සුඛෝපභෝගී නවාතැන්/හෝටල් සඳහා ඉහළ මට්ටමක ආයෝජනයක් අවශ්‍ය වන අතර, පරිසර හිතකාමී සංචාරක කටයුතුවලදී නවාතැන් හා හෝටල් සඳහා අඩු ආයෝජනයක් අවශ්‍ය වේ. එසේම එම නවාතැන් සුඛෝපභෝගී වීම අනවශ්‍ය වන අතර ස්වභාවික හා සංස්කෘතික පරිසරය හා සුසංයෝගීව නිර්මාණය කර ගොඩ නංවා ඇත. එපමණක්නොව පරිසර හිතකාමී සංචාරක කටයුතු සඳහා පැමිණෙන සංචාරකයන් සම්ප්‍රදායික සංචාරකයන්ට වඩා වැඩි කාලයක් රටක රැඳී සිටිති.[3]

පරිසර හිතකාමී සංචාරක කටයුතුවල අර්ථවත්බව හා ඵලදායීතාවය සැළකිල්ලට ගනිමින් එක්සත් ජාතීන්ගේ සංවිධානය වසර 2002 ජාත්‍යන්තර පරිසර හිතකාමී සංචාරක කටයුතු වසර වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.[4] පරිසරය සුරක්ෂණය පිළිබඳව ලොව පුරා දැනුවත් බව වැඩි වීමද පරිසර හිතකාමී සංචාරක කටයුතු සැළකිය යුතු හා ක්‍රමයෙන් ඉහළ යන ඉල්ලුමක් සහිත සංචාරක මාධ්‍යයක් බවට පත් කර ඇත.[5]

පරිසර හිතකාමී සංචාරක කටයුතුවල වැදගත්කම සැළකිල්ලට ගනිමින් ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සඳහා වූ ප්‍රධාන සැළසුමෙහි (Tourism Master Plan) රටේ ආගමික සම්ප්‍රදායන්, සංස්කෘතික හා ඓතිහාසික ආකර්ශණයන් හා ස්වභාවික සෞන්දර්ය හා විවිධත්වය පදනම් කරගෙන සංචාරක කටයුතු දියුණු කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කර ඇත. තවද, ප්‍රධාන සැළසුමෙහි විස්තර කර ඇති පරිදි ස්වභාවික, සංස්කෘතික හා සමාජයීය උරුමයන් සංරක්ෂණය හා වැඩි දියුණු කිරීම, සංචාරක කටයුතු සඳහා පොදු ජනතාවගේ සහභාගිත්වය හා සංචාරක කර්මාන්තය සැළසුම් කිරීම හා වැඩි දියුණු කිරීම ඉතා පැහැදිලිව පරිසර හිතකාමී සංචාරක කටයුතුවල මූලධර්ම මත පදනම්ව ඇත.[6] ශ්‍රී ලංකාව මෑතකදී ශ්‍රී ලංකාවේ පරිසර හිතකාමී සංචාරක කටයුතු පිළිබඳ සංවිධානය (ශ්‍රී.ලං.ප.සං.සං.) නමින් සංගමයක්ද පිහිටුවා ඇත. ශ්‍රී.ලං.ප.සං.සං. ලාභ ලබන සංවිධානයක් නොවන අතර ශ්‍රී ලංකාවේ පාරිසරික හිතකාමී සංචාරක කටයුතු දියුණු කිරීම සඳහා පිහිටුවා ඇත.

පරිසර හිතකාමී සංචාරක කටයුතුවල ඉතා වැදගත් මූලිකාංගය වන්නේ ජෛව විවිධත්වයයි (Bio-diversity). ඒ අනුව වෘක්ෂලතා හා සත්ව වර්ගයන්ගේ බහුලත්වය හා විවිධත්වය සහිත ප්‍රදේශ පාරිසරික හිතකාමී සංචාරක කටයුතුවල යෙදෙන සංචාරකයන් ආකර්ෂණය කරන ප්‍රධාන සාධකයක්ව ඇත. අද්විතීය භූගෝලීය ලක්ෂණ හා සංස්කෘතික ඉතිහාසයද මෙම සංචාරක කටයුතුවල


හැකියාවන් ප්‍රයෝජන ගැනීමේලා රටක ශක්තිය වැඩි දියුණු කරන වටිනා සාධක අතර වේ.

මෙම සංචාරක කටයුතුවල ප්‍රධාන ආකර්ශණයන් සේ ගැනෙන දර්ශණීය ස්වභාවික පරිසරයක් හා ඉහළ ජෛව විවිධත්වයත් ශ්‍රී ලංකාව සතුව තිබේ. පැරණි ඓතිහාසික හා සංස්කෘතික ස්ථාන හා ජාතික උද්‍යානවල ඇති වන ජීවීන් පරිසර හිතකාමී සංචාරක කටයුතු සඳහා රටේ සම්පත් පදනම වැඩි දියුණු කරයි. තවද, පසුගිය වසර 12 තුළදී වන ජීවී හා උද්භිද උද්‍යාන නැරඹීමට පැමිණි සංචාරකයන්ගේ ප්‍රතිශතය ඉහළ යාම පරිසර හිතකාමී සංචාරක කටයුතු සඳහා ශ්‍රී ලංකාවේ හැකියාවන් පෙන්නුම් කරයි (1 රූප සටහන).

පරිසර හිතකාමී සංචාරක කටයුතු සඳහා සුදුසු .ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමට නම් යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා අවධානය යොමු කළයුතු අතර ශ්‍රී ලංකාවේ අලෙවිකරණ උපාය මාර්ගයන් නැවත සකස් කළයුතුය. පරිසර හිතකාමී සංචාරක කටයුතු සඳහා යොදා ගන්නා වටිනා සම්පත් ආරක්ෂා සහිතව කළමනාකරණය ශ්‍රී ලංකාවට වැදගත් වේ. එසේ නොවුනහොත් එමගින් සමාජයීය හා ආර්ථික ප්‍රතිලාභයන් හීන වීමට මග පෑදෙන අතරම මෙම සංචාරක කටයුතු රඳා පවතින මෙන්ම එහි සදාකාලික පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය පාරිසරික පද්ධතියට හා සංස්කෘතික දයාදයන්ට තර්ජනයක් වනු ඇත.

1 රූප සටහන

මුළු සංචාරක පැමිණීම් වලින් වනජීවී උද්‍යාන හා උද්භිද උද්‍යාන නැරඹීමට පැමිණි සංචාරකයින්ගේ ප්‍රතිශතය(අ)




(අ) පේරාදෙණියේ රාජකීය උද්භිද උද්‍යානය නැරඹීමට පැමිණි සංචාරකයින් පමණි.

මූලාශ්‍රයන් : ලංකා සංචාරක මණ්ඩලය හා රාජකීය උද්භිද උද්‍යානය, පේරාදෙණිය

---

1 ඇමෙරිකා එක්සත් ජනපදයේ පිහිටා ඇති සංවිධානයක් වන පරිසරහිතකාමී සංචාරක සංගමය (ප.සං.සං.) මගින් දෙනු ලැබූ නිර්වචනයයි.

2 පරිසර පද්ධතිය යනු, එහි ජීවී හා අජීවී කොටස්ද ඇතුළුවූ භූමි දර්ශනයේ ඒකකයකි. පරිසර පද්ධතියේ මෙම කොටස් දෙක අත්‍යවශ්‍යයෙන්ම එකට සම්බන්ධව හා එකට වෙළී පවතී. පරිසර පද්ධතිය යනු පොකුණු හා තණබිම්, වනාන්තර, සුළඟින් රැස්වූ වැලිකඳු, මඩ වගුරු හෝ සමහරවිට ජලජ සතුන් හා පැලෑටි සහිත කුඩා ජලාශයන් විය හැක. විශේෂයෙන්ම එයින් අදහස් වන්නේ සිය භෞතික පරිසරය හා මෙන්ම එකිනෙකා සමග සියළුම ජීවී වස්තූන්ගේ සංකීර්ණ අන්තර් ක්‍රියාවන්ය. මුළු පෘථිවි තලයම එක් පරිසර පද්ධතියක් ලෙස සැලකිය හැක. - *'එන්සෛක්ලොපීඩියා ඇමෙරිකානා'*

3 පරිසර හිතකාමී සංචාරක සංගමයේ 1998 සංඛ්‍යාන තොරතුරු සටහන අනුව, පරිසර හිතිකාමී සංචාරකයකු එක් සංචාරයක් සඳහා එ.ජ.ඩොලර්. 1000-1500 අතර වියදම් කරන අතර සම්ප්‍රදයික සංචාරකයකු එ.ජ.ඩොලර් 700-900 අතර වියදම් කරයි.

4 එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආර්ථික හා සමාජීය සංගමයේ 30 ජුලි 1998 දින හා අංක 1998/40 දරණ යෝජනාව

5 මුළු ජාත්‍යන්තර සංචාරක පැමිණීම් වලින් සියයට 40-60 අතර ප්‍රමාණයක් පරිසර හිතකාමී සංචාරකයන් ගණයට වැටේ. ඉදිරි දශක දෙක තුළදී සංචාරක පැමිණීම් සියයට 4 කින් වර්ධනය වනු ඇති අතර, පරිසර හිතකාමී සංචාරක කටයුතු පදනම් කරගත් සංචාරක පැමිණීම් සියයට 10-25 අතර ප්‍රමාණයකින් වැඩිවෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. - *පරිසර හිතකාමී සංචාරක සංගමයේ 1998 සංඛ්‍යා තොරතුරු සටහන*

6 එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙල/ ලෝක සංචාරක සංවිධානය - ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය සඳහා වූ ප්‍රධාන සැලසුම, පිටු 82, රාජ්‍ය මුද්‍රණ සංස්ථාව, ශ්‍රී ලංකාව